# නූතන යුගයේ චරිත වර්ධනය විවිධ අංශ ඔස්සේ විහිදී පවතිනවා

## කතෝලික පාසල් පද්ධතිය සිසුන්ගේ දෛනික ජීවිතයට එකී චරිත වර්ධනය ගොනු කරන්නට අපමණ වෙහෙසක් ගන්නවා

නූතන යුගයේ චරිත වර්ධනය විවිධ අංශ ඔස්සේ විහිදී පවතින අතර ඒවා දෛනික ජීවිතයට ගොනුකර ගැනීමට අවකාශ ලැබේදැයි විමසූ කල බොහෝ පාසල්වල පිළිතුර "නැතැ"යි යන්නයි. එහෙත් සමහර පාසල් ඒ සඳහා බරපතල වෙහෙසක් දරමින් තමන්ට කළ හැකි සෑම සියලු දෙය කරන්නට වෙර දරන බව බම්බලපිටිය සා. පීතර විදුහල්පති ගරු ට්‍රෙවෝ මාටින් පියතුමා විදුහලේ 83 වැනි වාර්ෂික තෑගි බෙදාදීම් උත්සවයේ වාර්තාව ඉදිරිපත් කරමින් අවධාරණය කළේය.

සා. පීතර විදුහලේ ගරු නික්ලස් පෙරේරා ශ්‍රවණාගාරයේ පැවති මෙවර ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ හිටපු විදුහල්පති, වත්මන් සා. ජෝශප් විදුහල්පති ගරු ට්‍රෙවිස් ගේබ්‍රියෙල් පියතුමන් ය. අධ්‍යාපනයේ නිපුනත්වය සමඟින් සිසු ජීවිත වර්ධනය සඳහා අත දීම කතෝලික දැක්ම බැව් එතුමා පෙන්නා දුන්නේ ය.



සා. පීතර විදුහලේ අදියුරු ගරු ට්‍රෙවෝ මාටින් පියතුමා සා. ජෝශප් විදුහලේ අදියුරු ගරු ට්‍රෙවිස් ගේබ්‍රියෙල් පියතුමන්ව හරසරින් පිළිගෙන කැඳවාගෙන එන අයුරු

# සලාපුර තරුණ රැළියට තරුණ තරුණියෝ 6500 ක්!

ගරු ඉසංක මිහිරාන් පියතුමා

"යෞවනය නැගිටින්න" තේමාව පෙරදැරි කරගෙන හලාවත පදවි තරුණ රැළිය තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථානයේ දී ඉතා සාර්ථක ලෙස පැවැත්විණි.

2014 වසර හලාවත පදවිය නම් කළේ තරුණ තරුණියන් උදෙසාය. ශු. සභාවෙ මඟ පෙන්වීම ආදරය සහ රැකවරණය තරුණ තරුණියන් වෙත ගලා යෑමට සැලැස්වීම එහි මුඛ්‍ය පරමාර්ථය විය. මීසම් මට්ටමින්, දිසා මට්ටමින් සහ අවසානයේ පදවි රැළිය තුළින් ද විවිධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් ඔස්සේ තරුණ වසරේ අරමුණු සාක්ෂාත් කර ගැනුණි.

15 »»»

# දිනපතා ඝාතනය වන කතෝලිකයන් සිහිකොට යදින්න එකතු වන්න

රුසියා ඉස්ලාමීය රාජ්‍යයේ ත්‍රස්තවාදින් අතින් දිනපතා ඝාතනය වන කතෝලික ජනතාව සිහිකොට යදින්නට එකතු වන්න යැයි කතෝලික ගිහි සංවිධාන මේ චතාරික සමයේ ඉල්ලීමක් කර සිටී.

ඉතා ම්ලේච්ඡ අන්දමින් දිනපතාම තම කතෝලික විශ්වාසය නිසා මෙසේ මියැදෙන සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව විදෙස් ප්‍රවෘත්ති අංශ සඳහන් කරයි. මේ වන විට සිරියාවේ ඇසිරියන් කතෝලිකයන් 90 කට අධික පිරිසක් ජිහාඩ් අන්තවාදින්ගේ ග්‍රහණයට හසුව ජීවිතයත් මරණයත් අතර සටනක නියැලී සිටින බව මෙරට මාධ්‍යයද මෑතකදී වාර්තාකර තිබිණි.

**තම කතෝලික විශ්වාසය නිසා ඉස්ලාමීය ත්‍රස්තයන් විසින් මෙම රූමත් තරුණියව ඉතා ම්ලේච්ඡ අන්දමින් හිංසනයට ලක්කර කුරුසියක් මුව තුළ ඔබා ඝාතනය කොට තිබූ අයුරු**





# "පෝර්ට් සිටි" ඉදිකිරීමට එරෙහිව දසතින් මහජන විරෝධතා

යෝජිත "පෝර්ට් සිටි" ඉදිකිරීම මේ වන විට මහජන හා සිවිල් සංවිධාන විරෝධතාවට ලක් වී ඇති අතර තවමත් ඒ පිළිබඳව වත්මන් රජය මුනිවත රැකීම ජනතා ප්‍රශ්න කිරීමට හේතුවී තිබේ. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම මගින් පරිසරයට, ධීවර ජනතාවට, අවට ගම්මානවලට හා පාරම්පරික කතෝලික නිජබිම් වලට ඇතිවන ව්‍යසනය පිළිබඳව කතා කිරීම මීට ඉහතදී සිදුවූවත් බලධාරින්ගේ නිහඬතාවය ජනතා කෝපයට හේතු වී ඇති බව සමාජ ක්‍රියාධරයන්ගේ විශ්වාසයයි. පොදුවේ කතෝලික ධීවරයන්ට හා ප්‍රජාවට ඇතිවන මේ අවහිරතාවයට එරෙහිව සිවිල් සංවිධාන, ධීවර සංවිධාන, කතෝලික සංවිධාන එක්ව සිදුකරන පා ගමනක් මාර්තු 03 වන දා සවස 3.00 ට කොටුව දුම්රිය පොළ අසළින් ආරම්භ වන බව "පෝර්ට් සිටි" නගරය ඉදිකිරීමට එරෙහි ජනතා ව්‍යාපාරය ප්‍රදීපයට දන්වා සිටී.


ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත


**මෙවර ඥානාර්ථ ප්‍රදීපය පිටු 32 කි. කොටස් දෙකකි. කොටස් දෙකම නොවරදවාම ලබා ගන්න.**

ක්‍රි.ව. 2015 ක් වූ මාර්තු 01 ඉරිදා 149 වෙළුම 39 කලබ සතිපතා පත්‍රය - පිටු 32 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015



# "ජුසේ වාස් වසරක්" නම් කිරීමට ශ්‍රී ලාංකේය කතෝලික සභාව සැරසෙයි

## ශ්‍රී ලංකාවේ පළමු සාන්තුවරයාණන් වන සාන්ත ජුසේ වාස් පියතුමන් නමින් ලබන වසර නම් කිරීමට අගරදගුරු පදවිය මූලිකත්වයෙන් සියලු පදවි ඒකමතිකව තීරණයක් ගැනීමේ සූදානමක් ඇති බව ප්‍රදීපයට වාර්තා වේ.

වත්මන් ලෝක කතෝලිකයන්ගේ ආදර්ශය වශයෙන් සාන්ත ජුසේ වාස් මුනි චරිතය මේ ශත වර්ෂය ආරම්භයේ දී පැහැදිලිවම කඩඉමක් ඇති කර ඇති බැව් පසුගිය දා අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් ද වතිකානුවේ දී සඳහන් කරන්නට යෙදිනි.

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් හැටියට සමස්ත රාජගුරු මණ්ඩලයේ අනුමැතිය තුළින් ලබන වසර "ජුසේ වාස් වසර" නමින් නම් කිරීම මූලිකකොට ගෙන ආසියාවට හුරු දෙව්දහම් පැවැත්මක පූජක පැවිදි ජීවිත අල්පේච්ඡතාවය, සරළබව හා කැපවීම, ගිහි මූලිකත්වය සක්‍රීය මීසම් රටා වර්ධනය මෙන්ම කතෝලික අධ්‍යාපනය, සාහිත්‍යය හා කලාව පිළිබඳවද කථිකාවට බඳුන්ව එමගින් ප්‍රායෝගික ක්‍රියා මාර්ග රැසක් ගැනීමට ද ශ්‍රී ලංකා කතෝලික සසුන සූදානම් වන බව ආරංචි මාර්ග පවසන අතරම විශේෂකොට දේශීය කතෝලික ප්‍රජාවගේ ආධ්‍යාත්මික වර්ධනය ක්‍රියාශීලි දායකත්වය හා තිරසාර ආධ්‍යාත්මික පුනර්ජීවනය නැංවීමට මේ වසර බොහෝ සෙයින් ඉලක්ක වන බව ද වැඩිදුරටත් පවසා සිටී.

## ඔරතෝරියාන නිකාය නැවතත් ශ්‍රී ලංකාවට?

ශ්‍රී ලංකාවේ පළමු සාන්තුවරයාණන් වන සා. ජුසේ වාස් මුනිතුමන් මෙන්ම අති පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන් බැඳි ක්‍රියාකාරීව සිටි ඔරතෝරියාන නිකාය නැවතත් ශ්‍රී ලංකාව තුළ සක්‍රීය කිරීමට අවධානය යොමු වී තිබේ.

ලන්දේසි සමයේ දී නැති වී ගිය ශ්‍රී ලංකා කතෝලික සසුන නැවතත් පණ ගන්වා ක්‍රියාශීලි බවට පත්කළ ඔරතෝරියාන නිකාය "ජුසේ වාස් වසර" තුළ දී නැවතත් ආරම්භ වේ නම් එය තවත් කතෝලික ලකුණක් පැහැදිලිවම සනිටුහන් කිරීමක් බව ආසියානු දෙව් දහම් ක්‍රියාධරයන්ගේ මතය වී තිබේ.

## ජාතික ජුසේ වාස් සිද්ධස්ථානය මහගල්ගමුවේ

සා. ජුසේ වාස් සිද්ධස්ථානය කුරුණෑගල පදවියේ මහගල්ගමුව මීසමව ආශ්‍රිතව පිහිටුවීමට මේ වන විට කටයුතු සූදානම් කර ඇත. එයට සමගාමීව සෑම පදවියකම සා. ජුසේ වාස් දේවස්ථාන ඉදිකිරීම ද ඉදිරි වසර තුළ සිදුවන බව ප්‍රදීපයට වාර්තා වේ.

**"මේ මාගේ පුත්‍රයාණෝ ය, එතුමන්ට සවන් දෙන්න." (මාක් 9 : 2-10)**

## පදවියෙන් පදවියට

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

# 125 වසරක් පුරා රැකගත් අචල විශ්වාසය මතු පරපුරට තිළිණ කරමු

## ඇතුගල්පුර රදගුරු හිමි මල්පිටිය 125 ජයන්ති මංගලෝත්සවයේදී ප්‍රකාශ කරයි

**වසර 125 අඛණ්ඩව පවත්වා ගෙන ආ එහි විසූ මුතුන්මිත්තන්ගේ අචල විශ්වාසය ඉදිරි පරම්පරාවට තිළිණ කිරීම වත්මන් සමාජ පරපුරේ වගකීමක් බව කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් මුනි දෙව්මැඳුරේ 125 ජයන්ති මහෝත්සවයේදී පැවසූහ.**

ජයන්ති වසර පුරා විවිධ ආගමික ක්‍රියාකාරකම් තුළින් ජනතාව අධ්‍යාත්මිකත්වය කරා යොමුකරලීමට මල්පිටිය සැදැහැවත් ජනතාවට නායකත්වය ලබාදුන් මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමාගේ නායකත්වය සහ කැපවීම තුළ 125 ජයන්ති මහෝත්සවය ඉතා සාර්ථකව පවත්වන්නට හැකිවිය.

මංගල්‍ය මහා දිව්‍ය යාගය සඳහා කුරුණෑගල පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක ප්‍රනාන්දු, කුරුණෑගල රදගුරු හිමි සහ මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමන් එක්වූ අතර කොළඹ කුරුණෑගල පාරේ කිලෝ මීටර 2 ක් පමණ ශුද්ධ වූ සෙබස්තියන් මුනිතුමාගේ ප්‍රතිමාව රැගත් පෙරහර වීදි සංචාරය කිරීමෙන් පසු ආශිර්වාදය දානය කිරීමෙන් අනතුරුව සහභාගිවූ සැමට ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමාගේ මංගල්‍යය වෙනුවෙන් පිළියෙල කරන ලද දානය පිරිනමන ලදි.

**බී. කේ. ටී. රෙජිනෝල්ඩ් / ඈන් ප්‍රසංගිකා රොඩ්රිගෝ**



## සැබෑ එතෙරවීමකට හංවැල්ල සූදානම් වෙයි

හංවැල්ල මීසම තුළ අළු බදාදා සිට චතාරිකයට සූදානම් වීම සඳහා එම දින හතලිහ පුරාවටම මීසමේ දේවස්ථාන සතරකම දිනකට දිව්‍ය පූජාවක් බැගින් ඔප්පුකරමින් සූදානම් වීමේ කටයුතු පිළියෙල කර ඇත්තේ සැමට සහභාගි වීමට හැකිවන පරිදෙනි.

මෙහි අරමුණ අර්ථවත් වූ පාස්කු මංගල්‍යයකට මීසම් ජනතාව සූදානම් කිරීම බව හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා සහ සහයක ගරු රෝෂාන් චමින්ද යන පියවරු පවසති.

**ඇන්තනි හෙට්ටිආරච්චි**



දියලගොඩ සාන්ත බර්නදෙත් කන්‍යාරාමයේ ශ්‍රේෂ්ඨ මව්තුමිය වූ ගරු මේරි ජුලියට් පැවිදි සොහොයුරිය මීසම වෙනුවෙන් හා දහම් පාසල වෙනුවෙන් ඉතා අගනා මෙහෙවරක් ඉටුකොට, පසුගියදා සමුගත්තාය. එතුමියගේ සමුගැනීම නිමිත්තෙන් උපහාර උලෙළක් පසුගියදා දියලගොඩ සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේදී මීසම් සේවක ගරු දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. සමුගැනීමේ උලළෙන් පසුව, ගරු මේරි ජුලියට් පැවිදි සොහොයුරිය දහම් පාසලේ ගුරුවරුන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# නොසැලී හිඳින කිතුනු දිවිය සදාතන ජීවිතයකට මාර්ගයයි

බොහෝ දුක් වේදනාවන්, බලාපොරොත්තු බිඳවැටීම් හා සිත් තැවුල් අතරේ පරාජය ලැබූ අපගේ ජීවිත වලට සැනසීම ලබාගත හැකි එකම මාර්ගය ආදර දෙවි පියාණන් වහන්සේ තුළ නොසැලී ඉඳිමින්, ගත කරන මේ විශ්වාසී ජීවිතය පමණක්ම බව වැලිමඩ මීසම් සේවක ගරු සුනිල් විජේරත්න පියතුමා පැවැසීය.

උන්වහන්සේ මෙසේ පැවැසුවේ පසුගියදා ලත්පඳුර මහවැලි මාතා සිද්ධස්ථානයේ 'පවුලේ මංගල්‍ය' ලෙස සලකා පවත්වනු ලබන ලූර්දු මාතා දිව්‍ය පූජාවේදී සිය දේශනය පවත්වමිනි. අදින් වර්ෂ නවයකට පෙර ලත්පඳුර මීසම් වාසී කතෝලික ජනතාවගේ අභියෝගාත්මක කිතුනු ජීවිතවලට ආලෝකයක් වෙමින් ඔවුන්ගේ ජීවිත දෙවිපියාණන්ගේ රැකවරණය වෙත ඔසවා තබන්නට තම පූජක ජීවිතය කැප කළ ගරු සුනිල් විජේරත්න පියතුමාගේ සැපැමිණීම මෙදින ලත්පඳුර මීසම් වාසීන්ගේ නෙතු අගට සතුටු කඳුළු ගෙනඑන්නට සමත්විය.

සිය මහ ගෙදර දැක බලාගන්නට නැගම් ආ මේ ගමනේදී උන්වහන්සේ වත්මන් ලත්පඳුර සිද්ධස්ථාන පාලක ගරු සැම් පෙරේරා පියතුමා හා පැමිණ සිටි මීසම් වාසීන් සමග සුහද හමුවක නිරත වූ අතර; දිව්‍ය පූජාව අවසානයේදී සියල්ලන් සමග එක්වී ආහාර වේලක රස බැලීය.

**ෂාමෙන් මේරියන් පෙරේරා**

## අතුරුගිරිය ජනතාවගෙන් ශුද්ධ වු ජුසේවාස් මුනිතුමන්ට හරසර



එදා දහසක් දුක්පීඩා මැද ජීවත් වූ කිතුනුවන් සොයා පැමිණි ශු. ජුසේ වාස් පියතුමන් ගත කළ පරිත්‍යාගිශීලි ජීවිතය නිසා අද ඔබටත් මටත් දේව විශ්වාසය තුළ පවතින්නට වරම් ලැබී තිබෙනවා.

ගරු ප්‍රභාත් පියතුමා (ප්‍ර.නි) මෙසේ ප්‍රකාශ කර සිටියේ, අතුරුගිරිය ශු. පියෝ මුනිතුමන්ගේ සිද්ධස්ථානයේ පැවැති, ශු. ජුසේ වාස් මුනිතුමන් ශුද්ධවරයට එසවූ, පළමු වසර මංගල දිව්‍ය පූජා මහෝත්සවයේදීය.

පෙරදින, ගරු සංජීව පියතුමන්ගේ (දි.ස.නි) ප්‍රධානත්වයෙන් පැවති සන්ධ්‍යා මෙහෙය පෙර කිසිදාටත් වඩා ඉතා උත්කෘෂ්ඨවත් ආකාරයෙන් ගම්වාසින් විසින් පවත්වන්නට යෙදුනු අතර ගීතිකා යැදුම්, මල් වෙඩි වැසි වරුසා මැද්දේ සෙත්සිරිගම ගම වටා ශුද්ධවූ ජුසේවාස් මුනිතුමන්ගේ පිළිරුව රැගෙන ගියේ එතුමන්ගේ ආසිරි නිරතුරු අපේක්ෂා කළ ජනතාවයි. මීසම් සේවක ගරු ඇල්බට් පියතුමාගේ සහ සහායක ගරු ප්‍රැන්සිස් පියතුමාගේ නොමඳ සහයෝගය මෙම මංගල්‍යය මෙසේ අලංකාරව පැවැත්වීම සඳහා ලැබිණි.



රිචඩ් මානමුදලි නාට්‍ය නිර්මාණ 'විමුක්තියේ ජේසු' මෙවර කඳාන සා. සෙබස්තියන් සිද්ධස්ථානයේදි 2015 මාර්තු 30 දින රාත්‍රි 7.00 රංග ගතවේ. එම භාවනාත්මක පාස්කු රංගනයේ මුහුරත් උලෙළ කඳාන දිසානායක සා. සෙබස්තියන් සිද්ධස්ථානයේ පරිපාලක ගරු නිහාල් අයිවන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුවිය. සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන් දල්වා මුහුරත් උලෙළ ආරම්භ කළ අයුරු.

**පියල් ජයකොඩි**

## හදවත් සැත්කමට ආධාර පතයි



මාතලේ, ඉහළගම, පඩිවිට අංක 85 හි පදිංචි එච්. එම්. රංජිත් මහතාට සැත්කමක් සිදු කළයුතු බවට වෛද්‍යවරුන් තීරණය කර ඇත. ඒ සඳහා රු. 464,000.00 ක (හාර ලක්ෂහැට හතර දාහක්) පමණ මුදලක් වියදම් වන බවට ඇස්තමේන්තු කර ඇත. ඉහත සඳහන් මුළු මුදල සොයා ගැනීමට නොහැකි බැවින් ජනාධිපති අරමුදලෙන් ආධාරයක් වශයෙන් රු. 150000.00 ක් ඉල්ලා සිටින අතර ඉතිරි මුදල ආධාරයක් වශයෙන් සොයා ගැනීමට බලාපොරොත්තු වෙයි.

පෝසිලේන් ආයතනයේ සේවය කර දැනට විශ්‍රාම ගොස් කාලයක් ගත වී ඇති අතර දැනට වෙනත් රැකියාවක් ද නොමැති නිසා ඉහත සැත්කම කර ගැනීමට අවශ්‍ය මුළු මුදල සොයා ගැනීමට නොහැකි බැවින් ඔබගේ යම් දායකත්වයක් අපේක්ෂා කරයි. එම නිසා ඉහත සඳහන් කරන ලද ඉතිරි ආධාර මුදල සොයා ගැනීම සඳහා යම් උපකාරයක් කිරීමට හැකියාවක් ඇත්නම් මහජන බැංකුව/ මාතලේ අංක 002-2-001-9-2740205 ගිණුමට බැර කරන්න.

## හලාවත රදගුරු වසමේ නව පූජක පත්වීම්

**මීසම් සේවක පියවරු**

ගරු නෙල්සන් සමන්ත ප්‍රනාන්දු - තලවිල, ගරු නිශාන්ත ජානක පෙරේරා - කෝට්ටපිටිය, ගරු සම්පත් ප්‍රසන්ග පෙරේරා - රාජකදළුව, ගරු කමල් ඩේමියන් පෙරේරා - මාම්පුරි, ගරු ලක්සිරි ප්‍රනාන්දු - කුමාරකට්ටුව, ගරු සුනිල් ශාන්ත - කන්දතොඩුවාව, ගරු පයස් නිහාල් ප්‍රනාන්දු - දුම්මලදෙනිය, ගරු නිරෝෂන් ශ්‍රීකාන්ත - වනාතවිල්ලුව, ගරු ෂෙල්ටන් විජේතුංග - කුඩාමඩුවැල්ල (නව මීසම) ජූනි දක්වා නවාතැන් ගැනීම පොතුවිල්ලුව.

**අපෝස්තලික සේවා හා වෙනත් පත්වීම්**

ගරු තරංග හේමාල් කුමාරපේරු - ධර්මෝපදේශ හා බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ, ගරු සම්පත් උදාන ප්‍රනාන්දු - වෙරෝනා ශ්‍රී ලාංකිකයන්ගේ උපාධ්‍ය/ වැනීසියේ දේවධර්ම නිකේතනයේ උසස් අධ්‍යාපන කටයුතු, ගරු වයිමන් කෲස් පදවි සෙඩෙක් ආයතනයේ අධ්‍යයන කටයුතු, ගරු ප්‍රසාද් චමින්ද ප්‍රනාන්දු - අනුනායක හා විවාහ අධිකරණය/ රදගුරු නිවසේ නවාතැන්, ගරු ක්‍රිස්ටි පෙරේරා - කතානියා ශ්‍රී ලාංකිකයන්ගේ උපාධ්‍ය, ගරු දිනන්ජ සිල්වා - පාදුවා ශ්‍රී ලාංකිකයන්ගේ උපාධ්‍ය/ පාදුවා දේව ධර්ම නිකේතනයේ උසස් අධ්‍යාපනය, ගරු ධනුෂ්ක ප්‍රනාන්දු - නාපෝලි දේවධර්ම නිකේතනයේ උසස් අධ්‍යාපනය, ගරු නිමන්ත ප්‍රදීප් - පැරීසියේ ශ්‍රී ලාංකිකයන්ගේ උපාධ්‍ය/ පැරීසියේ දේවධර්ම නිකේතනයේ උසස් අධ්‍යාපනය, ගරු පීටර් චාල්ස් ප්‍රනාන්දු - නේවාසික තඹරවිල, ගරු පයස් නිහාල් ප්‍රනාන්දු - ශ්‍රම සංක්‍රමික කොමිසමේ අධ්‍යක්ෂ, ගරු මොරිස් ඇන්ඩර්සන් ප්‍රනාන්දු - සංහිඳියාව සජීවක මධ්‍යස්ථානය අධ්‍යක්ෂ, ගරු ඩේවිඩ් විජේතුංග - පූජක පුහුණු අධ්‍යක්ෂ/ නේවාසික දුම්මලදෙනිය, ගරු නිශාන්ත ජානක පෙරේරා - ධර්මදූත ළමා සමාජ සඳහා නව අධ්‍යක්ෂවරයකු පත්වනතුරු ඒ කටයුතු බාරව,

**සහයක පියතුමන්**

ගරු මිලාන් සුසන්ත - කෝට්ටපිටිය, ගරු දිනේෂ් දුමින්ද - වෙන්නප්පුව, ගරු ශෙහාන් පර්ඩිනන් ප්‍රනාන්දු - මාදම්පේ, ගරු ප්‍රභාත් සංජය - සා. අන්තෝනි උසස් අධ්‍යාපන ආයතනය, ගරු දිනේෂ් කීර්ති - කරුවල ගස්වැව, ගරු ශ්‍රීනිත් ප්‍රමිල්ක - හලාවත ආසන දෙව්මැඳුර, ගරු ඩෙනිස් ගයාන් - දෙවන ජුවාම් පාවුළු උසස් අධ්‍යාපන ආයතනය, ගරු සුජාන් නිශ්ශංක - නාත්තන්ඩිය, ගරු දුමින්ද සුරේෂ් - බෝලවත්ත, ගරු ශිරාන් චාමක - උල්හිටියාව, ගරු ඉසංක මිහිරාන් - පරිපාලන ලේකම් රදගුරු මැඳුර, ගරු නලීන් ගීත් - අඟුනවිල, ගරු ප්‍රශාන් ගෝමස් - දෙමළ බස ප්‍රගුණ කිරීමට, ගරු ලලන්ත කෲස් - කටුනේරිය, ගරු ඇන්ටන් ගුරුසිංහ - රාජකදළුව, ගරු නුවන් ඉමල්ක - මංගල එළිය, ගරු මාලන් විජේන්ද්‍ර - පුත්තලම, ගරු රනිල් ඉන්දික - නයිනමඩම, ගරු ජනිත් කෞෂල්‍ය - සා. පාවුළු කනිටු දෙව්සත්හල, ගරු රෝයි දීප්ත ආණමඩුව, ගරු ලසන්ත මංජු - මට්ටකොටුව, ගරු එරන්ද ශාන්ත - කන්ජුක්කුලිය, ගරු මේරියස් චින්තක - මාරවිල, ගරු ලූර් ජයසඳුන් - වනාතවිල්ලුව, ගරු ප්‍රදීප් සේවියර් - භාණ්ඩාගාරික පියතුමාගේ සහයක, ගරු සජිත් නිලාන් - හලාවතවැල්ල, ගරු ලහිරු හේෂාන් - තලවිල, ගරු රොෂෙල් ඒමින් - තල්විල, ගරු ජෝශප් ජේ. ලෝව් - මාම්පූරි, ගරු ප්‍රමේෂ් ස්වර්ණසිරි - කල්පිටිය, ගරු ජීවන් දූෂාන්ත - ගොඩැල්ල/ සඳුදා සිට සිකුරාදා දක්වා සා. ජෝෂප් වාස් විදුහලේ ගුරු සේවය, ගරු ධනුෂ්ක හේෂාන් - කඩයාමොට්ටේ.

**අධ්‍යාපන අපෝස්තලික සේවය**

ගරු දිනේෂ් සෝවිස් - උපදේශනය පිළිබඳ උපාධි අධ්‍යයනය කටුනේරිය නේවාසික, ගරු ඩිලංක නිර්මාන් පෙරේරා - උපදේශනය පිළිබඳ උපාධි අධ්‍යයනය මාරවිල/ සා. පාවුළු දෙව්සත්හලේ නේවාසික, ගරු ජානක නිශාන්ත - ගුරු සේවය නේවාසික සිරිගම්පොල, ගරු විරාජ් එරංග - ගුරු සේවය/ පුත්තලම ජුසේවාස් මධ්‍යස්ථානයේ සජීවක, ගරු පැතුම් නිර්මාල් - විද්‍යාපීඨය බිංගිරිය,

සැ. යු. - ඉහත පූජක පත්වීම් පෙබරවාරි 10 දා සිට බල පැවැත්වේ.

කරුණාකර බඩු ලැයිස්තු සහ අවසාන ගිණුම් වාර්තා අනුනායක හා භාණ්ඩාගාරික පියතුමා ඉදිරියේ පත්වන පියතුමාට බාරදෙන්න.

අවශ්‍යතා අනුව සහයක පියතුමන් මීසම තුළ පිහිටි පාසල්වල ගුරු සේවාවේ ස්වෙච්ඡාවෙන් නියැලෙනු ඇත. බොහෝ ස්ථානවල එය සිදුවෙමින් තිබේ.

කටුනේරිය හා මාරවිල මීසම් සේවක පියතුමන් මාරවිල දිසා රෝහලේ රෝහල් උපාධ්‍ය ලෙස හවුලේ කටයුතු කරනු ලැබේ.

හලාවත මීසම් සේවක පියතුමා හලාවත රෝහලෙන් ලැබෙන ඇමතුම් මත ඒ ගැන සොයා බලනු ලැබේ. එහි උපාධ්‍ය පියතුමකු ගැන සාකච්ඡාකර තිබේ.

**✠ ඩී. වැලන්ස් මෙන්ඩිස්**
හලාවත රදගුරු

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

**ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා**



# අන්නාවි, මුහුප්පු කනක්කපිල්ලෙයි, කෝවිල්පිල්ලෙයි යුගයක් කරා

උබන වසර සා. ජුසේවාස් මුනි පිය සටහන් සොයා යන වසරක් සේ නම් කෙරුමට ශ්‍රී ලාංකේය කතෝලික සභාව ඒකමතිකව උනන්දු වන බවක් පිළිබඳ වාර්තාවක් අද ඥානාර්ථ ප්‍රදීපය මුල් පිටුවෙන්ම වාර්තා කරයි. සා. ජුසේ වාස් මුනිතුමන්ගේ මුල් කාලීන අපෝස්තලික සේවාව මුළුමනින්ම ගිහි ජනතාවගේ ඉදිරිපත් වීමටම විධිමත් අයුරින් ඉලක්ක ගත වූ නිසා ආධ්‍යාත්මය රැකුනු, නායකත්වය ඉස්මතු වුනු, වැදගත්, පිළිගත් ගිහි මූලිකත්වයක් ඇතිව ප්‍රාණවත්, ජ්වලිත මීසම් රටාවක් බිහි කරන්නට ශක්තියක් ලබා තිබුණි.

එහිදි සා. ජුසේ වාස් මුනිතුමන් ගිහි මූලිකත්වයේ ලක්‍ෂණ අතරට භේද බින්න වන අයුරින් ආරෝපිත ක්‍රියාදාමයන් කිසි සේත්ම යොමු කළ බවක් කොතැනකවත් දැකිය නොහැකියි. මේ නිසාම සවිමත් නුවාන කණ්ඩායම් ගොඩනගමින්, යාච්ඤා අභ්‍යාස හා පුණ්‍ය ක්‍රියා සිදුකරමින්, සක්‍රමේන්තු අත්දැකීම් ලබන සැදැහැවතුන් එක්තැන් කිරීම තුළ අනවශ්‍ය ප්‍රශ්න රැගෙන එන අහිතකර පුද්ගලයින් මෙන්ම එවන් කාරණා වලට තුඩු දෙන කරුණුද දුරින්ම දුරස් කර තබන්නට එදා සා. ජුසේ වාස් මුනිතුමන් පත් කළ අන්නවිවරු, මුහුප්පුවරු, කනක්ක පිල්ලෙලා හා කෝවිල් පිල්ලෙලා ශක්තිමත් වු බව ප්‍රත්‍යක්‍ෂ කරුණකි. මෙහිදි සා. ජුසේ වාස් මුනිතුමන් අප මීසම් රටා පවත්වා ගැනීමටත් එකමුතු ගම් බිහිකර ගැනීමටත් දැරූ ශක්තිය සාක්ෂාත් වූයේ ඉහත සඳහන් කරන චරිත තුළිනි. ඒ පත්වීම් ගම්වල පවුල් වැදගත් කරන්නට පවා මූලික වුනි. ඒ ප්‍රබලත්වය තුළ ගමට ආවේණික පැරණි සම්ප්‍රදාය පවා රැකුණා බව අපේ මීසම් අතීතය සිහිපත් කරවයි. සම්ප්‍රදායේ රටාව සුරැකි බව මීසම් අතීතය සිහිපත් කරවයි. භක්ති අභ්‍යාසය සුරක්ෂිත කළ බවත් පිටස්තර උවදුරු මැඩපවත්වා ගන්නට පිටිවහලක් වූ බවත් අප මීසම් වල අතීතය සැබවින්ම සිහිපත් කරවයි.

වර්තමානයේ මීසම් දහම් සේවා සභා ලෙස ගොඩ නැඟි ඇති රටාවේ ඇති දහසකුත් එකක් අඩුලුහුඩුකම් ගැන කථා කිරීමේ ඉවරයක් නොමැත. අන්තනෝමතිකව මීසම් සභා විසුරුවන පියතුමන්ලා ගැන කථා කරන අතරම දඩබ්බරව හැසිරෙන මීසම් දහම් සේවා සභා නියෝජිතයන් ගැනද පැවසෙන කථා වල අඩුවක් නොමැත. 80 දශකය තුළ සවිමත්ව මීසම් දහම් සේවා සභා ගොඩනැඟි තිබුනත් අදවන විට එක තැන පල්වන මීසම් දහම් සේවා සභා රටාවක් පැවතීම නිසා අනවශ්‍ය ලෙස මීසම් තුළ ප්‍රශ්න ඇතිවී තිබේ. ගොඩ නැගෙන සුළු සුළු ප්‍රශ්න විසදා ගැනීමේ ශක්තියද ඔවුන් හීන කර ගෙන තිබේ.

අද මීසම් දහම් සේවා සභා තවත් අනවශ්‍ය කර්තව්‍යයකට අත ගසන්නට යන බවක්ද පෙනේ. අන්තර් ආගමික සහයෝගිතාවයක් හෝ සමයාන්තර සමගියක් ගැන කථා කරන්නට මීසම් දහම් සේවා සභා මූලිකත්වය ගත යුතු නැත. සෞම්‍ය ලෙස ගොඩ නැගෙන මීසම් රටාවලට මේ අනවශ්‍ය කොටස් ඈඳා ගැනීම මීසම් සම්ප්‍රදාය විකෘති කිරීමකි. සමයාන්තර සමගිය වැනි අනෙකුත් ලබ්ධිකයින් කථා නොකරන පැතිකඩකට මීසම් දහම් සේවා සභා තුළින් අනවශ්‍ය මූලිකත්වයක් ලබාදීම නැති ප්‍රශ්න ඇතිකර ගැනීමකි. පෙර කල මිශ්‍ර විවාහ ඇතිවී තිබුන හොත් ඒ පවුල සක්‍රිය වශයෙන් ගෙන ප්‍රතිමාවක් ලබාදෙමින් ගමට සහෝදරත්වයෙන් බඳවා ගන්නට මුහුප්පු රාලට, අන්නවි රාලට නායකත්වයේ ශක්තියක් තිබුණි. සමයාන්තර සමගියක් කථා කරන දහම් සේවා සභා රටාවක් නොනිසි ආකාරයෙන් මීසම්වල ගොඩනැගුනොත් මූලධර්මවාදි ව්‍යුහයන් තුළ අපේ මීසම් රටාවන් අපිම අහිමි කර ගනු ඇත.

අනෙක් අතට අත්තනෝමතිකව කටයුතු කරන සමහර පියතුමන්ලා විෂයයෙහි මුලින්ම විකෘති වන තත්ත්වයට අද පත්වී ඇත්තේත් මීසම් ධර්ම සේවා සභායි. නමුත් අන්නවි, මුහුප්පු වැනි තානාන්තර තුළින් සමහර පියතුමන්ලාව පවා නම්‍යශීලි තත්ත්වයකට පත්කර ගැනීමට පෙර කල හැකිවූවා නම් අදටත් එය වලංගු නොවන්නේද?

සා. ජුසේ වාස් මුනි වසරක්

## හෘද සාක්ෂියට ඉඩදීම




ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

නම් කිරීම තුළ අල්පේච්ඡ, සරල, නිරහංකාර සභා රටාවක් මෙන්ම ඈත් නොකරන මීසම් සංඝයක් ඇතිකර ගැනීමට මේ අතීත සලකුණු සොයා ගොස් නැවත ඒවා ඉස්මතු කර ගැනීම බෙහෙවින්ම හේතුකාරක වන බව උදක්ම සිහිපත් කර සිටිමු. එතුළින් ශක්තිමත් පදවි රටාවන්ද බිහිකර කුඩා කිතුනු සංඝ තුළින් හා කුඩා මීසම් රටා තුළින් ගිහි පූජක දෙපිරිසම එකිනෙකාට ආදරය කරන වාතාවරණයක් බිහිකර ගන්නේ නම් සා. ජුසේ වාස් මුනි වසර ශ්‍රී ලාංකේය කතෝලික සභාව තුළ සැබෑ ලෙසින්ම අනාගත ලකුණක් දිස්කර ගත හැකි සංධිස්ථානයක් වනු ඇත.

# යහපාලනයෙ උරුමක්කරුවෝ!

**(වෙන්නප්පුව දිසාවෙ පියතුමන්ලා සමග කරන ලද සාකච්ඡාවෙදි ඉදිරිපත් කළ අදහස්)**

**උදාර තේමාවන් ඉදිරිපත් කරමින් බලයට පත්වන ආණ්ඩු, ජයග්‍රහණයෙ 'මධුසමය' පසුකර කාලයක් යන විට එම උදාර අපේක්‍ෂාවන් බිඳ දමමින් ජනතාව ගෙන් දුරස්වෙමින් බලයෙන් දූෂණය වන අන්දම අප අත්දැක ඇත. යහපාලනය වෙනුවට අවපාලනය රජකරවමින් ජනතාව පීඩනයට ලක්කරන මෙම දේශපාලන යථාර්ථය වෙනස් කළ හැකිද? එසේනම් කෙසේද? පුරාණ ගිවිසුම් යුගයේදී පවා මෙම යථාර්ථය ජනතාව අත්දැක ඇත.**

එවකට පිළිගැනීම වූයේ දෙවිඳුන්ගෙ ස්වාමිත්වය ඉශ්‍රායෙල් රජුගෙන් ප්‍රකාශ වන වගය. (2 සාමුවෙල් 7:12-16) 2 සාමුවෙල් 7:14. 'මම ඔහුට පියෙක් වන්නෙමි, ඔහු මගේ පුත්‍රයා වන්නේය.' මේ අනුව ඊශ්‍රායෙලය රජු 'දෙවි පුත්‍රයෙකු' ලෙස සළකන ලදි. මෙම රජුගෙන් දිළිඳුන්ට යුක්තියද, අනාථයන්ට රැකවරණයද, වැන්දඹුවන්ට අයිතිවාසිකම්ද තහවුරු කරමින්, අසාධාරණත්වයෙන් ලොව මුදවා ගැනීම අපේක්‍ෂා කරන ලදි. නමුත් කෙටි කාලයක් ගතවූ පසු රජු ජනතාව පීඩාවට පත්කරන්නට වූයේ තමන්ගෙ බලය දූෂණය කරමින්ය. ඊශ්‍රායෙල් ජනතාව රජුන්ව අතහැර යන්නට වූහ. (1රාජාවලිය 12:16). අමුගසට මෙසේ වන කල, එනම් 'දේව පුත්‍රයන්' යයි හඳුන්වන බලවතුන් මෙසේ පිරිහෙනවානම්, අපේ බලවතුන් ගැන මොන කතාද? 'බලය දූෂණය කරයි, පරම බලය, බලය දූෂණය කරනවාය' යන්න මෙයින් සනාථ නොවේද? යහපාලනය අවපාලනය බවට පත්වීමට බොහෝදුරට ඉඩ ඇති නිසා අපි අවදියෙන් සිටිය යුත්තෙමු.

### ආධ්‍යාත්මික ප්‍රතිපදාව

යහපාලනය හඳුන්වාදීමේදී ඒ සඳහා වු අන්තර් ක්‍රියාකාරිත්වයක යෙදිය යුතු සංඝටක තුනක් ගැන කියැවේ. එනම් සිවිල් සමාජය, රජය සහ පෞද්ගලික අංශයන්ය. මේවායෙ යහසාධක අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇතිවීමෙන් යහපාලනයෙ තිරසාර බව පවත්වා ගත හැකි බව කියැවේ. මෙම සංකල්පය අනාගමික සමාජයට ගැළපෙනවා ඇත. නමුත් අපේ රට තුළ පවතින්නෙ ආගමික සමාජයක් නිසා, ආගමේ ක්‍රියාකාරිත්වයද මෙයට එකතුවිය යුතු අනිවාර්ය අංගයකි.

මෙහිදී වැදගත් වනුයේ ආගම්වලින් පොළොඹවනු ලබන ආධ්‍යාත්මික ප්‍රතිපදාවයි. ආගමික ආයතන යහපාලනයට දායක විය යුත්තේ යහපාලනය සඳහා මෙම අංශ තුනේම ආධ්‍යාත්මික ප්‍රතිපදාව ප්‍රගුණ කිරිමටය. කිතුනු අපට මහඟු සම්ප්‍රදායක් පුරාණ ගිවිසුමේ සිට දිවැසිවරු ගොඩ නගා ඇත. දෙවිඳුන්ගෙ හඬ නගන ආමොස් දිවැසිවරයා අපට පෙන්වා දෙන්නෙ, සහෝදරත්වයෙන් සහ දයාවෙන් තොර දේව වන්දනාව දෙවිඳුන්ට පිළිකුල් වන බවය. 'යුක්තිය ගලාබසින දිය දහරක් මෙන්ද, ධර්මිෂ්ඨකම නොසිඳ ගලන ගඟක් මෙන් පැවැතිය යුතුබවත්, එයින් තොරව කරනු ලබන පුද පූජා ස්වාමින් වහන්සේ පිළිකුල් කරන බවත්ය. (ආමොස් 5:21-24) යෙසායා දිවැසිවරයා අවධාරණය කරන්නෙ යහපත කරන්නට ඉගෙන ගන්න. පීඩා විඳින්නන්ට පිහිට වන්න. මෙසේ යුක්තිය ඉටුකරන්න කියාය.

මේ සියල්ලෙන් ගම්‍ය වනුයේ යුක්තිය ඉටුකරන යහපාලනය දෙවිඳුන්ට ප්‍රසන්න ප්‍රශස්ථ දේව වන්දනාවක් බව නොවේද? නව ගිවිසුමේ ශුද්ධවු මතෙව් 25:31-44 අවධාරණය කරන්නෙ සාගින්නෙන් පෙළෙන, පිපාසයෙන් පෙළෙන, ජනතාව සමග ජේසු තුමා අනන්‍ය වන බවත්, මෙලෙස කොන්කරන ලද 'ඉතාම සුළු තැනැත්තන්ට' කරනු ලබන සහෝදරත්වයෙ සහ දයාවේ ක්‍රියාවන් ජේසු තුමන්ට කරනු ලබන්නක් බවය. එනම් මෙවැනි ජනතාව පිළි ගනිමින් ඔවුන්ගෙ යහපැවැත්මට කරනු ලබන දේශපාලනික ක්‍රියාකාරිත්වයන් සැබැවින්ම යහපාලනයෙ ප්‍රකාශයක් බව පිළිගත යුතුය.

### කොතැන සිටද?

අපේ සමාජ දේශපාලන යථාර්ථය තුළ යහපාලනයෙ භාවිතාව දෙස බැලිය යුත්තෙ කොතැන සිටද? අවපාලනයෙන් වඩාත්ම පීඩාවිඳින්නන්ට, යහපාලනයෙ ආස්වාදය අත්විඳින්නට ලැබෙන විට, යහපාලනය තුළින් ඇතිවන යහපැවැත්ම අත්විඳින්නට නම් අප සිටිය යුත්තේ ප්‍රධාන සමාජ දේශපාලන ධාරාවන්ගෙන් කොන්කරන ලද, මෙම බැහැරකරන ලද ජනතාව සමගය. ඔවුන් සමග සිටිමින් යහපාලනයට අප දායක විය යුතුය. එහි සිටිමින් අපි අපේ දිවැසි මෙහෙවර ඉටුකළ යුතුය. යහපත ප්‍රකාශ කරමින්, අයහපත හෙලාදැකීමට අපි අවදියෙන් සිටිය යුත්තෙමු.

අපි අපේ සැප පහසු කලාපවලින් ඉවත්වී මෙම ආන්තික ජනතාව සමග 'මාංශගත' වීමෙන් සැබෑ ජේසු අනුගාමිකයන් විය හැක. ජනතාවගෙ සේවකයන් බවට පත්වීමට තරම් අප බැහැපත් විය යුතුය. (මාක් 10:45) 'මනුෂ්‍ය පුත්‍රයාණන් වුවද වැඩියේ, සේවය ලැබීමට නොව සේවය කිරීමටය. බොහොදෙනාගෙ මිදීම උදෙසාය.' බලයට පත්වන අය, ආධිපත්‍ය පතුරුවන විට අප ජනතාව සමග සිටිමින් ආධිපත්‍යයට එරෙහිව නැගී සිටිය යුතුය. ආන්තික ජනතාව සමග අප සිටින විට දෙවිඳුන්ද අප සමගය. එවිට බලවතුන්ගෙ බලයට වඩා බලරහිත වූවන්ගෙ බලය වඩා ප්‍රබල බව ප්‍රකාශ කළ හැක. මරිය තුමියගෙ උදාන ගීයෙන් පසක් කරනුයේ, 'සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩගු සිත් ඇත්තන් විසුරුවා හැර..... දීනයන් ඉහළ නංවා උසස් කළසේක' යන්නය. (ශු. ලූක් 1:51-53) ආන්තිකයන් සමග අනන්‍යවීමෙන් අපටද මෙම දෙවි ක්‍රියාකාරිත්වයට පංගුකාරයන් වෙමින් මරියතුමිය සමග උදාන ගීයට එකතුවිය හැක.

### දේව රාජ්‍යය සහ යහපාලනය

දේව රාජ්‍යය ජේසු තුමන් විසින් ප්‍රකාශ කරන ලද බලාපොරොත්තුවෙ සහ ආනන්දයෙ සුපුවතයි. මෙය භෞමික බල ප්‍රදේශයක් නොවන අතර දැනටත් ලෝකය තුළ අසාධාරණය පහකරමින් සාධාරණයද, වෛරය පහකරමින් ආදරයද, ආධිපත්‍යය පහකරමින් සේවයද ගෙන දෙන දේව බලය සහ අධිකාරිත්වයයි. දේව රාජ්‍යයේ විශේෂ ලක්‍ෂණ තුනකි. එය විශ්වනීයයි, සියල්ල වැළඳගනී.

ආර්ථිකය, දේශපාලනය, සෞඛ්‍යය, සදාචාරය, සංස්කෘතිය යන සියල්ලම දේව රාජ්‍යයට අයත්ය. එනිසා මේ සියල්ලම බලාපොරොත්තුවෙන් සහ ආනන්දයෙන් ආශිර්වාදය කරනු ලැබේ. එමගින් සියල්ල නවතාවයකට පත්කරනු ලැබේ. එමෙන්ම දේව රාජ්‍යය ව්‍යුහයමය ස්වභාවයක් ගනී. සමාජ දේශපාලන ආර්ථික, අධ්‍යාපන වැනි ව්‍යුහයන්ද දේව රාජ්‍යයට අදාල වන්නේ එම ව්‍යුහයන්ද වඩා යහපත් ලෙස පරිවර්තනය කෙරෙන නිසාය. මේවායෙ මූලික වෙනසක් ඇතිකරමින්. පීඩාකාරි ව්‍යුහයන් නිදහස, සාධාරණත්වය ලබාදෙන ව්‍යුහයන් බවට පත්කෙරේ. දේව රාජ්‍යයේ තවත් වැදගත් ලක්‍ෂණයක් වනුයේ දේවරාජ්‍යය උදාව නියත සංසිද්ධියක් වීමය.

මේ අනුව සාධාරණත්වය, සාමය සහ සුසංගමයක් අත්විඳින නව අහසක් සහ පොලොවක් අපේ මේ රට තුළ සහ ලෝකය තුළ ගොඩනැගෙනවාය යන්න ස්ථිරයි. මෙහිදි අපේ වගකීම සහ භූමිකාව කුමක් විය යුතුද? 'ඔබේ රාජ්‍යය පැමිණේවා' කියා අප කොතරම් වාරයක් වදාරා ඇත්ද? වැදැරීමෙන් පමනක් ඔබේ රාජ්‍යය හෙවත් දේව රාජ්‍යය පැමිණෙත්ද? සාන්ත අගුස්තීනු තුමා මෙසේ පැහැදිලි කරදෙයි.

'ඔබගෙ රාජ්‍යය පැමිණේවා' කියා යදින විට අප දෙවිඳුන්ගෙන් ඉල්ලා සිටින්නෙ නිවැරැදි පිළිවෙතකට ජීවත්වීමට අවශ්‍ය දේව වරප්‍රසාදයයි. නිවැරැදි ජීවිත පිළිවෙත වනුයේ සාධාරණත්වය, නිදහස, සහෝදරත්වය සහ සමානාත්මතාවය යන දේව රාජ්‍ය වටිනාකම් අප ජීවත්වන රට තුළ යථාර්ථයක් බවට පත්කිරීමයි. එනම් සමාජ, ආර්ථික, දේශපාලනික යථාර්ථයන් තුළ මෙම දේවරාජ්‍යය වටිනාකම් රජකරවීමයි.

මෙම ආර්ය මාර්ගයෙ ජීවත්වන විට අපට යම් යම් වාසිදායක තත්ත්වයන් ත්‍යාජ කිරිමටද සිදුවේ. සාන්ත ජෙරුසලමේ සිරිල් මුනිතුමා කියන්නෙ, ක්‍රියාකාරකම් වලදි, සිතිවිලිවලදි පිරිසිදුව සිටිමින් යමෙකුට පවතින්නට පුළුවන්නම් ඔහුට හෝ ඇයට 'ඔබගෙ රාජ්‍යය පැමිණේවා' යනුවෙන් යැදිය හැකි බවය. එය සත්‍යවාදි යැදුමක් වනවා නියතයි. එලෙස පැවැත්මෙන් යහපාලනයට දායක විය හැකිවනු ඇත. දේවරාජ්‍යය දෙවිඳුන්ගෙන් ලැබෙන ඇරැයුමකි. දෙවියන් වහන්සේ ආදරය වන නිසා (1 ජුවාම් 4:8) අප මෙම දේව තෑග්ගට විවෘත විය යුතුය. 'නියමිත මොහොත පරිපූර්ණවී තිබේ; දෙවියන් වහන්සේගෙ රාජ්‍යය ආසන්නය; මනස්තාපවන්න; සුබ අස්න අදහාගන්න (මාක් 1:15).

**(මේ ඇසුරෙන් ලිපි පෙළක් ඉදිරිපත් කෙරේ)**

**වි. ලෙ. පීරිස්**



අපේ මීසමේ වගතුග

# මීසමෙන් මීසමට

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

# ජපමාලය තුළින් දෙව් මව් පසසමු

## කළුතර ලූර්දු මාතා උලෙළේදී සහයක රදගුරු හිමි පවසයි

**ලෝවැසි කිතුනු ජනතාවගේ භක්ති ගෞරවාදරයට පාත්‍රවී සිටින කුමරි මරියාවෝ අප වෙනුවෙන් දෙවිඳුන් හමුවේ මැදහත් වන එකම භාග්‍යවන්තියයි. එතුමිය අපගේ සෑම කරදර දුක්වේදනාවක්ම නිවාදැමීමට පිහිට වන බව අපි තරයේ විශ්වාස කරමු. එතුමියගේ පිහිට යදිමින් නිරතුරුවම ජපමාලය උච්චාරණය කිරීමෙන් අපට කළ හැකි උතුම්ම ගෞරවය එතුමියට පුදකරමු යැයි අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ පැවසූහ.**

එතුමා එසේ පැවසුවේ, කළුතර දිසා ලූර්දු දේවමාතාවන්ගේ 106 වන වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදීය. මංගල දිව්‍ය පූජා යාගය මොරටුව සාන්ත සෙබස්තියන් විදුහලේ අදියුරු, ගරු බොනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි. කළුතර මීසම් සේවක, ගරු සුරාන් අත්තිඩිය පියතුමා ඇතුළු මීසම් ධර්මසේවා සභාව, කළුතර දිසානායක ගරු ලෝරන්ස් රාමනායක පියතුමා ඇතුළු දිසාවේ පියවරුන්ගේ සංවිධානයෙන් මෙම මංගල උලෙළ උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



## සහයක පිය සමුදීමක් සහ පිළිගැනීමක්

කංජුක්කුලිය සහයක පියතුමා ලෙස සේවය කළ ගරු දිනේෂ් දුමින්ද පියතුමා ඉකුත් ඉරු දින උදේ දේව මෙහෙයෙන් අනතුරුව සියලු සැදැහැවතුන්ගෙන් සමුගත්තේය.

මීසම් සේවක ගරු ජූඩ් ඩයස් පියතුමා පැවිදි සොහොයුරියන් හා සැදැහැවත්හු ගරු පියතුමාව වෙන්නප්පුව දෙව්මැඳුර වෙත රැගෙන ගියහ. නව සහයක ගරු එරංග ශාන්ත පියතුමා පිළිගැනීමද සිදුවිය.

**අනුර ශාන්ත පීරිස්**

## මට්ටක්කුලිය දයාවේ කමිටුව මීසමේ දිළිඳුන් උදෙසා ඇපකැපවේ

**මට්ටක්කුලිය සාන්ත මරියා දෙව්මැඳුරේ 150 ජයන්තියට සූදානම් වන සමයේ මීසම් සේවක ගරු කැලිස්ටස් ප්‍රනාන්දු පියතුමාගේ මඟපෙන්වීම යටතේ දයාවේ කමිටුවක් ආරම්භ කැරිණ.**

මීසමේ දිළිඳු පවුල් සොයා ගොස් නිවෙස් පිළිසකර කරදීම, අවශ්‍යතා මත ජල විදුලි පහසුකම් ලබාදීම, ශාරීරික හා මානසික අපහසුතාවලදී ඒවා සපුරාලීමට දායක වීම. වාර්ෂික මංගල්ලයට සමගාමීව වැඩිහිටියන් හා රෝගීන් උදෙසා දිව්‍ය පූජා සංවිධානය කර ඊට අමතරව ආහාරපාන හා තිළිණ ලබාදීමද, පාසල් යන දිළිඳු දරුවන් 300 කට නිළ ඇඳුම්, පොත්පත් හා පාසල් උපකරණ ලබාදීමටද දයාවේ කමිටුව පියවර ගෙන ඇත.

මේ කටයුතු සඳහා මීසම් වාසීන් කැටවලට මුදල් ඉතිරි කර පිරිනැමීම. විශේෂ පරිත්‍යාග, මසකට වරක් දෙව්මැඳුරේ ඉරුදින දිව්‍ය යාගයේ දෙවන සම්මාදමකට දායක වීමට පියවරගෙන ඇත. වාර්ෂිකව වාහන සේදීමේ වැඩසටහනක් පවත්වා ආධාර ලබාගනී. හිටපු මීසම් සේවක ගරු ඇන්ටන් ජයනන්ද හා වත්මන් මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් මදුරාවල පියතුමන්ගේ නොමඳ සහය මීට ලැබේ.

**ලලිතා පෙරේරා**



බෝලවලාන වැඩිහිටි සමිතියේ සාමාජිකයින් පිරිසක් තම්මිට ශා. ජෝශප් වැඩිහිටි නිවාසයේ නේවාසිකයින්ට ගීත ගායනා ඉදිරිපත් කර තේ පැන් සංග්‍රහයක් පවත්වා සියලු නේවාසිකයින්ට තෑගි ප්‍රදානය කරන ලදී.

**ඡායා - ජේ. එම්. ටි. ප්‍රනාන්දු**

## ආදරය, ප්‍රේමය, දයාව, සෙනෙහස ක්‍රියාවෙන් රකින්න

ආදරය, ප්‍රේමය, දයාර්දය, සෙනෙහස, කම්පනය ආදී වදන් නාම පදවලට පමණක් සීමා නොකර එහි අර්ථකථනය සැබෑ යථාර්ථයක් වන්නට නම් එම උත්තරීතර වදන් ක්‍රියා පද ලෙස භාවිතයෙන් ජීවමාන කර ගෙන සියලු සත්වග සමග හැසිරිය යුතු බව ගරු ශමින්ද්‍ර ජයවර්ධන සා.බෙ.නි පියතුමා පැවසීය.

නායකකන්ද ශුද්ධ වූ කානික්ක දේව මාතා දෙව්මැඳුරේ 153 වැනි වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදී එතුමා එසේ පැවසීය. මංගල දිව්‍ය පූජාව ගරු ශ්‍රී ලාල්පොන්සේකා, ගරු අයිවන් පීටර්ස්, ගරු රොමේෂ් රොවෙල් යන ග්‍රාමයේ පූජක තුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

මංගල කටයුතු මීසම් සේවක ගරු රන්ජන් සිල්වා සහයක ගරු චානක වැලිකඩ ආරච්චි පියතුමන්ගේ මූලිකත්වය ඇතිව දේවස්ථානයට අනුබද්ධ සමිති සංගම් එක්ව මෙහෙයවූහ.

**ඒ. ඩී. සුනිල්**



ජාතික ගිහි කොමිසමේ වසරේ ප්‍රථම රැස්වීම එහි සභාපති අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් අතිඋතුම් ක්ලිටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන් හා අතිඋතුම් ජෝසප් පොන්නයියා හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් බැල්කම් පෙදෙසේ රදගුරු සමුලු ශාලාවේදී පැවැත්විණ. මේ එහි අවස්ථාවකි.

**තියබෝල්ඩ් සමරතුංග**

## 92 වන සංවත්සරය සහ වාර්ෂික මංගල්‍යය

**වත්තල ගල්වැටියේ ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ එක්සත් සහෝදර සමිතියේ 92 වන සංවත්සරය සහ වාර්ෂික මංගල්‍යය පසුගියදා උත්සවාකාරයෙන් පවත්වන ලදි.**

සූදානම් වීමේ ප්‍රශංසාවේ සුව මෙහෙය මීසම් පුත්‍ර ගරු ජූඩ් අල්ගම පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද, සන්ධ්‍යා මෙහෙය තුඩැල්ල ක්‍රිස්තු රාජ විදුහලේ විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගෝ පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද, මංගල්‍යය මහා දිව්‍ය යාගය නායකකන්ද මීසම් සේවක ගරු රංජන් සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද පවත්වන ලදි. වත්තල සහයක ගරු මාලින් සමුද්‍රිත පියතුමාගේ මගපෙන්වීම යටතේ සංගමයේ සභාපති සුකුමාල් ප්‍රනාන්දු මහතා ප්‍රමුඛ විධායක කමිටුව විසින් මංගල්‍යය කටයුතු සංවිධානය කරනු ලැබීය.

**ක්ලැරන්ස් ලෙනාඩ්**

## උතුරු බණ්ඩිරිප්පුව එක්සත් වැඩිහිටි සමිතියේ තෙවන සංවත්සර උලෙළේදී පත්වූ නව නිළධාරි මණ්ඩලය මෙසේය.

සභාපති - මිල්ටන් ජෝශප් ප්‍රනාන්දු, ලේකම් - පී. ඒ. රේමන් ජෙරාඩ්, උප සභාපති - ඩබ්. ඒ. ඩී. බොතේජු, උප ලේකම් - ඇම්. ඒ. මේරි මාග්‍රෙට් පෙරේරා, භාණ්ඩාගාරික - ආර්. ඇම්. සිරිල් අප්පුහාමි, කාරක සභිකයන් - බර්නාඩ් රන්දෙනි, ස්ටැනිස් ඇලෝසියුස්, වින්සන් චන්ද්‍රසේකර, සුසිලා බොතේජු, අරුන ශාන්ති.

**ශු. කානික්ක දේවමාතා මංගල්‍ය නිමිති කොට ගෙන පිටිපන දේවස්ථානයේ පැවති රෝගීන්ගේ දිව්‍ය යාගය මරිය හමුදාව මගින් සංවිධානය කළ අතර ඒ සඳහා උරදුන් මීසම් සේවක ගරු එල්මෝරාජ් පියතුමාටද දිව්‍ය පූජා යාගය අරුත්බරව සිදුකළ මීසම් සහයක ගරු ජූඩ් ලක්ෂාන් පියතුමාටද ගරු පැවිදි සොයුරියන්ටද ගායනයෙන් හා වාදනයෙන් සහය වු චතුර සොයුරාටද රෝගීන් රැගෙන ඒමට සහයවු ත්‍රිවිල් රියදුරන්ටද දැඩි වෙහෙසක් දරා මෙය සංවිධානය කළ මරිය හමුදා දෙටු කනිටු භටයන්ටද නන් අයුරින් සහය වු සැමටද තුති පුදන්නට මීසම් වාසීහු පියවර ගත්හ.**



## සැප සම්පත් සොයා ගොස් අතරමං නොවී දේවරාජ්‍යය සොයා යන්නට වෙහෙසෙන්න

අප මෙලොව සැප සම්පත් සොයා අන්තයට යෑමෙන් දේව රාජ්‍යය කරා නොගොස් එමගින් උඩඟුව, අහංකාරකම, බල ලෝභිත්වය තුළින් ශාරීරික සහ මානසික රෝගයන්ට භාජනය වන බැවින් යාච්ඤාව තුළින් මරිය තුමියගේ ආදර්ශය තුළින්, දෙවියන් වහන්සේට වඩ වඩාත් සමීප විය හැකි බව කුරුණෑගල පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු ෆ්ලැසිඩස් සුජීව සිල්වා පියතුමා පැවසීය

කුරුණෑගල පදවියේ මැල්සිරිපුර මීසමට අයත් දිද්දෙනිය ලූර්දු දේව මාතා දෙව්මැඳුරේ වාර්ෂික මංගල පූජාවේදි එතුමා එසේ පැවසීය. මැල්සිරිපුර මීසම් සේවක ගරු දිමුතු රොහාන් ෆොන්සේකා පියතුමන් සහ දොමිනිකාන පැවිදි සොහොයුරියන්, මීසම් සංසය මංගල කටයුතු සංවිධානය කර තිබුනි.

**නිමල් ඒ. අල්මේදා**

## පන්නිපිටිය අභිවෘද්ධි ආලේප දානය

පන්නිපිටිය මීසමේ දරු දැරියන් 101 දෙනෙකුට අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ මෙහෙය අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේදී පැවැත්විණි. මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා සහ සහයක ගරු තුසිත සෝලංගාරච්චි පියවරුන් රදගුරු හිමිපාණන් සමග දිව්‍ය පූජා මෙහෙයට හවුල් වූ අතර දොමිනිකාන සොහොයුරියන් සමග දහම් පාසල් ගුරු කමිටුව එක්ව දරුවන් පිරිස සූදානම් කළහ.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**

**ගොඩැල්ල බංගලාවත්ත ජනපදයේ ඇග්නස් මහත්මියගේ නිවස ආර්ථික අපහසුකම් නිසාත් රෝගි තත්ත්වය නිසාත් ගොඩනැගීමට නොහැකිව බලාපොරොත්තු කඩව සිටි අවස්ථාවේදී ගොඩැල්ල වින්සන්ද පාවුලා සමිතියේ නෙත ගැටීම නිසා නව නිවසක උරුමය ලැබීමට පසුගියදා හැකි විය. හලාවත පදවි වින්සන් ද පාවුලා අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමා ආසිරි ගන්වා නිවැසියන්ට භාරදීම එදින සිදුවිය. මේ වසර තුළදි තව නිවසක වැඩ අවසන් කිරීමටත් නව නිවසක් සෑදීම ආරම්භ කිරීමටත් සැලසුම් යොදා ඇති බව වින්සන්ද පාවුලා සමිති තොරතුරු වලින් අනාවරණය විය.**

**එච්. ඒ. සිරිල් පෙරේරා**



දේව වචනයෙන් හික්මීම්

ධර්ම සංග්‍රහය



ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා



# ජේසු සමඟ ගමන් බිමන් යන පව්කාර මිනිසකුගේ කථාවක්

ශ්‍රීට දශක හයකට පමණ ඉහත මගේ ළමා කාලය මම සිහිපත් කරමි. උපතින් මා කිතුනු බව ලැබුවත් මා ඇදහූ දහමේ යථාර්ථය පිළිබඳ කිසිදු හැඟීමක් මා තුළ නොවිනි. මා පළමුව පාසල් ගියේ කුරුකුලාවේ රෝමානු කතෝලික පිරිමි පාසලටය. අපට හිටපු පාසලේ ලොකු මහතා මට ඉතා ආදරයක්, කරුණාවක් දැක්වීය. ඊට හේතු වූයේ මා තුළ වූ දුප්පත්කමත් පාසලේ පොදු වැඩ කටයුතු වලදී නායකත්වය ගන්නට තරම් මා තුළ වූ කුසලතාවය නිසාත් ය.

එතුමා ජේසුව ඇඩි ලෙස අදහන සැබෑ කිතුනුවකු වේ. ඔහු දිනක් මට කතා කොට මගෙන් ඇසුවේ අමුතු ආකාරයේ ප්‍රශ්නයකි. "කොලුවෝ උඹ ජේසුව අඳුනනවද? මම එක්වරම කීවේ "ඔව්, අඳුනනවා. ජේසු මරිය තුමිය ගේ පුතානේ" කියායි. ලොකු මහත්මයා කට කොණකින් සිනා සී "ඒකත් ඇත්ත. ඒ වුණාට මීට පස්සේ හොඳින් දැන ගන්නවා ජේසු කියන්නේ දෙවියන් වහන්සේ ගේ පුත්‍රයා බව. උඹ හොඳ ළමයෙක්. ජේසුට කථා කරන්න මං පුංචි යාච්ඤාවක් කියා දෙන්නම්.

"දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජේසුනි, මම ඔබට ප්‍රේම කරමි

දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජේසුනි මම ඔබව විශ්වාස කරමි.

දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජේසුනි, මම ඔබ කෙරෙහි බලාපොරොත්තු වෙමි."

එදා ඒ ළමා කාලයේ අයිති කරගත් එම යැදුම අද මා මැදි විය ඉක්මවා ගියත් මගේ මනසින් ගිලිහී ගියේ නැත. දිව්‍ය පූජාවේ දිව්‍ය සත්ප්‍රසාද වැඩමවන මොහොතේ දී අඩසියවසක් පුරාම මා ජේසුව ඇමතුවේ මෙම යැදුමෙනි.

එදා මෙදා තුර මා කිතුනුවකු හැටියට මගේ දහම ඇදහුවත් මෙම දහමේ අභ්‍යන්තරයට කිඳා බසින්නට හෝ එහි හරය ගුණාත්මක ලෙසින් අත්විඳින්නට මට ඕනෑකමක් නොවීය. යන්නම් වාලේ දහම් සිරිත් විරිත් ඉටු කළෙමි. මේ අතර මීට වසර පහකට පමණ ඉහත ශුද්ධවූ දේශය කරා වන්දනා ගමනක නිරත වීමට මට අවස්ථාව ලැබිණි. සංචාරක සමාගමකින් මෙහෙය වූ මෙම වන්දනා ගමනේ නඩය මාත් මගේ බිරිඳත් සමඟ තිස් පස් දෙනෙකු පමණ විය. ඉතා සුහදශීලි පිරිසක් සමඟ මේ ගිය ගමන තුළින් මෙතෙක් මා ඇදහූ ජේසු කේන්ද්‍ර කර ගත් මේ ගමන මා සිත උඩු යටිකුරු කිරීමට තරම් වූ සංචාරයක් විය. මා දැන් සිහිපත් කරන්නේ ජේසුව මගේ ජීවිතයට සම්බන්ධ කරගත් ආකාරයයි. මෙම ගමනේ දී මරිය තුමිය එළිසබෙත් තුමිය බැහැදැකීමට ගිය එළිසබෙත් තුමියගේ නිවස පිහිටි ස්ථානය වෙත අපි පැමිණියෙමු. අපට කරුණු කාරණා ඉතා හොඳින් පැහැදිලි කිරීමට අප සමඟ පැමිණියේ එවකට කොටහේන ආසන දෙව්මැඳුරේ මීසම් සේවකව සිටි ජෝ මාටින් පියතුමාය. කුඩා කඳු මුදුනක පිහිටි මෙම ස්ථානය ඉතා සිත් ගන්නා සුළු දර්ශනයක් ඉසිලීය. එම ස්ථානයේ ඇති කුඩා දෙව්මැඳුරේදී අපි දිව්‍ය පූජාවට සහභාගි වූයෙමු. එහිදී පියතුමා කළ දේශනය මම මගේ ජීවිතයට අයිති කර ගත්තෙමි. මරිය තුමිය දැකීමෙන් එළිසබෙත් තුමිය පැවසූ "ඔබ දැකීමෙන් මා කුස ඔත් දරුවා ප්‍රීතියෙන් පිනා ගියේ ය" යන වදන් සිහිපත් කරමින් පියතුමා පැහැදිලි කර දුන්නේ ඔබත් මින් මතු යන ඕනෑම ගමනක දී ජේසුව ඔබේ හිත තුළ රඳවා ගෙන යන්න. ඔබව දකින ඕනෑම කෙනෙකු ඔබ තුළින් දකින්නේ ජේසුව බැවින් එදිනෙදා ඔබේ ජීවිතයේ සියලුම ගමන් බිමන් ඔබට රිසි පරිදි ඵල දරන බවයි.

බොහෝ පාපයෙන් පිරුණු මා වැන්නකු මගේ ගමන් බිමන් සඳහා ජේසුව හවුල් කර ගන්නේ කෙසේ ද? කෙසේ වුවත් මේ සිද්ධිය තදින් අල්ලා ගත් මා සිත මගේ ජීවිතයේ එදිනෙදා සියලුම වැඩකටයුතු වල දී ගමන් කළේ ජේසුත් සමඟය. පාපි සිතක් කිසි විටක ජේසු අත නොහරින බව මාගේ දෛනික ජීවිතයේ බොහෝ අවස්ථාවල මා අත් දුටුවෙමි.

මෙම ගමනේ දී ජේසු කුරුසියේ ඇණ ගසනු ලැබූ ගොල්ගොතා කඳු මුදුනේ දී මගේ සිත ස්ථිරසාර වූ මනා පැවැත්මක් කරා යොමු කිරීමට තරම් අත්දැකීමට යොමු වූයෙමි. ජේසු කුරුසයෙන් බා දේහය තැන්පත් කරන ලද ගල් ගෙය සිපාචාර කිරීමට බොහෝ බැතිමතුන් පිරිසක් එක්වූහ. එක් අයකුට තප්පර තිහකට වඩා වැඩි කාලයක් එහි රැඳීමට තරම් අවස්ථාව නොවිනි. අපේ නඩයේ අයත් විශේෂයෙන් මගේ බිරිඳත් පෝලිමට එක්වෙමින් මට පැවසුවේ ගල්ලෙන සිපාචාර කර අවශ්‍ය ඕනෑම දෙයක් ජේසුගෙන් ඉල්ලන්නට කියා. මම එකවිටම සිපාචාර කිරීමට යන පෝලිමට එක් වූයේ නැත. මෙම ජනතාව ජේසුගෙන් මොන තරම් දේවල් ඉල්ලනවා ඇද්ද? මේ අතරේ මම ද යමක් ඉල්ලා ජේසුට කරදර නොකළ යුතු යැයි මට සිතිනි. ඉල්ලන දේ ගැන කිසිදු හැඟීමකින් තොරව මම ද පෝලිමට එකතු වුණෙමි. මගේ තප්පර තිහ මට හිමිවුණි. මා ජේසු අමතා පැවසුවේ මෙලොවින් අවසන් හුස්ම ගන්නා මරණය නම් වූ ඒ මොහොතේ දී මගේ තනියට ඔබ මා සමඟ සිටින ලෙසය. මා අද ජීවත් වන්නේ ඒ සුන්දර මොහොත අත් දකින්නට ආසාවෙනි. අද මාගේ එකම විශ්වාසය මරණය කිසි මොහොතක කිසි විටෙක අසුබකාරී බිය ගෙන දෙන්නක් නොවන බවයි.

මෙසේ මා ජේසු වටහාගෙන ජීවත් වන අතර පසුගිය දිනෙක මා හිත සසල කරවන ඇඩි වේදනාත්මක සිද්ධියකට මුහුණ දීමට මට සිදු විය. අලව්ව ප්‍රදේශයේ බොහෝ රෝග රාශියකට ප්‍රතිකාර කරන සිංහල වෙද මහතකු සිටින බවත් ඒ වෙද මහතා වෙත කැඳවා ගෙන යන ලෙස මගේ බිරිඳ කිහිප වතාවක් ම මට ඇවිටිලි කළාය. ඇගේ ඉල්ලීම අනුව මා ඇයත් සමඟ වෙද මහතා හමුවීමට ගියේ ප.ව. 1.00 ට පමණය. ඒ වන විට වෙද මහතා උදේ වරුවේ ප්‍රතිකාර අවසන් කර දිවා ආහාරය සඳහා ප්‍රතිකාර කිරීම නවත්වා තිබිණි. කිහිප දෙනෙක්ම වෙද මහතා හමුවීමේ බලාපොරොත්තුවෙන් සිටි බැවින් ඒ අය සමඟ බිරිඳට ඉන්නට සලස්වා මම අවට පරිසරය බලමින් වත්තේ එහා මෙහා ඇවිද්දෙමි. මිදුලේ පසෙක වූ ජම්බු ගසක් යට හාන්සි පුටුවක් තබා දිවා ආහාරයෙන් පසු වෙද මහතා පැයක් පමණ එසේ ගත කිරීම සිරිතක් බව පැමිණි අයකුගෙන් මම දැනගත්තෙමි.

☛ 15 පිටුවට

✍ යූ. හර්බට් පෙරේරා
එඬේරමුල්ල

# සිතුවිලි සැලැස්ම මිනිසා සතුය එහි අවසන් තීරණය දෙවිඳුන් සතුය

"ඔබේ ජීවිතේ ඔබ පතන දේම ඔබ සිතන දෙයම ඒ අයුරින්ම ඔබට හිමි වී තිබේ ද? නැහැ නේ ද? ඔබ දෙවියන් වහන්සේට බොහෝ සේ ලං වී සිටියත් ඔබ කොතරම් යහපත් දිවියක් ගත කළත් ඔබ උන්වහන්සේගෙන් ඉල්ලන සෑම දේම ඔබට ලබා නොදෙන්නේ ඇයි කියා ඔබ උන්වහන්සේගෙන්ම අසනවා ඇති. තව සුළු මොහොතකින් නැතිනම් මෙම ලිපිය කියවා අවසන් වන විට එයට පිළිතුරු සොයා ගන්නට ඔබටම හැකි වේවි යැයි මම සිතමි. ඒ නිසාවෙන්ම අද දින මම ඔබ හා මෙසේ බෙදා ගන්නට සූදානම් වන්නේ ඔබේ මනසේ නිතර දෙවෙලේ මතුවන මෙම කාරණාව පිළිබඳවයි."

විටෙක සතුටකි. විටෙක වේදනාවකි. තවත් විටෙක සිනහවකි. තවත් විටෙක කඳුලකි. මෙයයි ඔබට මට උරුම වී ඇති ජීවිතය. මේ ජීවිතේ සොඳුරු තැන් සොයාගෙන කාටත් පෙරටුව ඔබ දුවන්නට ඇති හති දමාගෙන. නමුත් මිරිඟුවක් වගේ ඈතින් ඈතට ඒ සුන්දරත්වය ඔබෙන් ගිලිහී යන්නටත් ඇති. ඔබේ ජීවිත කතාව නම් වූ පොතේ පිටු එකින් එක පෙරළා මොහොතකට එක් ඉසව්වකට කැටිකොට තබා ගන්නට මෙය ඔබට එක් අවස්ථාවක්. සිතා බලන්න, දවසින් දවස ඔබට මට ඇසුරු කරන්නට බොහෝ දෙනෙකු මුණ ගැසෙනවා. අත්දකින්නට බොහෝ දේ සිදුවෙනවා. අසන්නට බොහෝ දේ කන වැකෙනවා. සිතන්නට බොහෝ දේ මනසට එනවා. ඒත් එක්කම හදවතින්ම පවා දුක් වන්නටත් බොහෝ දේ හේතු වෙනවා. ඒ සමඟම අපේ ජීවිතේ සෑම කටයුත්තක් ගැනම ඕනාවටත් වඩා අපි වද වෙනවා. අපේ අනාගතේ අපි සැලසුම් කරනවා. සැමවිටම සෑම දෙයකදීම අපි සිදු කරන්නේ අපට රිසි දේ පමණයි. ඇතැම් විට ඔබ ඔබේ ජීවිතේ ගැන සැලසුම් බොහොමයක් සාදාගෙන ඇති මේ වනවිටත් නමුත් ඔබ වරකට හෝ සිතුවාද ඔබේ ජීවිතේ හිමිකරු ඔබ නොවන බව. ඔබේ සිතුවිලිවල, ඔබේ ජීවිතේ සැලැස්මේ, ඔබේ තීරණවල අයිතිය ඇත්තේ ඔබට නොවෙයි සැදැහැවතුනේ. අපගේ සර්වබලධාරි වූ දෙවියන් වහන්සේට පමණයි. නමුත් ඔබට මට ඒ සත්‍ය අද අමතක වී හමාරයි. සමහර විට ඔබ මා සමඟ එකඟ නොවන්නට ද ඉඩ තිබේවි. නමුත් කිතුනු අප පිළිගත යුතු ස්වභාව ධර්මයාගේ ඉගැන්වීම ද එයයි.

මොහොතකට ඔබ මෙනෙහි කර බලන්න. ඔබ කරන කියන සෑම ක්‍රියාවක්ම සිදුවන්නේ කාගේ කැමැත්තට ද කියා. බහුතරයකගේ සිතට දැන් නැගෙන්නේ එකම පිළිතුරයි. ඒ "ඔබ ක්‍රියා කරන්නේ ඔබ සිතන පරිදි" යනුවෙනි. නමුත් විය යුත්තේ එයම ද? නැහැ සැදැහැවතුනේ එය නොවේ. කෙනෙක් දැන් මා හා එදිරිව සිතන්නට පුළුවන්. ඔබ විසින් කළ යුත්තේ ඔබ සිතන දේම පමණක් බව.

☛ ලබන සතියට

✍ කේ. ඒ. නිම්නාදි රොද්‍රිගෝ
13 ශ්‍රේණිය, සිරිකුරුස විදුහල ගම්පහ

# ක්‍රිස්තියානි ශීල ධර්මයේ කාර්යභාරය 01

2015. 02. 08 ලිපිය හා සබැඳේ...

## නව මිනිසා

ප්‍රසාද ස්නාපනය මඟින් බිහි වන නව මිනිසා ඉහත සඳහන් කරන ලද විශේෂතම සම්බන්ධතාවයට නැකම් කියයි. ක්‍රිස්තු අනුගාමිකයන්ගේ සුචරිතයේ මිනුම් දණ්ඩ වනුයේත් මෙය බව පැහැදිලිය. (මැතිව් 5:48). ක්‍රිස්තුන් වහන්සේ මිනිස් බව ගැනීම හා උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේත්, අප අතරත් ඇති සම්බන්ධතාවය, අපගේ දාරකත්වයට මූලික පදනමය. මිදිවැල හා එහි අතු අතරැති සම්බන්ධය උපමා කරත්තේ ක්‍රිස්තුන් වහන්සේ හා විශ්වාසකයා අතර පවත්නා සම්බන්ධකම උද්දීපනය කරන අයුරින්ය (ජුවාම් 15:4-8). මේ අනුව කල්පනා කර බැලීමේදි ක්‍රිස්තු ජීවිතයට පංගුකාරවීම හා සමිඳුන් සමඟ සම්බන්ධවීමේ හැකියාව ගැන ශුද්ධවූ පාවුලු තුමා සඳහන් කරන මතය. එම අදහස තවදුරටත් සනාථ කිරීමකි (රෝම 8:17, ගලාති 4:6). මෙම මූලික අත්දැකීම සහ ක්‍රිස්තියානි ජීවිතයේ පදනම සමිඳුන් සමඟ ඒකාබද්ධ වීමයි.

ඉහත විස්තර කරන ලද කරුණු පරාවර්තනය කරන අපට පෙනී යන්නේ මිනිසාගේ කිතුනු ජීවිතයේ උතුම්කම හා ශ්‍රේෂ්ඨත්වය වටා අපගේ තේමාව ගෙතී ඇති බවයි. කිතුනු ජීවිතය හා කිතුනුවන් විසින් එම ජීවිතය ගත කළ යුතු අන්දම විද්‍යාත්මක ලෙස හැඳෑරීම ශීල ධර්මය යන්න දෙස් දෙයි. එම නිසා එය ස්වාභාවික ආචාර විද්‍යාව මෙන් මිනිස් මනස පමණක්ම භාවිත කරමින් මිනිසාගේ හැසිරීමට අදාළ නීති මාලාවක් සකස් නොකරයි. එය හුදෙක් විශ්වාසයක්, මිනිසා කිතු තුමන්ට සම්බන්ධ කරන ප්‍රසාද ස්නාපනයක්, යම් දිනකදී දෙවිඳුන් දැක ගැනීමේ භාග්‍යය ළඟා කරදෙන, ප්‍රසාද ස්නාපනය මඟින් ආරම්භ වන දේව ජීවිතයත් මත ගොඩනැංවෙයි.

මේ හේතුවෙන් යහපත් ජීවිතයක් ගත කිරීමෙන් පමණක්ම එසේත් නැතහොත්, නීතියට වහල්ව, නීතිය අනුව ජීවත් වීමෙන් පමණක්ම, කිතුනුවා සෑහීමට පත් නොවෙයි. විශ්වාසය හා ප්‍රසාද ස්නාපනය මඟින් ලබා ගත් වරප්‍රසාද ජීවිතයට උත්තරයක් වශයෙන් ප්‍රේමයෙන් පණ ගැන්වුන උසස් ආධ්‍යාත්මික හා ලෝකෝත්තර අදහස් මත ගොඩ නැගුණ ජීවිතයක් විය යුතුයි එය. කිතු තුමන් විසින් දේශනා කරන ලද ගැලවීමේ සුභාරංචියත් මෙයමයි. මේ නිසාම ක්‍රිස්තියානි ශීල ධර්මයේ උසස් මනෝ රථයන් වන ප්‍රේමය, ක්‍රිස්තු අනුසාරය, යනාදින් මනාව වර්ධනය වනාතර, ඒවා ක්‍රියාත්මක ද වනු ඇත.

## නූතන සමාජය තුළ

ක්‍රිස්තු භක්තිකයන් හැටියට අප අද ජීවත් වන්නේ නොයෙකුත් නිෂ්පාදනයන් ගෙන් ගහන, නා නා විධ ධර්මයන් හා ක්‍රියා මාර්ගයන්ගෙන් සංයුක්ත, කොටින් කියතොත්, විවිධාකාරයක් විදහාපාන සමාජයකයි. එම නිසා කිතුනු කල්පිතය අරුත්බර විය යුතුයි; සිත් කා වදින සුළු විය යුතුයි. ඒ හේතුවෙන් පැහැදීමකින් යුතු, අර්ථවත් ජීවිතයක් ගත කිරීමට කිතුනුවා ඉදිරිපත් වෙයි. එම නිසා, මේ දෙය කළහොත් හරිද, නැතහොත් වැරදිද, එය පාපයක් ද, නැද්ද? යනාදි ඍනාත්මක කරුණු පමණක් කිතුනු ජීවිතයට ඉදිරිපත් කළ පමණින් නොසෑහේ. කිතුනුවාගේ උසස් කැඳවීම හා ඔහු සතු වටිනා දායාදය වන විශ්වාසය පදනම් කොට ගත් ධර්මය අනුව හැඩගැස්වීමත්, නූතන සමාජයේ ජීවත් වන කිතුනුවාට නිතැතින්ම අත්‍යවශ්‍ය වේ.

ක්‍රිස්තියානි ශීල ධර්මය....5 පිටුවෙන්

නූතන සමාජය එල්ල කරණ මෙම අභියෝගය අපව ගෙන යන්නේ කිතුනු කල්පිතයේ මූලාශ්‍රය වෙතටය. නූතන නවීකරණයේ විශේෂඥයින් බොහෝ දෙනෙකුන් පවසන පරිදි මෙම මූලාශ්‍රය වන්නේ ශ්‍රී වචනය අඩංගු ශුද්ධවූ ලියවිල්ල හා පැරැණි සභා පියවරුන්ගේ ඉගැන්වීමයි. මෙම ශුද්ධවූ ලියවිල්ල කියවිය යුත්තේ පරිශීලනය කළ යුත්තේ තේරුම් ගත යුත්තේ සභාව තුළයි. උගන්වන සභාවේ මඟ පෙන්වීම ඔස්සේයි. මෙම නව අවබෝධය, කිතුනු ශීල ධර්මයේ පදනම පැහැදිලි කරන ශුද්ධවූ ලියවිල්ලේ උත්තරීතර භාවය සාක්ෂාත් කරලයි.

## ආරාධනය පිළිතුර

ශුද්ධවූ ලියවිල්ලෙහි සඳහන් වන හැටියට දෙවිඳුන්ගේම මුල පිරීමෙන්, මිනිසාට දානය කළ කැඳවීමෙන් අත්වන දේව දරුකම ගැන, ක්‍රිස්තියානි ශීල ධර්මය, අප මනසට, විශේෂයෙන් සිහිපත් කරවයි මෙම ආරාධනය, මිනිසාට ගරු කරලන අතර, එලෙසම කිසිම වෙනස්කමක්, නොමැතිව සෑම කෙනෙකුටම මෙම ආරාධනය ලැබෙනු ඇත. එය එළි දකින්නේ, මල් එලගන්නේ දෙවියන් වහන්සේගේ ආරාධනය දැනටමත් පිළිගෙන සිටින පොදු හවුල තුළයි. එම සමාජය නැතහොත් පොදු හවුල, කිතුනු පවුල ලෙස අරුත් ගන්වයි. මේ නයින් බලන කල ක්‍රිස්තියානි ශීල ධර්මය, මිනිසාගේ ගැලවීමේ කෘතියට නැකම් කියන බැවින්, සෑම මිනිසෙකුටම, දේව ප්‍රේමයේ හේතුවෙන් ශුද්ධවන්ත භාවයට කැඳවනු ලබයි. එනම්, එය හුදෙක් දේව දරුවන් මෙන් ජීවත් වීමටමයි. කිතුනු ශීලය එම නිසා පටන් ගන්නේ, මෙන්න මෙම දේව කැඳවීම, ආරාධනය බාර ගන්නා මොහොතේ සිටයි. මෙම හේතුව නිසා, ආදරයෙන් වෙලුනු කිතුනු ශීලය නීතියක හැඩහුරුකමක් නොගනී. එහෙත් සුවිශේෂක සුභාරංචිය, යම් කිසි බල කිරීමකින් යුතුව, නියමයකින් මෙන්, මිනිසා ශුද්ධවන්ත භාවය වෙත ළඟා නොකරයි.

එනමුත් ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාවනට මිනිස් හෘදයන් විවෘත කරමින්, ඔවුන් ශුද්ධවන්තභාවය කරා කැඳවාලයි. නීතිය දෙස එවැන්නා නෙත් යොමු කරන්නේ වහල් ගතියකින් තොරව, හුදෙක් ආධාර මඟක් ලෙසිනි.

හැම විටම මිනිස් නිදහසට ගරු කරමින්, එය නිසියාකාරව දියත් කරලීමට සහය වීමක්, දේව කැමැත්ත මෙහිදී කරනු ලබයි. දෙවිඳුන්ගේ නිදහස හා මිනිසාගේ නිදහස අතරැති සහ ජීවනය මිනිස් හෘදයන් දේව ප්‍රේමයට විවෘත කරලයි.

ඥානාර්ථ ප්‍රදීපය

දෙවියන් හා බැතිබර සංවාද

## ජන වන්දනාව

ක්‍රිස්තු වර්ෂ 2015
මාර්තු 01 ඉරිදා

## චතාරික භාවනා

දෙවන සතිය

**"මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. මොහුට සවන් දෙන්න."**
**(මාක් 9:7)**



අග්‍රගෝල තුන් දෙනාම කන්ද
මුදුනෙ හිටිය දාක
හැබෑ රූපෙ දිස් උනාම සතුටු
උනා හදවතින්ම
කූඩාරම් ගහගන්නට සැලසුම් කළ
පේදුරු හට
යන්න උනා කඳු බැහැගෙන
ජීවිතයට මුහුණ දෙන්න

ප්‍රශ්න කඳුළු දුක් කරදර
මේ ඔක්කොම කඳු පාමුල
ඒ ඇත්තට මුහුණ දෙන්න ඇයි
අපි බය අත්දකින්න
සතුටු දවස් ගත කරද්දි
දකිනව එය හොඳයි කියල
දුක් ගිනි කන්දක් නගින්න
බය හිතෙනව එය දකින්න

සමිඳුනි මේ මනුස්සකම
පේදුරුටත්
දැනුන එදා
මා කවුරුද අවංකවම බෑ එක
ලෙස පිළිගන්නට
අන් වෙස් ගන්නට කැමතියි හොඳ
මිනිස්සු බව කියන්න
සැබෑ මුහුණු දැක්කදාට මං
ඉවරයි කියා සිතේ
සමිඳුනි.....

ඔව් මම ඔබ වගේ ඉන්න
කළ කී දේවල් කරන්න
ඇත්තට මම මුහුණ දෙන්න
දිරිය දෙන්න දිවි ගෙවන්න

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# ක්‍රිස්තුස් වහන්සේගේ තේජශ්‍රීයට අපද හවුල් වෙමු

ඉරුදින මෙනෙහි කිරීම

## චතාරික සමයේ දෙවන ඉරුදින - 2015. 03. 01

අද්‍ය නියමිත පළමු දේව ප්‍රකාශනය තුළ ආබ්‍රහම් තම පුත් ඊසාක්ව දවන යාග පූජාවක් කොට ඔප්පු කරන පිණිස කන්දකට නැගීම පෙන්නුම් කරයි. හෙතෙම තම යාග පූජාව ඔප්පු කිරීමට සූදානම් වන විට දෙවියන් වහන්සේගේ දූතයා ප්‍රකාශ වන ලදි. එහිදී ආබ්‍රහම් දේව ගරුබිය ඇත්තකු බව ස්වාමින් වහන්සේගේ දූතයා ප්‍රකාශ කරන ලදි. මේ හා සමානම සිදුවීමක් අද සුවිශේෂය තුළ ද දැකගත හැකිය.

ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේගේ තේජාලංකාරය විදහාපානු පිණිස උස් කන්දකට නැගී සේක. උන්වහන්සේගේ අන්‍යාරූප විලාශ වීමත් සමගම දෙවියන් වහන්සේ වළාකුලක් ආකාරයෙන් දර්ශනය වෙමින් "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය" යනුවෙන් ප්‍රකාශ කිරීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය ප්‍රකාශ කරන ලදි. තවද මේ සිදුවීම් දෙකම උස් කන්දකදී සිදුවීම හරහා අපට පසක් කර දෙනුයේ "කන්ද" වනාහි දෙවියන් වහන්සේව මුණ ගැසෙන හා උන්වහන්සේගේ අභිමතය ඉටුවන තැනක් බවයි. තවද පළමු දේව ප්‍රකාශනයේ දී දෙවියන් වහන්සේට ආබ්‍රහම්ගේ විශ්වාසය පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වූවා සේම සුවිශේෂය තුළ දීද අන්‍යාරූප විලාශ වීමේ සිදුවීම හරහා වෙනත්



ආකාරයකින් ශ්‍රාවකයින්ගේ විශ්වාසය පරීක්ෂා කර බැලීම සිදු විය.

ඉහත සිදුවීම් දෙක තුළ දීම දෙවියන් වහන්සේගේ අභිමතය ඉටුවන පිණිස බලපෑ ප්‍රධාන සාධක දෙකකි. එනම් "දේව ගරු බිය" (උත්. 22:12) සහ උන්වහන්සේගේ හඬට සවන් දීම (මාක් 9:76) දෙවියන් වහන්සේ තම අභිමතය ඉටුකර ගනු වස් විවිධ පුද්ගලයින් තෝරා ගනු ලැබීය. එකී අභිමතය නම් "උන්වහන්සේ ප්‍රේමය වන බව" ප්‍රකාශ කිරීමය. මෙකී අභිමතය ඉටුකරගනු පිණිස විවිධ පුද්ගලයින් පුරාණ ගිවිසුම තුළ මෙන්ම නව ගිවිසුම තුළද තෝරා ගනු ලැබීය. ආබ්‍රහම්ගේ තෝරා ගැනීම මෙන්ම සුවිශේෂයේ සඳහන් ශ්‍රාවකයින් තිදෙනා තෝරා ගැනීම ද මෙයට කදිම නිදසුන් ය.

මේ ආකාරයට සුවිශේෂය තුළ දෙවියන් වහන්සේ තම සැලැස්ම ඉටුකරගනු පිණිස අන්‍යාරූප විලාශ වීමේ සිදුවීම සඳහා නිරතුරුවම ක්‍රිස්තුන් වහන්සේ ලඟින්ම සිටි ශ්‍රාවකයින් තිදෙනා වන පේදුරු, ජාකොබ් සහ ජොහාන් යන ශ්‍රාවකයින් තිදෙනා ද ඊගෙන ගිය සේක. එකී සැලැස්ම නම් උන්වහන්සේගේ මහිමාලංකාරයේ සාක්ෂිකරුවන් වන පිණිසය. මේ නිසාම දෙවියන් වහන්සේ "මොහුට සවන් දෙන්න" යනුවෙන් ප්‍රකාශ කරන සේක. එහෙත් මෙකී මහා තෙජශ්‍රීය ඉදිරිපිට සිටි මේ ශ්‍රාවකයින් තිදෙනාට තමන් ප්‍රකාශ කරනුයේ මොනවා ද යන්න වත් හරි හැටි අවබෝධ නොවීය.

එහෙයින් මෝසෙස්ටත්, එලියාටත් ක්‍රිස්තුන් වහන්සේටත් වෙන වෙනම මණ්ඩප තුනක් සාදමු යැයි පේදුරු පවසයි. පුරාණ ගිවිසුම තුළ මෝසෙස් මඟින් "නීතියත්," එලියා දිවැසිවරයා මඟින් "දිවැසිවර කාර්යයත්" නියෝජනය කරයි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ තුළ මෙකී නීතියත්, දිවැසිවර කාර්යයත් පරිපූර්ණත්වයට පත් වූ බව පේදුරුට අවබෝධ නොවීම නිසාම මෙසේ ප්‍රකාශ කරන ලදි.

දෙවියන් වහන්සේගේ අභිමතය යනු නීතියත් දිවැසිවර භාවයත් අභිබවා යන්නකි. දෙවියන් වහන්සේගේ තම ප්‍රේමය ප්‍රකාශ කරනු පිණිස, ක්‍රිස්තුන් වහන්සේ නීතිය හා දිවැසිවර කාර්යය තමන් වහන්සේ තුළ පූර්ණත්වයට පත් කරමින්, ආබ්‍රහම් තෝරා ගනු ලැබූවාක් මෙන්ම පේදුරු, ජාකොබ් සහ ජොහාන් යන ශ්‍රාවකයින් තෝරා ගනු ලබමින් එකිනෙකාට සුවිශේෂී කැඳවීම් ලබා දුන් ලෙසම අපට ද සුවිශේෂී ආකාරයකට කැඳවනු ලබන සේක. ඒ උන්වහන්සේගේ අපරිමිත ප්‍රේමය ලොවට ප්‍රකාශ කිරීමටය. දේව ගරුබිය හා දේව වචනයට අවනත වීම තුළ එකී ප්‍රේමය ලොවට ගෙන යා යුතුය.

එකිනෙකා ගේ තේජාලංකාරය දෙස නොව ක්‍රිස්තුන් වහන්සේගේ තේජාලංකාරය වෙත නෙත් යොමු කරමු. මෙසේ අප උන්වහන්සේගේ ආරාධනයට නතු වන්නේ නම් උන්වහන්සේගේ තේජශ්‍රීය අපට ද දැක ගත හැකිය. එවිට අපට ද "ගුරු දේවයනි, අපට මෙහි සිටින්න ලැබීම මහත් වාසනාවකි" යනුවෙන් ප්‍රකාශ කළ හැකිය.

**ගරු ෂෙමාන් වික්‍රමසිංහ සහෝදරතුමා**
ගොන්සාල්වෙස් සිංහල ආයතනය
ජාතික දෙව්සත්හල



# එක්ව කල්වාරිය නගිමු ?

### පළමු ස්ථානය
### ජේසුස් වහන්සේ මරණයට තීන්දුව ලැබීම



පටහැනිව අපේ හෘද සාක්ෂියට
දුන් අනීති නීති පිළිබඳව
මෙනෙහි කරමු අපි
එවැනි දා කොතෙකුත්
දැස් ඉදිරිපිට සිදුවන විටදිත්
දැක දැකත් නොදුටුවා විලසින්
සිටි අවස්ථා මෙනෙහි කරමු
අප කළේ කුමක් ද?
ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන්.

### දෙවන ස්ථානය
### ජුදයෝ ජේසුස් වහන්සේගේ කරපිට කුරුසිය තැබීම



සුබ අස්න දෙසන්නට දිළිඳුන් හට
සනසාලන්න පීඩිත වූවන්
මුදාහරින්න වහලුන්
පැමිණි ජේසුට කුරුසියක් කරට ?
කුරුසියක් යනු වටිනාකම වෙනුවෙන්
දේව රජයේ ගන්නා වූ තීරණයන්
වෙනුවට ලැබෙන දුක්ප්‍රාප්තියටයි
සූදානම් ද? එය කරට ගන්නට අපි.

### තුන්වන ස්ථානය
### ජේසුස් වහන්සේ පළමුවර බිම වැටීම



අසත්‍ය රජකළ සමයක සත්‍ය
වෙනුවෙන් හඬ නැගූ ජේසුස් වහන්සේ
අද අසත්‍යය වෙනුවෙන්
බිම හෙලා ඇත.
පෞද්ගලිකව - පවුලක් ලෙස
සමාජයක් ලෙස දැඩි දුෂ්කරතා හමුවේ
විවිධ ශාරීරික මානසික අතවරයන්
සමඟ බිම ඇද වැටෙන මිනිසුන්
නැගිටුවාලන්නට අප කර ඇත්තේ
කුමක් ද?

### හතරවන ස්ථානය
### ජේසුස් වහන්සේට තම මෑණියන් මුණ ගැසීම



මුළු මිනිස් සංහතියේම පාපය නිසා
කුරුසියට කර දී අප ගලවා ගැනුමට
ජේසුට දිරිය දුන් අම්මා ඇයයි.
මව් පදවියේ ශ්‍රේෂ්ඨත්වය රැකගනිමින්
මවක් ලෙස අපට ඇති අභියෝගය
භාරගන්නට සූදානම් ද? අපි.

### පස්වන ස්ථානය
### ජේසුස් වහන්සේට සිරේනියේ සීමොන් උදව් වීම



ක්‍රිස්තුස් වහන්සේගේ වේදනාව අඩුවීමට
සීමොන් සහය විය.... ඒත් අපි?
කෙනෙකුගේ විඳවීමට සහය වූවාද?
විඳවීම වැඩි කළා ද? විඳවීමට උර දුන්නා ද?
එය නැති කිරීමට සහය දුන්නා ද?

### හයවන ස්ථානය
### වෙරෝනිකා ජේසුස් වහන්සේගේ මුහුණ පිස දැමීම



සංවේදී වූවාය වෙරෝනිකා
ජේසුගේ වේදනාවට එදා
නිර්භීත වූවාය ඇය
අසාධාරණ වේදනාව හමුවේ
පවුලේ කුරුසිය කරට ගත්
දූෂණයට ලක් වූ අතවරයන්ට මුහුණ
දෙන්නවුන්ගේ කඳුළු පිස දමන්නට
පියවර ගත්තේ ද? අපි.

### හත්වන ස්ථානය
### ජේසුස් වහන්සේ දෙවෙනි වර බිම වැටීම



පාවා දුන් ජුදාස් නිසා, පේදුරුගේ ප්‍රතික්ෂේපය නිසා
තෝමස්ගේ සැකය නිසා සෙබදිගේ පුතුන් දෙදෙනා බලයට පොර කෑ නිසා
වැටුනේය එතුමා දෙවන වරටත් මිනිසුන් ලෙසින් අපි මිනිස්කම වට්ටමුද?
සංස්කෘතිය - සභ්‍යත්වය වට්ටමුද? ක්‍රිස්තු දේහය නගා සිටුවන්නට
ක්‍රියා කළේ ද? අපි.

### අටවන ස්ථානය
### ජේසුස් වහන්සේ ජෙරුසලෙම් ස්ත්‍රීන් සැනසීම



ක්‍රිස්තුන් වහන්සේ සනසන්නට පෙර
ඔවුන්ගේ දරුවන්ගේ පාපයෙන් පිරුණ
ජීවිත ගැන හඬන්නට ඇරයුමකි
වැඩිහිටියන් නොසලකන
සාරධර්ම අගය නොකරන
අනාගත පරපුර වෙනුවෙන්
පියවරක් ගත්තා ද? අපි

### නමවන ස්ථානය
### ජේසුස් වහන්සේ තුන්වන වරට බිම වැටීම



සමිඳුන්ට වේදනා
පමුණුවා දුසීල
කිරීමට
හැකි නොවීය
ජුදයින්ට
පියාණන්ගේ
රැකවරණය
මැද වැටි වැටී
නැගිටිමින් නිවැරදි
මඟ - කුරුසියේ
මඟ නතර නොවීම ගියේය.
අනාරක්ෂිත බව දික්කසාදය, දිවි නසා ගැනීම්
දුප්පත්කම හමුවේ
ඇද වැටෙන්නන් වෙනුවෙන් කුමක් කළේ ද? අපි.

ඉතිරි කොටස ලබන කලාපයේ...

කුලියාපිටියේ
**රීටා සේනානායක**

# වෙහෙස 'වූවාවූ' ද බර 'ඉසිලුවාවූ' ද සියල්ලෙනි..!

**කතුතුමනි,**

පසුගිය ඥානාර්ථ ප්‍රදීපය කලාපයම වෙන්කර තිබුණේ, සුදුතුම් පියාගේ ශ්‍රී ලංකා සංචාරය අරබයා සිදුකරන ලද දැවැන්ත සූදානම පිළිබඳව පාඨකයන් දැනුම්වත් කිරීමට ය. අපේ ලාංකික කිතුනු සභාවේ මහ එඬේරාණන් ප්‍රමුඛ විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරින් විසින් දියත් කරන ලද එම 'මහා මෙහෙයුම' පිළිබඳ, නිරවුල් අවබෝධයක් ලබාගැනීමට ඒ නිසා අපට හැකිවිය.

මෙවන් බොහෝ රාජ්‍ය උත්සව මෙන්ම වෙනත් ආයතනික උලෙළ සංවිධානය කර අත්දැකීම් ඇති අය හට නම්, මෙම උත්සවය අළලා සිදුකෙරුන - එමෙන්ම කිසිවෙකුටත් නොපෙනුන, යටිතල ක්‍රියාකාරිත්වය ගැන, අමුතුවෙන් විස්තර කළ යුතු නැත. එහෙත් සාමාන්‍ය ජනතාවට පෙනෙන්නේ අදාළ දිනයන්හිදී සිදුවන සිදුවීම් මිසක, කා හටත් නොපෙනී, ඒ වෙනුවෙන් විවිධ පුද්ගලයන් දරන ලද දහඩිය සහ වෙහෙස මහන්සිය නොවේ. කෙසේ වෙතත්, මෙහිදී අප දුටුවේ කතෝලික සභාවේ පවතින සංවිධානාත්මක හැකියාවේ ශ්‍රී ලාංකික මොඩලය යි. එසේත් නැතිනම්, විවිධ හැකියාවන් වලින් පිරි ශ්‍රී ලාංකික අනන්‍යතා සළකුණු වල, විශිෂ්ට හැඩතල යි.

සාමාන්‍ය ජීවිතයේදී වුවද, පෙනෙන දේ පිටුපස බොහෝ නොපෙනෙන දේ සිදුවන බව නොරහසකි. අම්මා කෙනෙකු තම දරුවන්ට උදේ කෑම පාර්සලයක් සූදානම් කරදී පාසලට පිටත් කර හැරීම, 'පෙනෙන' සිද්ධිය වුවද, ඒ සඳහා පාන්දරින් අවදි වී ඇය කරනා යුද්ධය, දරුවන්ට හෝ සමහර විට ඇයගේ සැමියාට හෝ 'නොපෙනෙන' යථාර්ථය යි. එහෙත් දරුවන්ගේ අනාගත ලෝකය සුන්දර වන්නේ එම නොපෙනෙන කාර්යභාරයන් හි පවතින මහා දයාවේ සහ මනා ගෘහ කළමණාකරණයේ පිහිටෙනි.

එලෙසම ශුද්ධොත්තම පියතුමාගේ ලංකා සංචාරයද, ප්‍රකාශ වුන මොහොතේ සිට අරඹන ලදැයි සිතිය හැකි 'යුද්ධය', මොන තරම් බැරෑරුම් වූවාද යන්න සහ එම යුද්ධයට එඩිතරව මුහුණ දී. තම හැකියාවන්, දක්ෂතා සහ දෙවියන් වහන්සේගෙන්ම ලද අනේක තලෙන්තු උන්වහන්සේගේම මහිමය උදෙසා වැයකර, මහා ආත්ම තෘප්තියක් ලද එම වීරයන්ගේ කථාන්දර ඔබ පුවත්පතෙන් අප කියෙව්වේ, හද පිරීයන මහා ආදරයකින් හා ගෞරවයකිනි. සැබැවින්ම මෙම මහා මෙහෙයුමේ වැඩි ගෞරවය හිමිවිය යුතු අප අගරදගුරු තුමාගේ පටන්, ගෝල්පේස් පිටියේ යකඩ බට සිටවූ අහිංසක කම්කරුවා දක්වා, සියලු දෙනා සිදුකරන ලද එම දයාවේ කාර්යභාරයන් වෙත, සියලු නිහඬ පාඨකයන් වෙනුවෙන් අපගේ හෘදයාංගම ආචාරය පුද කිරීමට ඉඩ දෙන්න.

අවසාන වශයෙන්, එක්තරා ලේඛකයෙක් විසින් සම්පාදනය කර තිබූ 'ජූලි 7.......' නම් සිත් ඇදගන්නා ලිපියේ, අවසානයට සඳහන් කර තිබූ ලෙසටම, මෙම මහා මෙහෙයුම වෙනුවෙන් වැයවුනු සියල්ලන්ටම ලැබෙන ආත්ම තෘප්තිය ගැන කර තිබූ ඉඟිය, බොහෝ කිතුනුවන්ගේ ඇස් අරවන්නක් වේවා යි යන්න අපගේ පැතුමයි. කිතුනු මාධ්‍යවේදියකුගේ සැබෑ කාර්යභාරය වන්නේ වේදිකාවල සිදුවන දේවල් දෙස ඇස් අයා බලා සිටින්නන් හට, වේදිකාව පිටුපස සිට ඒ වෙනුවෙන් හෙලන දහඩිය, කඳුලු සහ සුසුමන් වෙත, ප්‍රේක්ෂකයන්ගේ අවධානය යොමු කරලීමයි. එවන් සොඳුරු ප්‍රයත්නයක් ගෙන තිබූ පසුගිය කලාපය සැකසූ ඔබ ඇතුලු ඒ සඳහා වෙහෙස වූ සියල්ලන්ටම, පාඨක අපගේ උත්තමාචාරය මෙසේ පිළිගන්වමු.

**ප්‍රීති ජයසූරිය** - කැපුන්ගොඩ

# මහ සිකුරාදා නිවාඩුව?

**කතුතුමනි,**

මුළු ලොව කිතුනු ජනතාවට ඉතා වැදගත් අවස්ථා දෙකක් ඇත. කිතු උපත සිහිකරන නත්තල් දින සහ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසයේ මරණය සිහිකරන මහ සිකුරාදා දින ඒ උතුම් අවස්ථා දෙකය. නත්තල් දිනට රාජ්‍ය, බැංකු හා වෙළඳ නිවාඩුව ලැබෙන නමුත් මහසිකුරාදා දිනට වෙළඳ නිවාඩුව නැත.

බොහෝ කලක සිටම මෙම නිවාඩුව ලබාගැනීමට උත්සාහ කරන නමුත් තවමත් එය ඉටුවී නැත. මහසිකුරාදා දින මුළු දවස පුරාම කිතුනු බැතිමත්හු ආගමික වතාවත් වල යෙදෙති. රජයේ, බැංකු හැර අනිකුත් ආයතනයන්හි සේවය කරන්නන්හට මෙදින සවස පැවැත්වෙන දේව මෙහෙයටවත් සහභාගිවීමට අපහසුවී ඇත. ඒ නිසා මහ සිකුරාදා දින සැමටම නිවාඩු ලැබෙන පිණිස වෙළෙඳ නිවාඩු දිනයක් කරන මෙන් ලක්වැසි කිතුනු ජනතාව නව රජයෙන් ඉල්ලා සිටිති.

**ඩොරින් පෙරේරා** - මොරටුව

# දූෂිත චරිත කරවට කුරුසියේ ලාංඡනය පළඳවන්නට එපා!

**කතුතුමනි,**

ජනප්‍රිය නවකතාවක් ඇසුරින් මේ දින වල එක්තරා රූපවාහිනී නාළිකාවක සතියේ දින පහේම රාත්‍රියේ විකාශය වන ටෙලිනාට්‍යයක අපරාධකරුවකු, ස්ත්‍රී දූෂකයකු, මිනීමරුවකු, බේබද්දෙකුගේ චරිතයට පණදෙන මෙම නළුවාගේ කරමත එල්ලෙන කුරුසියේ ලාංඡනය දකින/නරඹන ඕනෑම කිතුනු හදවතක් කලකිරීමට ලක්වීම ස්වභාවිකය.

ඒ කුරුසියේ ලාංඡනය කිතුනුවන්ගේ මුදුන් මල්කඩ වන හෙයින්ය. බොහෝ ටෙලිනාට්‍ය/ චිත්‍රපටවල දුෂ්ට/ මිනීමරු චරිත වලට පණදෙන්නන්ගේ නිවෙස්වල පසුබිමේ දිස්වන්නට සලසන්නේ ජේසු තුමන්ගේ/ මරිය මවුන්ගේ හෝ කිසියම් ශාන්තුවරයකුගේ පින්තූරයක් හෝ පිළිමයක් වීමද සැබවින්ම කණගාටුදායකය. ඒ චරිත වල නම්ද කිතුනු නම්ය. මෙම ක්‍රියාවලිය බොහෝවිට නිෂ්පාදක, අධ්‍යක්ෂකවරුන් සිතා මතාම සිදුකරන ක්‍රියාවක් වන්නටද බොහෝ දුරට සැක පහළකළ හැකි අතර, ඇතැම් විට ඔවුන් නොදැනුවත්වම එවැනි ක්‍රියාවන් සිදුවන්නටද ඉඩ ඇත.

ඇතැම් අවස්ථාවලදී අදාල දුෂ්චරිතයට පණදෙන නළුවා නිළිය බැතිමත් කිතුනුවකු විය හැකිය. එසේවුවද අදාල දර්ශන රූපගත කරන අවස්ථාවලදී කුරුසියේ ලකුණ හෝ වෙනත් ආගමික ලාංඡන නොපෙන්වන්නේ නම් එය සෑම ආගමිකයකුගේම සිත් තුළට සහනයක් විය හැකිය. කෙසේ වුවද ටෙලිනාට්‍ය, චිත්‍රපට නිෂ්පාදකවරුන් සහ අධ්‍යක්ෂකවරුන් කිතුනු සිත් සසළ කරවන මෙවන් දර්ශන පිළිබඳව දෙවරක්, තෙවරක් නොව කිහිප වරක්ම සිතන්නේනම් එය එම ටෙලිනාට්‍යය, චිත්‍රපට නරඹන දහස් ගණන් වන කිතුනු බැතිමතුනට සාධාරණයක් විය හැකිය.

**එම්. ජෝ. පාරිස්** - වැලිවිට

# මේ විනාශයේ හේතුව සොයන්නේ කවුද?

**කතුතුමනි,**

ඉතාමත් අවාසනාවන්ත ලෙස, ළදරු සහ තරුණ ජීවිත, අකාලයේ, විනාශ වී යන භයානක තත්ත්වයක් අප දේශය තුළ උදා වී ඇත. මෙය අහඹු හෝ ස්වභාවික සිද්ධියක් ලෙස, නොසලකා හැරිය හැකි නොවේ. රටක් ජාතියක් අවාසනාවන්ත, ලෙස අගාදයට ඇදී යාමට මෙහි යථාර්ථයන් හේතු විය හැකිය. අද මෙම මරණ ක්‍රම තුනකට සිදුවේ. පළමු වැන්න සිය දිවි හානිකර ගැනීම, දෙවැන්න ඝාතනය කිරීම හා හදිසි අනතුරු නිසා ද වේ.

භයානකම තත්ත්වය නම් සිය දිවි හානිකර ගැනීම හා ඝාතන රැල්ල උත්සන්න වී තිබීමය. තරුණ කොටස් ඉතා සුලු කරුණකදී පවා තම ජීවිත විනාශ කර ගැනීමට පෙළඹෙති. එපමණක් නොව නොයෙකුත් අවකල් ක්‍රියා නිසා නාස්තිවන තරුණ ජීවිත කොපමණද? හදිසි අනතුරු ආදියෙන්ද, වැඩිපුර විනාශ වන්නේ තරුණ ජීවිතය. දැනටමත් අප දේශය තුළ අවුරුදු පනහ ඉක්ම වූ වැඩිහිටි පරපුර වර්ධනය වී ඇති බව ප්‍රකාශ කර ඇත. එහෙයින් මෙම තරුණ හා බාල පරපුර විනාශ වීම අප අනාගතයට කෙසේ බලපායි ද?

මෙම කරුණු දෙස බලද්දී එක් කරුණක් ඉස්මතු වී පෙනේ. එනම්, ජනතාව දැඩි මානසික ආතතියකින් පෙළෙන බවය. ජීවත් වීම සඳහා දැඩි අරගලයක් කිරීමට සිදු වී ඇත. ජනමාධ්‍යය තුළින් දැඩි පීඩනයකට ලක්කර ඇත. එකිනෙකා පරයා නැගී සිටීමට යාම නිසා ලජ්ජා, භය, හොඳ, නරක, අමතක කර දමා ඇත. මෙය භයානක තත්ත්වයකි. මෙයට දේශපාලනය සෘජුවම වගකිව යුතුය. තම බලය රැක ගැනීමේ පරම චේතනාවෙන්, හිතාමතාම මෙම තත්ත්වයට පත්කර ඇත. ඊලඟට ආගමික නායකයන් වගකිව යුතුය. ගැඹුරු හරපද්ධතියක් ඇති ප්‍රධාන ආගම් තුනක් අප දේශය තුළ පවතී. බෞද්ධ, කතෝලික හා මුස්ලිම් යන ආගම් වල ඇති යථාර්ථය. ධර්මය, හරියාකාරව ජනතාව තුළට ගියා නම් තම යුතුකම් හරියට ඉටු කළා නම්, අද මෙම පීඩනයට ලක් වී විනාශ වන ජනතාවක් ඉතිරි වන්නේ නැත.

ආගමික, මෙහෙයක් අප රටේ නැති දිනක්, නැති මොහොතක් ඇත්තේ නැති තරම්ය. එහෙත් ඒවල වැඩිහරියක් ඇත්තේ ආගමික සංදර්ශනය. ධර්මය නැත. පාට පාට ලයිට්, තොරන, පෙරහර පුහු සෝෂාව පමණකි. එදා ජනතාව ආගමික නායකයන් නිවිහැනහිල්ලේ, මුණ ගැසී තම ප්‍රශ්න ගැටලු පවසා ඒවාට උපදෙස් ලබාගත්හ. නමුත් අද ඇත්තේ කාර්යාලය. එහි පුද්ගලික ප්‍රශ්න වලට කාලය නැත. අද ජනතාවට තම ප්‍රශ්න ගැටලු කථා කිරීමට තැනක් නැත. කෙනෙක් නැත. ආගමික මෙහෙයන් පවා බොහෝ විට සිදුවන්නේ, ගත පිනවන සංදර්ශන මට්ටමින්ය. ඒවායේද ජනතා ප්‍රශ්න වලට උත්තරයක් නැත. ඒ නිසා ජනතාව තනි වී ඇත. කරන කියන දෙයක් නොදැන අතර මං වී ඇත. එවිට ඔවුන් ගන්නා තීරණ භයානකය. ඒ නිසා අප කතෝලිකයන් වශයෙන්වත් මෙතනට අවදි විය යුතුය. වෙහෙස වන බර උසුලන අපට සහනයක් දිය යුතුය.

**කේ. ඒ. ඩී. හියුබට්**
මඩම්පැල්ල

# බිම ඇණ තියාගෙන සමිඳුන් වැඳීම අශෝභනයි

**කතුතුමනි,**

දිවයින පුරා ස්ථාපිත කර ඇති අපේ දෙව්මැඳුරු තුළ පවත් වන්නට යෙදෙන දිව්‍ය යාගයන් තුළදී සහ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කරන අවස්ථාවලදී පූපාකාරයෙන් ජීවමානව වැඩ ඉන්න ජේසු සමිඳුන්ට ගෞරව කිරීම සහ වන්දනා කිරීම උන්වහන්සේට ප්‍රසන්න ලෙස සිදුකළ යුතුය.

එහෙත් ඒ අවස්ථාවන් තුළ පූපාකාරයෙන් ජීවමානව උන්වහන්සේ අප අතර වැඩ ඉන්නා බවට බොහොමයක් කිතුනුවන් තුළ ගැඹුරු විශ්වාසයක් නොමැති බවක්, උන්වහන්සේට වන්දනා කරන ඉරියව් තුළින් අපට දැකගත හැකිය. පූපය ස්වාමීන් වහන්සේගේ ශ්‍රී ශරීරයටත්, මිදි රස උන්වහන්සේගේ ශ්‍රී රුධිරයටත් හැරෙවෙද්දී සැබවින්ම එය එසේ සිදුවෙතැයි අප අදහමුනම්. දෙව් මැඳුරු පරිශ්‍රය තුළ ඕනම තැනකදී වුව බිම දණහොවා, අපහසුකම් මැඩගෙන උන්වහන්සේට වන්දනා කළ යුතුය. දෙව්මැඳුරු තුළ බිම දණ හොවා සමිඳු වැඳීම පහසු වූවත් සමහරු මැඳුරෙන් පිට රළු පොලොවේ දණගසා සමිඳුන්ට ගෞරවකරති. තවත් කොටසක් බැරිකම නිසාම සහ බිම දණ ගැසීමෙන් දැනෙන අපහසුව විඳ දරාගන්ට අකමැති නිසාම, තමන් පැළැඳි පාවහන් මත දණගසති. ඇත්තෙන්ම එය වන්දනාවක් නොව, සමිඳුන් රැවටීමකි. තවත් කොටසක් බිම ඇණතියාගෙන හද තුළවත්, ගත තුළවත් නැති, භක්තියක් ආරූඪ කරගෙන සමිඳුන් දකින්න උත්සහ කරති. එය ඉතා පහත්ම වන්දනා ක්‍රමයකි.

සමිඳු වන්දනාව තුළදී ගතට පහසු ලෙස පාවහන් මත දණ නොගසා සහ දකින්ටත් හිරිකිත බිම ඇණතියාගෙන කරන වන්දනාවට වඩා හුන්තැන හිටගෙන උන්වහන්සේට වන්දනා කිරීම යෝග්‍ය බව කියනු කැමැත්තෙමු.

**පී. වී. ඩී. ලුවි මයිකල්**
කපුවාගාර



## නිර්මාණශීලී කිතුනු දනවි

## කලා සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

ඇන්තනි ජයලත් - රාගම

# නොමළවුන්ගේ දානය

**රූප පෙට්ටිය නරඹමින් සිටි තම දුවනිය රූපිකා අසලම වාඩිවී සිටි ඇගේ මව මැගිලිනා මොහොතකින් දිගු සුසුමක් ඉහළට රඳවමින් නොවැම්බරයත් එහෙම නම් ලැබුවා' යි පැවසුයේ රූපිකාට ඇසෙන්නටය.**

'ඒ කියන්නෙ නත්තලට කිට්ටුයි කියලනේ' රූපිකා තම මව දෙස බැලුවේ තරමක උපහාසාත්මක සිනාවක් මුවග රඳවමිනි.

'මම කිව්වෙ නත්තලක් ගැන නෙමි' මැගිලිනා පිළිතුරු දුන්නේ තරමක තරහකිනි.

'දුවේ නරකද මෙදා මළවුන්ට දානයක් දුන්නොත්....'

'දානෙ කියන්නේ නරක දෙයක් නෙමි. කොහෙද ඉතින් සල්ලි පොදි ගහ ගන්නව මිසක් මිනිහෙක්ගෙ බඩගින්නක් දුකක් අම්මලට තේරෙන එකක් ය..'

මවගේ කථාව ඉවර කරන්නටත් පෙර රූපිකා දුන් පිළිතුරින් අන්ද මන්ද වූ ඈ තම ස්වාමි පුරුෂයාගේ මරණින් පසු මේ වන විට ගෙදර මළවුන් සඳහා දානයක් නොදුන් බව මෙනෙහි කළාය.

'දානෙ දුන්නය, නොදුන්නය කියල මැරුනු අය ආයෙ එන්නෙ නැහැ. ඒකට තමයි යාච්ඤාවන් තියෙන්නේ.'

'අම්ම කවදාද අම්මෙ යාච්ඤාවක් කළේ. පල්ලි ගියේ.'

කිසිවක් නොකියාම මැගිලිනා ඉදිරියට ගියේ තම වැඩිමල් දියණියට ගෙට ඇතුලු වන්නට දොර විවර කරන්නටය.

'ඔන්න අම්මෙ, මම හෙට ගෙදර එන්න පරක්කු වේවි.'

අත් බෑගය අසල පුටුවකට විසි කළ මේනකා කියාගෙන ගියාය.

'හෙට වරුවනේ. ඇයි පරක්කු වෙන්නෙ.'

'ඔෆිස් එකේ යාලුවෙකුගෙ ගෙදර දානයක් යන්නම වෙනව.'

'දානෙ කන්න යන්න උඹල හිඟන්නොද. මෙන්න මෙහෙ පව් නොදී හිටපන්.'

ඇය තවත් කථා කරන්නට නොගියේ තම මවගේ හැටි දන්නා නිසාය. රූපිකාද නිහඬව සිටියාය. මේනකාද හාන්සි පුටුවට බර දුන්නේ රූපිකා සමග රූප පෙට්ටියට සම්මාදම් වන්නටය.

'ලොකු දුවේ..... මට ටිකක් කථා කරන්න ඕනේ.' මැගිලිනා තලු හපද්දි මේනකා කටහඬ අවදිකළාය.

'අනේ අම්මෙ, මට ටිකක් නිදහසේ ඉන්න දෙන්න...'

'නැහැ අක්කෙ අම්ම කියන්න යන්නෙ වෙන කථාවක්.'

රූපිකා සිනා සෙමින් කියද්දි මැගිලිනා දුවනියන් දෙදෙනා අසලට මඳක් කිට්ටු උනාය.

'අක්කෙ අම්මට පිනක් දහමක් කර ගන්න හිතිලනේ..'

'අර මක්කෙයි.'

මැගිලිනා ඇගෙ අදහස දුවනියන් දෙදෙනාට විස්තර කළාය.

'තාත්තව මම දවස් දෙක තුනක්ම දැක්ක.'

තාත්තා මැරිල අවුරුදු ගානක් වෙනව අම්ම තාත්ත වෙනුවෙන් මොනවද කළේ. හිඟන්නෙකුට කීයක් හරි දෙන එකනේ.

අක්ක නගෝ දෙදෙනාම හිනා වෙද්දි මැගිලිනා අහක බලා ගත්තාය.

'ඒක නෙමේ දැන් ඔය දෙන්න යන්නෙ මොනවාගෙ දානයක්ද?'

'අමුවෙන්ද, උයලද අනාථ නිවාසෙකටද.'

'මුලු ගමටම, ගෙදරට ගෙනල්ල කන්න දෙන්න ඕනි.'

'ඒක හොඳ අදහසක් අනික අම්මට බැරිය ගමටම අවුරුද්දක් උනත් කන්න දෙන්න.'

අක්කාගෙ කථාව නංගිද අනුමත කළාය.

'අක්කෙ අපි කොලේකට නම් ලැයිස්තුවක් ගමුද.'

'ඒක හොඳ අදහසක්.'

මැගිලිනාද එය අනුමත කළාය.

'අපි පටන් ගමු හේරත් හාමිලගෙ ගෙදරින්. උන් ඉතින් කවදත් අපිට ඔලුව නමන මිනිස්සුනෙ.'

'ඇයි අම්මෙ ඊට ඉස්සර අපේ වලව්ව ඉස්සරහම තියෙන පැල්පත් ටික.

'උන්ව වාඩි කරවන්න පුලුවන්ද අපේ වලව්වල.'

'ඇයි අම්මෙ උන් මිනිස්සු නෙමිද.'

'මමත් අහන්නයි හිටියෙ.'

අක්කා නගෝ දෙදෙනා මුහුණට මුහුණ බලාගෙනය.

'අහල පහල උන් අපේ පරම හතුරෝ. ඒ නිසාම තමයි උන්ට ඔහොම හෙන හත වැදිලා තියෙන්නෙ ?.'

'එහෙම නම් අපි සෙල්ලයියගෙ ගෙදරින් පටන් ගමු.'

'ජාතියෙන් පිට දෙමළ හැතිකරේව මේ වලව්වට ගෙන්න ගන්න.'

රූපිකා මේනකාද සමගින් ගෙතුළට වැදුනාය.

මැගිලිනා එහා මෙහා ඇවිදිමින් කල්පනා කළාය.

උදේ පාන්දරම පටන් ගත් චිරි චිරි පොදවැස්ස තාම පායා නොතිබුනා පමණක් නොව ඇදිරි වැටී ගෙන එද්දි කුණාටු ගතියද වැඩි වෙමින් පැවතිනි. වත්ත වටේට වවා ඇති රුස්ස නාගස් මෙන්ම අඹ ගස් පොල් ගස් ද එකිනෙකට තුරුලු වෙමින් නගන හෝ හඬ බියකුරු ජනකය.

වෙනදාට වඩා කලින් මැගිලිනා තම දුවනියන්ද කැටුව දොර ජනෙල් වසා නින්දට ගියේ අධික ශීතල හා දැඩි සුළඟත් තද වැසි ගතියත් නිසාය.

කිසියම් තනි කමක් පාලුවක් දැනුනු නිසාදෝ නිදි යහනේ ඒ මේ අත පෙරලුනු මැගිලිනා විදුලි කොටන වේගයත් අකුණු වදින මහා ගිගුරුම් හඬත් නිසා දුවනියන් දෙදෙනාගේ කාමරය වෙත ගොස් ඔවුන් සමග නිදන්නට වූවාය.

අකුණු කීපයක්ම ගේ අසලටම පාත් වුනා සේ දැනුනු නිසා ඇයට දැනුනේ මහත් බියකි. මොහොතකින් විදුලියද විසන්ධි වී ගිය තැන සාලය වෙත පිය නැගූ ඈ සුරුවම් කුඩුව අසල එල්ලා තිබූ ජපමාලය අතට ගත්තා පමණි.

'දඩ දඩාස්' හඬක් නගමින් තමාගේ කාමරයේ වහල මතට ඇද වැටෙන්නට වූ විශාල ගසක් වැනි දෙයක් නිසා ඈ තුෂ්නිම්භූත වූවාය. තිගැස්සී ඇහැරුනු දුවනියන් දෙදෙනාද බිය පත්ව අම්මා සොයා සාලයට එද්දි අඩ අඳුරෙම ඈ දුර කථනය අසලට යනවා දැක බියපත් වූවාය.

'අම්මට පිස්සුද?.. හොඳටම ගොරවනවා විදුලි කොටනවා.'

නිසැකවම අම්මා මේ උත්සාහ ගන්නේ මාමාට දුරකතන ඇමතුමක්දී සිද්ධිය සැලකිරීමට බව මේනකා මෙන්ම රූපිකාටද සිතුනි.

ගේට්ටුව දෙසින් ඇසෙන්නට වූ තොර තෝංචියක් නැති කට හඬ සමග දිස්වන්නට වූ විදුලි පන්දම් එළි ඝන අඳුරේ නිවස තුළ සිටි මැගිලිනා ජනෙල් වීදුරු අතරින් දුටුවාය. දුවනියන් දෙදෙනාද මුහුණට මුහුණලා බලාගත් වනම සිටියදී දොරට ගසන ශබ්දයක්....

'නෝනා දොර අරින්න නෝනා දොර අරින්න.' යන හඬක් නිසා මොහොතකට ගල් ගැසුනු ඔවුනොවුන් ජනේලයක් විවර කර ගේට්ටුව දෙස බැලුවෝය.

ඒ වන විටද පිරිසක් ජනේලය අබියසය. මේ මහා අනෝරා වැස්සෙ තෙමී තෙමී විදුලි පන්දම් හා පිහියා අතැතිව ඔවුන් මේ ඇවිත් සිටින්නේ තම වහලය මතට ඇද වැටී ඇති ගස කපා ඉවත් කරන්නට පමණක් නොව තම පවුලට අකර තැබ්බයක් වූවා දැයි සොයා බැලීමටම බව මැගිලිනාට මෙන්ම දුවනියනටද අවබෝධ වන්නට වැඩි වේලාවක් ගත වූයේ නැත.

මැගිලිනා ඉදිරියට ගොස් කථාවක් නැතිවම දොර විවර කළාය. දුවනියන් දෙදෙනාද ඈ පසු පසය.

පුදමයකි. ඒ අන්දිරිස්ය. සෙල්ලයියාය. මොහොතකට පෙර තමා විසින්ම ප්‍රතික්ෂේප කළ දෙමළ සෙල්ලයියා පමණක් නොව පරම හතුරන් ලෙස හංවඩු ගැසූ අසල් වාසින්ය.

තද සුළඟත් අනෝරා වැස්සත් මැද වහලට වැටී තිබූ ගසට වැදුනේ එක පිහි පාරක් පමණි. විසන්ධි වී තිබූ විදුලිය එළිය විහිදුවමින් පරිසරයම ඒකාලෝක වෙද්දි ඔවුනොවුන්ගේ මුහුණුමත බැබලුනේ තවත් අලුත් දවසකට ඉර පායා එක්සිත්වූ පවුලක අගය කියාපාමිනි.

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 291

# හෝසන්නා ක්‍රිස්තු රජාණනි

ඔක්තෝබර් අන්තිම ඉරිදා ක්‍රිස්තු රජාණන්ගේ මංගල්ලය ස්ථාපනය වුණේ 1925 දීය. ගොක් බෙන්සාරුව 9 වන සියවසේ පටන් ගත්තකි. දුඃඛෝත්සවයේ Passiontide දෙවන ඉරිදා එතැන් පටන් ගොක් ඉරිදා විය. නියම ක්‍රිස්තු රාජ මංගල්ලය ගොක් ඉරිදා බව එදින වත්පිළිවෙත් වලින් පැහැදිලිය. Rex Regum රාජාතිරාජයාණෝ (එළිද 19:16) විජයශ්‍රීයෙන් ප්‍රවිෂ්ටවන්නෝ සුවිශේෂවල සඳහන් විනාශමුඛයට සමීපස්ථවූ ජෙරුසලෙමට නොව ස්වකීය රාජධානිය (අගනුවර) වූ එළිදරව්වේ 21 හි දර්ශනය වන ජෙරුසලෙමටය. මෙලොවින් සුරලොවටය. මරණයෙන් ජීවනයටය.

ගොක් පෙරහැරේදී දැන් ගැයෙන්නේ ක්‍රිස්තුරජාණන්ට ස්තෝත්‍ර වේවා ගීතිකාවයි. කලින් ගැයුණේ Gloria Laus (මහිමය ප්‍රශංසාව) නම් ලතින් ගීතිකාවයි. ලතින් බසින් රජුට කියන Rex වචනය මෙහි හතර වරක් දැකිය හැකිය. මෙහි අගනා පරිවර්තනයක් ස්වර්ගස්ථ වූ ගරු සෙබස්තියන් ප්‍රනාන්දු නි.ම.නි පියතුමන්ගේ පූජාපොතේ (1932) ඇතුළත්ය. එය පැරණි කිවිබසින් පැදි අටකින් සමන්විතය. පෙර කවිවල නිතර පෙනෙන අමා, නිබඳ, මනනඳ, නොමින් ආදි වදන් එහි දිස්වේ. මේ පූජා පොතේ 1956 මුද්‍රණයට පෙර වදනක් ලියමින් ස්වර්ගස්ථ වූ අති උතුම් තෝමස් කුරේ අගරදගුරු තුමෝ පරිවර්තක පියතුමන්ගේ උගත්කමත් උනන්දුවත් ඉවසීමෙන් විඳි වෙහෙස මහන්සියත් අගයමින් ශුද්ධ වූ ග්‍රන්ථයට ආශිර්වාද කරති.

දෙව් සමිඳුන් නාමෙ නි
වඩින මහරු උතුමෙ නි
ආසි ලත් රජිඳු නි
තුති වේවා නිබඳි නි

ඉඳි අතු ගත් අත් ඇ ති
හෙබ්රෙව් දන යුත් බැති
ඔබ හමුවීමට රූ ති
අවුත් පැවසු ගී තු ති

## විය සරණිය




ප්‍රධාන සංස්කාරක - ඇල්ප්‍රඩ් ජයමාන්න

කැපුන්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සංගමය 'විය සරණිය' සඟරාවේ මංගල කලාපය එළිදැක්විය. ග්‍රාමීය වැඩිහිටි සංගමයේ සාමාජික සාමාජිකාවන්ගේ වර්ණ ඡායාරූපයක් සමග ලිපි, කවි, විශේෂාංග රැසක් පළවී ඇත. විජේරත්න වරකාගොඩගේ හරවත් ලිපියක්ද ඇත. වියසරණියට අපේ සුබ පැතුම්!

**බෙන්ජමින් කිරිහෙට්ටි**

පසුගියදා බස්නාහිර පලාත් සභාවේ සමාජසේවා අංශය විසින් පැවැත්වූ අප්‍රකට ජනකථා, අත් බෙහෙත් හා සූපශාස්ත්‍ර මාතෘකා යටතේ වූ අනාගත බාල පරපුර දැණුවත් කිරීම සඳහා වූ දිස්ත්‍රික් මට්ටමේ තරගයේදී වත්තල වැඩිහිටි බල මණ්ඩලයේ ගරු සභාපති විශ්‍රාමලත් විදුහල්පති බෝපිටිය ශුද්ධ වූ නිකොලා මුනිඳුන්ගේ මීසමේ ආරම්භක දහම් ගුරු සාම විනිසුරු ඇන්ටනි බී. ජයමහ මහතා විසින් අප්‍රකට ජනකථා වෙනුවෙන් ප්‍රබන්ධනය කරන ලද 'අතීත කථා' කෘතියට ප්‍රථම ස්ථානය හිමිවිය.



වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලේකම් අනුෂා ගෝකුල මහත්මිය, පලාත් සභා ඇමති උපාලි කොඩිකාර මහතා ප්‍රමුඛ විශාල ප්‍රභූ පිරිසක් කොළඹ සෞන්දර්ය විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරයේ පැවති මෙම උත්සවයට සහභාගි වූහ.

**එස්. කේ. ජේ. කුරේරා**




## ස්තූති කිරීමක්

පාප් වහන්සේ ලක් දෙරණට පැමිණීම නිමිත්තෙන් පාප්රුව හා ජුසේ වාස් මුනිඳුන්ගේ රුව ඇතුලත් ඡායාරූප ඉතා විශාල සංඛ්‍යාවක් පැලියගොඩ සිට මහබාගේ දක්වා ජනතාව අතර බෙදා දුන් කැලණියේ පදිංචි රසික පතිරණ මහතාට අපගේ හෘදයාංගම ස්තූතිය හා ජේසු පිහිට ප්‍රාර්ථනා කරමු.



තලංගම මීසමේ ඉදිකිරීමට යෝජිත නව මීසම් ගෘහයට ආධාර පිණිස සංගීත සැඳෑවක් පසුගියදා පැවැත්විනි. මීසමේ දහම් පාසලේ දෙමව්පිය කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා මීසමේ අනෙකුත් සමිති සමාගම් වලින්ද විශේෂ සහයෝග යක් ලැබිනි. මෙම සංගීත සැඳෑව සඳහා මීසමේ ජනතාවද විශාල පිරිසක් සහභාගි වූහ. සංගීත සැඳෑවේ ආරම්භය සනිටුහන් කරමින් මීසම් සේවක ගරු සංජීව මෙන්ඩිස් පියතුමන් දෙවිඳු යැදීමෙන් අනතුරුව සංගීත සැඳෑව ආරම්භ කැරිනි.

**ධනුෂ්ක ඇන්ජලෝ**

# දේව වචනය මගින් හදවත් වෙනස් කරනු ලබයි



ප්‍රැන්සිස් සසුන් පිය විසින් පෙබරවාරි මස 01 වෙනිදා, සිය තිරින්දාරි ඇමැතුමේදී, ශු. මාර්ක් තුමාගේ සුවිශේෂයේ 1:21-28 වදන් හී පිහිටා අවධාරණය කරනු ලැබුවේ, මිනිස් හදවත් වෙනස් කිරීමේ හැකියාව දේව වචනය සතු බවයි.

එතුමා මෙලෙස ද ප්‍රකාශ කළ සේක. 'ජේසු තුමාගේ වචනයේ බලයෙන් යක්ෂයන් වැසී සිටි අය නිදහස් කළ ආකාරය අපි හොඳින් දනිමු. දේව වචනයේ බලයෙන් අපි බොහෝවිට මවිතයට පත් වෙමු.' එතුමා තවදුරටත් මෙලෙසින් ද ප්‍රකාශ කර ඇති අයුරු අපි අත්දැකීමෙන්මැ දනිමු. 'දේව වචනය ජීවිත බලයයි; එම වදන් ජනතාවන් පීඩනයට ලක් නොකරයි; දේව වචනය විසින් යක්ෂ බන්ධන මුදල් සඳහා කෑදරකමද ආත්මාර්ථය ද අප නිදහස් කරනු ලබයි. එමනිසාවෙන් දේව වචනයේ මිදීමේ බලයෙන්, ලොවැ පතුරුවාලීම සියලු කිතුනුවන්ගේ කැඳවීම වේ.

එතුමා අප සැමට දී ඇති දේව වාක්‍ය පිළිබඳ අවවාදයන් ජීවිත සාර්ථක කර ගැන්මට උපයෝගි කරගත යුතුය. එම නිසා දිනපතා දේව වචනය කියවන්න; එම වදන් මෙනෙහි කිරීමට කාලය යොදා ගන්න; දේව වචනය ඔබ යන්නේ කොතැන ද, ඔබේ සන්තකයේ තිබිය යුතුය, දේව වචනය තුළින් අපේ ජීවිත වෙනස් වනු ඇත. එමෙන්මැ එමඟින් හදවත් ද වෙනස් කරනු ඇත.

## ඉස්ලාම් රාජ්‍යය සිරියාවේ දෙව් මැඳුරු වලැ කුරුස ඉවත් කරන්නැයි බල කරති

පෙබරවාරි මස 04 වෙනිදා, සිරියාවේ ටෙල් හෝර්මිෂ්ඩ් නම් නගරය වටලා, නගර පාලනය තමන් අතට ගෙන ඇත. ඔවුන්ගේ ප්‍රථම ක්‍රියාව වී ඇත්තේ, එම නගරයේ ඇති දෙව් මැඳුරු තුළට කඩා වැදී, කුරුස ඉවත් කරන්නැයි බල කිරීම වේ.

එසේ නොකළහොත් එම නගරයේ වෙසෙනා කිතුනුවන් මරා දමනා බැව් ද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලැබේ. තවද නගරයේ ජීවත් වන්නට කැමැත්තේ නම් ඔවුන් විසින් නියම කැරෙන විශාල බදු ප්‍රමාණයන් ගෙවිය යුතු බවය. එසේ නොකළහොත් ඔවුන් නගරය අතහැර යා යුතු බවය. එසේ නොවුනහොත් ඔවුන් මරණයට පත් කැරෙනා බැව් ද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලබයි.

මෙම දෙව් මැඳුරට සැතැපුම් කීපයක් ඈතින් පිහිටි දෙව් මැඳුරත් තම බලයට පවරාගෙන එහි තුබූ කුරුස විනාශ කොට තිබිණි. නමුත් දින කීපයකට ඉහතදී, ඒකරාශී වූ කිතුනු කණ්ඩායමද, දෙව් මැඳුරු ආපසු සියතට ගෙන ඉවත් කර තුබූ කුරුස වෙනුවට නව කුරුස ද යොදවා ඇත. මෙයාකාරයෙන් සිරියාවේ ද කිතුනුවෝ දැන් දැන් සටන් කර හෝ සිය ඇදැහිල්ල රැක ගැන්මට යත්න දරති.

## මැක්ෂිකෝවේ පූජක වරයෙක් ඝාතනය කැරේ

නත්තල් දිනැ මැක්ෂිකෝවේ ග්‍රේගෝරියෝ ලොපේෂ් ගොරොස්ට්ටා පැහැර ගෙන ගොස් ඝාතනය කර තිබිණි. බෙල්ල හිර කිරීමෙන් එතුමා මරා දමා ඇතැයි, 'ෆොක්ස්' පුවත් පත් සේවය විසින් වාර්තා කොට ඇත.

2014 වර්ෂයේදී, මෙම පූජක තුමා ඇතුළු පූජක වරුන් 4 දෙනෙක් ඝාතනය කරනු ලැබ ඇතැයි ද වාර්තා වේ. ගරු මැක්ෂිමෝ මාර්ටිනස් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, තවත් පූජක වරයෙක් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ජීවිතය පූජා කොට ඇති බවයි. තවද මෙයාකාරයේ පූජක ඝාතන සිදුවිය හැකි යයි ද රදගුරු තුමා මාධ්‍ය වෙත ප්‍රකාශ කළ සේක.

## අගරදගුරු රොමේරෝ ප්‍රාණ පරිත්‍යාගිවරයෙකු ලෙසින් පිළිගැනේ



පෙබරවාරි මස 03 වෙනිදා, ශුද්ධාසනය විසින් අගරදගුරු රෝමේරෝ තුමාගේ ප්‍රාණ පරිත්‍යාගී භාවය පිළිගනු ලැබීමෙන්, එතුමා භාග්‍යවරයට එසවීමේ ක්‍රියාමාර්ග දැන් ආරම්භ වනු ඇත.

එදිනැ, ප්‍රැන්සිස් සසුන් පියා විසින්, රොමේරෝ රදගුරු තුමාගේ ද, වෙනත් පූජකවරුන් දෙදෙනෙකුගේ ද, ප්‍රාණ පරිත්‍යාගි භාවය ලොවටැ ප්‍රකාශ කරමින්. එලෙස එතුමන්ලා භාග්‍ය වරයට එසවීමේ කාර්ය භාර සංසදය වෙතැ පවරනු ලැබීය.

අනෙක් ප්‍රාණ පරිත්‍යාග වරුන් වන්නේ, පෝලන්තයේ ඇදැහිල්ල හේතු කොට ගෙන. වර්ෂ 1960 දී මරා දැමූ මයිකල් තොමාෂෙන් ද වර්ෂ 1958 දී මරා දැමූ ෂිබ්ග්නි ස්ට්‍රාෂාකොව්යි ද, 1991 දී, පේරු හි ඝාතනය කරනු ලැබූ අලෙස්සන්ඩ්‍රෝ ඩොරේඩි ද වේ.

වර්ෂ 1980 වර්ෂයේදී, එල් සල්වදෝර් හි යුධ අගරදගුරු රෝමේරෝ තුමා ද මරා දමනු ලැබීය. එතුමාගේ මරණය අළලා මතභේදයන් ද පැවැතිණි. ඒ මන්දයත්. යම් කොට්ඨාශයන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, එතුමාගේ ඝාතනය කතෝලික ඇදැහිල්ල නිසා සිදු වූ බවයි. තවත් පිරිසක් විසින් දක්වනු ලැබුවේ, එතුමාගේ දේශපාලනික සම්බන්ධතා නිසා ඝාතනය සිදුවී ඇති බවයි. එහෙත් තර්ක විතර්ක හමුවේ, බෙනඩික්ට් සසුන් පියාණන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, අගරදගුරු රොමේරෝ තුමාගේ ඝාතනය කිසිදු සැකයකින් තොරව, කතෝලික ඇදැහිලි විරෝධි පිරිසක් විසින් සිදු කළ බවයි.

ප්‍රැන්සිස් සසුන් පියා විසින් එම ඝාතනය පිළිගනු ලැබීමෙන්, රොමේරෝ රදගුරු තුමන් ප්‍රාණ පරිත්‍යාගි වරයකු ලෙසට භාග්‍ය වරයට එසවීමේ කාර්යය දැන් ආරම්භ වී ඇත.

## ටියුරින් හී ශ්‍රී සළුව පිදුමට 600,000 දෙනා ලියාපදිංචි වෙති



ටියුරින් හී ශ්‍රී සළුව, මහජන ගෞරවය සඳහා මේ වසරේ අප්‍රේල් මාසයේදී පාත්‍ර කරනු ලබන අතර, එම ශ්‍රී සළුව පුද කැරුමට දැනටමත් 600.000 ක ජනතාවක් ලියාපදිංචි වී ඇතැයි කතෝලික පුවත් වාර්තා කරයි.

ටියුරින් හී සැමට අප්‍රේල් 19 සිට 29 දක්වා, ටියුරින් හී ආසන දෙව් මැඳුරේ මහජන ගෞරවය සඳහා ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම ශ්‍රී සළුව මෙලෙස මහජන ගෞරවයට පාත්‍ර කිරීම, සාන්තුවර ජෝන් බොස්කෝ තුමාගේ 200 වැනි උපන් සංවත්සරය හා සමගාමි වේ. ප්‍රදර්ශන භූමි භාගයට ඇතුළුවීම සඳහා. කිසිදු අය කිරීමක් සිදු නොකැරෙන අතර, සියලුදෙනා හට අවස්ථාව සැළසෙනු සඳහා ලියාපදිංචි වීම නොපමාව සිදු කරනා ලෙස ඉල්ලා සිටිති.

ප්‍රැන්සිස් සසුන් පියා, ශ්‍රී සළුව ප්‍රදර්ශනය කිරීමේ අවසාන දිනැ, එහි සම්ප්‍රාප්ත වේ යයි ද අපේක්ෂා කරනු ලැබේ. මෙම අවස්ථාවට පෙර, වර්ෂ 2010 දී ද, ශ්‍රී සළුව මහජන ගෞරවය සඳහා ප්‍රදර්ශනය කරැත.

## ගුවන් නියමුවාගේ ඝාතනයෙන් මුස්ලිම් නායකයෝ කෝපාවිෂ්ට වෙති



පෙබරවාරි මස 04 වෙනිදා, ජෝර්දාන ගුවන් නියමුවා, ඉස්ලාම් රාජ්‍ය ත්‍රස්තයන් විසින් පණ පිටින් පුළුස්සා මරා දැමීමෙන් පසුව ලෝ පුරා වෙසෙනා ඉස්ලාම් නායකයෝ, 'ඉස්ලාම් රාජ්‍ය' න්‍යාය දැඩි ලෙස හෙලා දකින්නට පටන්ගෙන ඇත. ඉස්ලාම් රාජ්‍ය විරෝධි කියුම් පවා නිකුත් කිරීමට පටන්ගෙන ඇත.

මෙම තත්ත්වය පිළිබඳ, ඊජිප්තුවේ අල් හෂාන් විශ්ව විද්‍යාලයේ අධිපති මෙලෙසින් ද ප්‍රකාශ කළේය. ගුවන් නියමුවා වැනි අහිංසක ජනතාවන් ඝාතනය කරනු ලබන ඉස්ලාම් රාජ්‍ය ත්‍රස්තයන්, කුරුස ගසේ එල්ලා මරා, සිරුර කොටස් වලට වෙන් කළ යුතුය. මෙම දඬුවම එලෙසින්මැ, අසරණයන් මරා දමනා අයද පාත්‍ර කළ යුතු යයි ද කුරාන් හී දක්වා ඇත.

සවුදි අරාබි රාජ්‍ය විසින් ද ප්‍රකාශයක් නිකුත් කර ඇත්තේ, ඉස්ලාම් රාජ්‍ය සංකල්පය, ඉස්ලාම් දහමේ සතුරන් යයි ද දැක්වීමෙනි. කතෝලික පුවත් විසින් දක්වා ඇති පරිදි, එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍ය විසින් ද අවධාරණය කරනු ලැබ ඇත්තේ, ඉස්ලාම් රාජ්‍ය ක්‍රියාදාමය වහා තුරන් කිරීමට කටයුතු කළ යුතු බවයි.

## ලක්ෂම්බර්ග් හි කතෝලික දහම උගැන්වීම තහනම් කැරේ



ඓතිහාසික කතෝලික දේශයක් වන ලක්ෂම්බර්ග් හි රාජ්‍ය පාසල් වලැ කතෝලික දහම හෝ වෙනත් ඕනෑම දහමක් උගැන්වීම තහනම් කරැත. ආගම දහම උගැන්වීම වෙනුවට, සාරධර්ම උගැන්වීමේ අධ්‍යාපනික ක්‍රියාදාමයක් ආරම්භ කරැත. වර්තමානයේදී කතෝලික පියතුමන්ට, රජයෙන් වැටුප් ගෙවනු ලැබුවත්, ඉදිරියේදී එසේ නොගෙවනු ඇතැයි ද නීති පනවා ඇත. මෙම තත්ත්වය යටතේ ලක්ෂම්බර්ග් හී අගරදගුරු හිමිපාණන් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, ප්‍රංශ රාජ්‍ය මෙන්, ලක්ෂම්බර්ග් දේශය ද ඇදී යන බවය. මෙම තත්ත්වය නිසාවෙන් ලක්ෂම්බර්ග් දේශයේ ඇදැහිල්ලේ පිහිටා සිටිනා කතෝලිකයෝ මහත් වේදනාවට පත්ව සිටිති.

වර්තමාන පුවත් ප්‍රකාර මෙම දේශයේ මුළු ජනගහණය 5,40,000 කි. ඉන් 77% ක් කතෝලිකයෝය.

බැසිල් ෆොන්සේකා

## විශේෂාංග



ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

# දයා සේවාවේ ප්‍රබල වූ ප්‍රතිලාභය දෙවිඳුන්ගෙන් ලැබෙන වරප්‍රසාද සහනයයි

2014 දෙසැ. 14 වෙනි ඉරුදින "වින්සෙන්ති පාවුලා සාමාජිකයින්ට සහන අහිමිද?" යන ශීර්ෂය යටතේ ලියා තිබුණු ලිපිය සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් කිරීමේ අරමුණෙන් ප්‍රදීප පුවත්පතට ලිවීමට අදහස් කළෙමි. නාවලපිටියේ මිකී ප්‍රනාන්දු මහතාට ඇති වූ ප්‍රශ්නය එක ලෙස ඉදිරිපත් කිරීම ගැන ස්තූතිවන්ත වෙමි. එහෙත් එම තේරුම් ගැනීම හා ලිවීම සමස්ත දයා සේවාවේ කටයුතු හා එහි දර්ශන වැරදි අර්ථකථනයකින් හුවා දැක්වීම තුළ සාමාන්‍ය කතෝලික ජනතාව තුළ සමහර විට වැරදි අවබෝධයක් ලබා ගැනීමට තුඩු දෙයි. එම ප්‍රශ්නයට කෙටිම පිළිතුර නම් වින්සෙන්ති පාවුලා සමිති සාමාජිකයින්ට ඇත්තෙන්ම මහත් වූ සහනයක් සතුටක් හිමියි. එය එදිනෙදා ජීවිතයේ දී ලෞකික ප්‍රතිලාභ ලබා ගැනීමට වඩා ආධ්‍යාත්මික හා මානසිකව ලැබෙන සහනයයි. ප්‍රතිඵලයයි.

සාන්ත වින්සෙන්ති පාවුලා සමිතියේ සාමාජිකත්වය ලැබීම සමූපකාර සමිතියක හෝ වෙනත් සමිතියක සාමාජිකත්වය ලැබීමට සමාන දෙයක් නොව, දේව ආදරය තුළ, ශ්‍රමය, කාලය තමන්ගේ උවමනාවන් පවා කැපකර ජේසුගේ දයාවට සාක්ෂි දරන කැඳවීමකි. ප්‍රතිලාභ ලබන සමිතියක් නොව දේව විශ්වාසය තුළ අන් අය සඳහා වැය වන සමිතියකි. සිදුවූවා යැයි කියන සිද්ධීන් කීපයක් ගෙන හැර දක්වමින් සාන්ත වින්සෙන්ති පාවුලා සමිතියේ සමස්ත දයා සේවාව පිළිබඳ වැරදි වැටහීමකින් බාධා ඇති වීම සිදුවිය හැකිය. වින්සෙන්ති පාවුලා සමිතියේ සාමාජිකයින් පමණක් නොව මූලික වශයෙන් සෑම කිතුනුවෙක් ම තම සංඝයේ ජාති, කුල ආගම් භේද නොතකා අවශ්‍යතාව පමණක් සොයා ක්ෂණිකවම ක්‍රියා කිරීම, ඒ සඳහා තම කතෝලික සංඝයේ උපකාර ද ලබා ගැනීමද කිතුනු සෑම දෙනාගේම යුතුකම වන්නේ ය. ඉහත සඳහන් සිද්ධීන් තුළ පීඩාවට පත් වී ඇත්තේ තම සංඝයේම සොයුරු සොයුරියන් නම් වගකීම දැරිය යුත්තේ එම කතෝලික සංඝයයි. එම වින්සෙන්ති පාවුලා සමිතියයි.

එකම සභාවක් තුළ එකම කතෝලික සංඝයක් තුළ වැඩ කිරීමට යෑමේදී අපිට ආත්මික හා විශ්වාසවන්තම ගුරු උපදේශයක් ලබා ගත හැකි මඟ ශාන්ත සභාවේ ඇත. සභා නායකත්වය තුළ මීසම් සේවක පියතුමා අප මීසම් සේවක දේවස්ථාන සංඝයේම සිටිනවා ඇත. සමිතියක ක්‍රියාදාමය, දයා සේවා බැම්මකින්, සාංඝික එකමුතුකමකින් බැඳී ඇත. යම් අවශ්‍යතාවයක් සහෝදරයෙක් හෝ සහෝදරියක් තුළ ඇතිවුවහොත් තීරණ ගන්නේ සාමාජිකයෙක් හෝ සාමාජිකාවක් ලෙස පුද්ගලිකව නොව, අනුශාසක පියතුමා වන මීසම් සේවක පියතුමා සමඟ සමිති විසින්මය. මෙම ක්‍රියාදාමය, විනිවිද පෙනෙන ස්වභාවය ඉහළින්ම ඇති කරන අතර, දයා සේවාවන් කිරීමට යාමේදී ප්‍රායෝගිකව පැන නගින ඉහත සිද්ධීන් එලෙස පැන නොනගියි.

එම නිසා මීසමක් තුළ සංඝයක් තුළ සිදුවන සෑමදේටම වගකිව යුත්තේ එම කතෝලික සංඝයයි. සාමාජිකත්වයට ප්‍රතිලාභ ලබා ගැනීම නොහැකි වුවත් අත්‍යවශ්‍යතාවය තුළ එම ලිපියේ සඳහන් ආකාරයට හිතවතුන් ද සිටිය හැකිය. මේ අවස්ථාවේ අප ක්‍රියා කළ යුතු ආකාරය ඉතා පැහැදිලිව ප්‍රායෝගිකව ඇත. තවද එකම කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ දී පැන නගින අපහසුතාවයන් මත සාමාජික සාමාජිකයින් අතර එකිනෙකාට උපකාර කිරීමට ක්‍රමවේද ඇතැම් සමිතිවල ගොඩනගාගෙන ඇත. කිසිවිටෙකත් කිසි ලෙසකින්වත්, සාමාජිකයෙක් හෝ ඔවුන්ගේ පවුල් තනි නොවේ. භෞතික ආධාර ප්‍රතිලාභ ලැබීමට වඩා ආධ්‍යාත්මික හා මානසිකව දෙවිඳුන්ගෙන් ලබන වරප්‍රසාද අනන්තයි. සැබෑ වින්සෙන්ති පාවුලා සාමාජිකයන් නම් මෙය හොඳින් අත්දකිනු ඇත.

තවද මීසමක සා. වි. පාවුලා සමිතිය මැදිහත්කරුවන් පමණයි. එම සංඝයේ සේවකයින් පමණයි. එම කණ්ඩායම සේවය කරන්නේ එම කතෝලික සංඝයටයි. තවද සා. වින්සෙන්ති ද පාවුලා සමිතියේ සිටින සාමාජිකයින් සෑම දෙනාම ඇති හැකි පොහොසත් අය නොවෙති. නැති බැරි අසනීපයෙන් පෙළෙන අයද සිටිති. එහෙත් ඔහුගේ බලාපොරොත්තුව හා හැකියාවන් එක සේ ශක්තිමත් වී ඇත්තේ සමිතිය තුළය. ආදරයේ සංඝය තුළය. ඒ තුළ ක්‍රිස්තුන් වහන්සේ තුළ ශක්තිමත්ව විශ්වාසය තුළ හා ආත්ම විශ්වාසය හා තෘප්තිය තුළ ක්‍රියා කිරීම ඔවුන් ලබන ප්‍රතිලාභයයි.

එබැවින් දැනුම්වත් කිරීමකට, දොර විවෘත කළ අප සමිතියේ සාමාජිකත්වයේ සිදුවන අඩුපාඩු අවම කිරීමට හා විනිවිද පෙනෙන ස්වභාවයෙන්, අත්‍යවශ්‍යතාවයන්ට සංවේදී වීමට ඉගිකළ මිකී ප්‍රනාන්දු සොයුරාට ස්තූතිවන්ත වෙමින් මෙවැනි ප්‍රශ්න පැන නගිනවිට එම දේවල් මීසම් සේවක පියතුමාටත් ඒ ප්‍රදේශභාර ඉහල කවුන්සිල වලටත් යොමුකර වැරදි අවම කරගෙන හොඳ දයා සේවාවක් ඒ ඒ සංඝවල අසරණ, දුගී දුප්පත් අයට ලබා දීමට කටයුතු කරන ලෙස සෑම කතෝලික සංඝයකින්ම ඉල්ලා සිටිමි.

**පැට්‍රික් පේටන් විතාන**
කටුපොත

# කිතුනු ඉතිහාසයේ සුවිශේෂී සොයාගැනීමක්!

**ක්‍රිස්තියානි ඓතිහාසික ගල්ලෙනකින් මතුවුන සුවිශේෂී වූ සොයා ගැනීමක් වන ජේසුස් වහන්සේගේ හස්ත සලකුණ උන්වහන්සේ ජීවත් වූ කාලයේ දී පරිහරණය කරමින් ගැවසුන ස්ථානයක් බවට පිළිගත හැකි සාක්ෂි හමු වී ඇත.**

ඉතාමත් දිළිඳු ලෙසින් ඉපිද ජනතාව අතර සාමය උපැද්දවීම සඳහා කැපවුනු ජේසුස් වහන්සේ දැනට වසර 2015කට පෙර උපන් දේශය අද විවිධාකාර අවුල් වියවුල් වලට භාජනය වෙමින් පැවතියත් උන්වහන්සේ උපන් ස්ථානය මෙන්ම ගැවසුනු ස්ථාන වල ඇතැම් සාධක විනාශ වී තිබුණත් ඉතිරිව තිබෙන සාධක වසරක් පාසා පැමිණෙන මිලියන ගණන් වන්දනා කරුවන්ගේ ගෞරවාදරයට පත්ව තිබීම වාසනාවකි.

කිතු දහම උපත ලද ඊශ්‍රායලයේ සුවිශේෂ වූ නටබුන් සොයා ගිය ආචාර්ය "ඉවන් තෝර්ටින්" සහ කණ්ඩායමට කිතු දහමේත් එහි ඉතිහාසයේත් සුවිශේෂිත වූ 20 වැනි සියවසේ අති විශේෂ වූ සොයා ගැනීමක් අනාවරණය කරන්නට වාසනාව ලැබුණි. එම සොයා ගැනීමේ විස්තර එංගලන්තයේ "සන්" පුවත්පතේ පළ කෙරුණු විට මුළු ක්‍රිස්තියානි ලොවම ඒ පිළිබඳව කුතුහලයට පත්වන්නට විය. එම "සන්" පුවත්පතේ විස්තර වලට අනුව ක්‍රි.ව. 2000 "පද්මා පැඩිඩිලියන්" මහත්මිය ගේ ලිපියක් අනුසාරයෙන් මේ ලිපිය සකස් කළෙමි.

ජෙරුසලමට ඉතා ආසන්න අඳුරු වූ දූවිල්ලෙන් පිරුණු ගල් ගුහාවකින් පුරා විද්‍යාඥයන් පිරිසක් සොයා ගන්නා ලද "පොසිලයක්" බවට පත්ව ඇති ක්‍රිස්තුස් වහන්සේගේ අතේ සලකුණ මේ මිල කළ නොහැකි මහාර්ඝ වස්තුවය. එහි කළු සුදු ඡායාරූපයක් ගත් ආචාර්ය තෝර්ටින් පවසන්නේ ඒ කාර්යය කිරීමේදී තමාගේ මුළු සිරුරට බල පෑ විදුලිය කම්පනයක් සමඟ සටන් කරන්නට තමාට සිදු වූ බව හෙතෙම "සන්" පුවත්පතට ප්‍රකාශ කර ඇත්තේ මෙසේය.

"අපි විශ්වාස කරනවා, මේ ස්ථානය ක්‍රිස්තුස් වහන්සේ ජීවත්ව සිටින කාලයේ රෝගීන් සුවපත් කරන්නට යොදා ගත් ස්ථානයක් බව" මේ ගල්ගුහාව තුළ වූ බිත්තිවල සටහන්ව ඇති අක්ෂර අනුව ඒවා ජේසුස් වහන්සේගේ කාලයට සර්වකාලීන බවත් තමන් සැමදා ජනතාව අතර වැඩ සිටින බවත් තමාගේ හස්ත සලකුණ අනාගත වාසින්ගේ දැන ගැනීම පිණිස "පොසිලයක්" බවට පත්ව මෙම ගුහාවේ සදාකාලයටම පිහිටන ලෙස සලකුණු කළ බවත් ලියැවී තිබේ.

එසේම තමාගේ කාලයේ තමා සමඟ සිටි රෝගීන් සහ මිය යමින් සිටියවුන් සුව කිරීම ද එම සලකුණ තැබීමෙන් සිදුකළ බවද එම ලෙනේ ලියැවී ඇත. මෙම හස්ත සලකුණ වසර දෙදහසකට වඩා කාලයකට පෙර ගල්ලෙනේ සටහන් කළ ද එහි සුවිශේෂත්වය වන්නේ අද ද දහස් ගණන් රෝගින් සුව කිරීමට උපකාරි වී තිබීමයි.

ආචාර්ය තෝර්ටින් හා ඔහුගේ ජාත්‍යන්තර පුරා විද්‍යා කණ්ඩායම තීරණය කළේ ජේසුස් වහන්සේගේ මේ මූලික හස්ත සලකුණ මෙතැනින් ඉවත් කිරීමෙන් දේව කෝපයට ලක්විය හැකි බවත් බොහෝ අන්තරාදායක විය හැකි බවත් ය. 47 හැවිරිදි පුරා විද්‍යා ආචාර්ය "ඒරියන්" කීවේ එම ගල්ලෙනෙන් හරිම පුදුම ඉතා ප්‍රබල විදුලි බලයක් ගමන් කරන බවයි.

"මම ජේසුස් වහන්සේගේ හස්ත සලකුණට මගේ අත තැබුවා පමණයි. විශාල විදුලි තරංගයක බලයට මගේ අත ඈතට විසිවෙලා ගියා පමණක් නොව, මගේ හිසේ සිට දෙපතුල දක්වා විදුලි සැර වැදුන වගේ වෙව්ලන්න පටන් ගත්තා" කියාය. ඒත් ඒ විදුලි බලය මට රිදවනවාට වඩා මං එයට බය වුනා. පිළිකාවක මුල් ආරම්භය වූ විශාල ගැටයක් මගේ ඇඟේ තිබුණා. ශල්‍යකර්මයකින් එය ඉවත් කරන්නට සිතා සිටියත් දැන් මට ඔපරේෂන් අවශ්‍ය නැති බව වැටහෙනවා. මගේ ඇඟේ තිබුණ එම ගැටය අර "ෂොක් " එකෙන් ඉවත් වෙලා සුව වෙලා" පුදුමයෙන් කීවා.

ඉතිහාසගත කරුණු වලට වඩා වර්තමානයේ ක්‍රිස්තුන් වහන්සේගේම හස්තයෙන් තැබූ මුද්‍රාවෙන් ලොව සුවය ලැබූ ප්‍රථම රෝගියා ආචාර්ය "ඒරියන්" බව වාර්තා වෙයි. එහෙත් අද විශේෂත්වය නම් අද ශුද්ධවූ දේශය කරා මේ හස්ත මුද්‍රාව සොයා යනවාට වඩා මෙහි දැක්වෙන "අතේ එම ඡායාරූපය" මත අත තබා දැඩි විශ්වාසයකින් යුතුව රෝගී සුවය අයැද සිටි බොහෝ අය සුවය ලබා ඇති බව වාර්තා වී ඇත. සාක්ෂි සහිතව ඔප්පු වී ඇති හෙයින් ලෝක ක්‍රිස්තියානි ආගමික නායකයින්ද මෙමම රෝග සුව වෙන ක්‍රමය අනුමත කර තිබීම වැදගත්ය.

මේ පිළිබඳ පුරාවෘත්තය සොයා ගිය විශේෂඥයන්ට දැනගන්නට ලැබුණේ මෙම සැඟවුණ ලෙන ක්‍රිස්තුන් වහන්සේගේ පරම්පරාවෙන් පැවත එමින් 20 වන සියවස මුල තෙක් ඉතා රහසේ ආරක්ෂා කරගෙන ආ බවයි. එහි සිටි අවසාන ආරක්ෂකයා එය



ඉතා ආරක්ෂිත වන ලෙස මුද්‍රා තබා වසා ඇත. මේ වන ගොත සොයා පැමිණි පුරාවිද්‍යා ආචාර්ය තෝර්ටින් ප්‍රමුඛ පුරා විද්‍යා විශේෂඥ කණ්ඩායම මේ ඓතිහාසික, සුවිශේෂී ක්‍රිස්තියානි ලෝකය ආලෝකවත් කළ ගල්ලෙන සහ එහි පිහිටීම අද ඉතා රහසිගතව රකින රහසක් බවට පත්ව ඇති බව ප්‍රකාශ කර ඇත. එසේම එම ඓතිහාසික ගල් ලෙන ජෙරුසලම සිට දින බාගයක් යන විට පිහිටා තිබෙන බව පමණකි.

51 හැවිරිදි පුරා විද්‍යාඥ "කරිස්මාන්" කීවේ "මේ ගල්ලෙන සෙවීමට ගොස් කාන්තාරය පුරා ගල් පෙරලමින් සෙවූ ප්‍රතිඵලය ලබා ගත් බවයි. මෙතෙක් කාලයක් ඉතිහාසය පුරා බයිබලයෙන් ක්‍රිස්තුන් වහන්සේ රෝග සුව කළ සිද්ධීන් පිළිබඳව කියෙව්වත් අද අපට මුළු ලෝකයටම සාධක සහිතව ඔප්පු කරන්න පුළුවන් වූ බවයි.

ජේසුස් වහන්සේගේ යැයි සැලකෙන හස්ත ලකුණේ නියම ප්‍රමාණයේ ඔවුන් ගත් ඡායාරූප ඉදිරිපත් කළ පසු මේ විශේෂඥ කණ්ඩායමේ සිටි බ්‍රිතාන්‍ය - ප්‍රංශ - රුසියානු ජාතික හැම දෙනාම එම හස්ත සලකුණ මඟින් රෝගීන් සුව වීමේ ප්‍රතිඵල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ආචාර්ය තෝර්ටීන් මේ විශේෂඥ පුවත්, "සන්" පුවත්පතට පමණක් ඡායාරූප සහිතව ඉදිරිපත් කිරීමට අවසර දී ඇත.

15 පිටුවට

**ජෙරාඩ් පෙරේරා**
වෙන්නප්පුව

# දින දින ඉහළ යන අපරාධ සංඛ්‍යාව

පෙරදිග ධාන්‍යාගාරය, ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙදහම් දිවයින ආදි සුලලිත විරුදාවලියන් ආදියේ සිට හඳුන්වන ලද අප මාතෘ භූමිය වන ශ්‍රී ලංකාව අද දින වන විට ඉතාම ශෝචනීය තත්ත්වයකට පත්වී ඇත. රට තුළ සිදුවන අපරාධ අතින් සලකා බලන විට, ලොව වැඩිම අපරාධ සිදුවන රටවල් අතර ශ්‍රී ලංකාව ද ඉහළින් සිටී. මෙම තත්ත්වය ඉතාම අවාසනාවන්තය.

ලොව ප්‍රධාන ආගම් හතරකින්ම පෝෂණය වන ජනතාවක් සිටින රටක එසේ විය හැක්කේ කෙසේ දැයි සිතා ගන්නට නොහැකි තරම්ය. බෞද්ධාගම, කිතු දහම, හින්දු සහ මුස්ලිම් දහම දෛනිකව හොඳ හැටි ප්‍රචාරය වන සහ පිළිපදින ජනතාවක් අතර මෙසේ අපරාධ සිදුවීම රටටම අපකීර්තියකි.

ගෞරවාන්විතව දහම පිළිපදිමින් සහ තම අනුගාමිකයින් එවැනි දිවි පැවැත්මකට යොමු කිරීමට මහත් කැපවීමෙන් ක්‍රියා කරන ආධ්‍යාත්මික නායකයින් ද ජනතාව ආගමික වශයෙන් සුවපත් කිරීමට දිනපතා මහත් වෙහෙසක් දරයි. එහෙත් තත්ත්වය එන්ට එන්ටම දරුණු වී ඇත.

මේ තත්ත්වය විග්‍රහ කිරීමේදි මත්ද්‍රව්‍ය භාවිතය ඉහළින්ම සිටී. මීට සෑහෙන කාලයකට පෙර මත්ද්‍රව්‍ය භාවිතය බොහෝ විට වැඩිහිටි ජනයා අතර දක්නට ලැබුනි. ඒද තැබෑරුමකට හෝ මත්පැන් අලෙවිකරණ ස්ථානයකට ගොසිනි. සමහරුන් එසේ යනුයේ දෛනිකව ඇඟ වෙහෙසා රැකියාව කර ඇඟ පතේ වෙහෙස අඩුකර ගැනීමටය. අද තත්ත්වය ඊට වෙනස්ය. අද මත් පැන් වලටත් වඩා මත් ද්‍රව්‍ය ඉතාම සුලභය. නොයෙකුත් මාදිලියේ හෙරොයින්, මත්කුඩු ආදිය දිනපතාම පාහේ හොර පාරින් පිටරටවලින් අප රටට ගෙන එනු ලැබේ. එවැනි දෑ වැළැක්වීමට බැඳී සිටින ඇතැම් නිලධාරින්ගේ සහයෝගයෙන් ද මෙම කටයුතු සිදුවේ. ප්‍රතිඵලය වැඩිහිටි ජනයා අතර පමණක් නොව තරුණ පිරිස් ද බොහෝමයක් මීට ඇබ්බැහි වීමය. මන්ද ඒවා ගැනීම රහසේ කිරීමට අවස්ථා එමට ඇති නිසාය.

මත්පැනින්, මත් ද්‍රව්‍යවලින් තෘප්තිමත් වී තම ගෙවලට ගොස් විවේක ගැනීමක් බොහෝ විට සිදු නොවේ. ඊළඟට සුදු ක්‍රීඩාවට පෙළඹේ. සූදුවද මත්පැන්, මත්ද්‍රව්‍ය මෙන්ම විනාශකාරී ක්‍රියාවකි. මනස සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේ නැති නිසා නිතරම පෙළඹෙනුයේ හරි හෝ වැරදි හෝ තම සිතැඟි අනුව ක්‍රියා කිරීමට ය. අනිකාත් එසේ වූ විට ආරවුල් ආරම්භ වේ. පරණ කෝන්තර සිහි වේ. ප්‍රතිඵලය මිනිමැරීම් දක්වා එම ආරවුල් පැතිරීමය. මත්කුඩු, මත්ද්‍රව්‍ය රේගුවේදී හෝ ගුවන් තොටුපලේ දි බොහෝ ප්‍රමාණයක් අත්අඩංගුවට පත්වීම ගෙන ආ අය අත්අඩංගුවට ගැනීම ඉතාම ලස්සනට ප්‍රචාරය වේ. එහෙත් ඊළඟට එම මත්ද්‍රව්‍ය වලට සිදුවනුයේ කුමක්දැයි ජනතාව නොදනී. ඒ ගැන වගකිව යුතු නිලධාරින් ඒවා නැවත රහසේ පිටකරන බවට ලොකු සැකයක් පවතී. ඒවායේ ප්‍රතිඵලය දූෂණය හා භීෂණයය. මිනීමරා ගැනීම අවසන් ප්‍රතිඵලය ය.

පසුගිය කාලයේ තිබූ කොටි ත්‍රස්තවාදය නිසා අපි ආයුධ බොහෝ ප්‍රමාණයක් භාවිත කළ නමුත් යුද්ධය අවසන් වීමත් සමඟ සමහර අවි හොර පාරේ ජනතාව අතරට පැමිණියේ ය. ඒවා භාවිත වනුයේ ජීවිත විනාශයට ය. රාජ්‍ය අංශයේ සහ රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට සුදුසුකම් නොබලා දේශපාලන හිතවත්කම් වලට බඳවා ගැනීම් නිසා සුදුසුකම් ඇති පත්වීම් නොලැබූ අය සිටිනුයේ මහත් චිත්ත පීඩාවෙනි. වෛරයෙනි. මෙම තත්ත්වයේ ප්‍රතිඵලය වනුයේ අවස්ථාව ලද විට පලිගැනීමයි. බොහෝ විට එය අවසන් වනුයේ මිනිමරා ගැනීමෙනි.

ලබන සතියට

**ඞී. ඇන්ටනි වික්‍රමසිංහ**
පමුණුගම

ශුද්ධවූ පවුලක පදනම

පහන් කැදැල්ල

ක්‍රිස්තු වර්ෂ 2015
මාර්තු 01 ඉරිදා

# මොන්ටිසෝරියට දුව රැගෙන ගිය අම්මා කෙනකු ගිය දුරක්!

සුගත් හා ගයනි සාමාන්‍ය කිතුනු පවුල් දෙකකින් පැවත එන, ප්‍රේම සම්බන්ධතාවයකින් විවාහයට ඇතුලත්වූ අඹුසැමි යුවලකි. තමන් කරගෙන සිටි රැකියාවෙන් ලැබුන ආදායමින් පවුලේ වැඩ කටයුතු සියල්ල ඉටුකර ගැනීමට නම්, අමතර වියදම් හැකිතාක් දුරට කපා හැරීම පමණක් නොව, ඉතා අරපිරිමැස්මෙන් කටයුතු කළ වුතු බවද දෙදෙනාම අවබෝධ කරගෙන සිටියෝය. නමුත් දෛනික ආදායම යාන්තම් ජීවත්වීමට පමණක් සෑහෙන නිසා. තමන්ගේම කියා ගෙයක් දොරක් හදා ගන්නට කීයක් හෝ ඉතුරු කරගත යුතු නිසා, අවසානයේ සුගත් විදේශ රැකියාවක් සඳහා පිටත්වීමට තීරණය කළේය.

ලබන අවුරුද්දේ දුව මොන්ටිසෝරියට ඇතුල් කිරීමට නියමිත නිසා ඒ පිළිබඳ අවැසි සියලු කටයුතු සොයාබලා පිළිවෙලක් කළ සුගත්, සෑහෙන මුදලක් යටකර විදේශ ගතවූයේ අනාගතය පිළිබඳ දහසකුත් එකක් බලාපොරොත්තු පොදිබැඳගෙනය.

තමන් විදේශයේදී ඉපැයූ හැම සතයක්ම ඔහු තම බිරිඳ වෙත එව්වේ අතේ තිබුනොත් වියදම් වෙනවා මෙන්ම, තම බිරිඳ කවදත් ඉතා පරිස්සමින් මුදල් පරිහරණය කරනවාය යන විශ්වාසය ඔහු තුළ තිබූ බැවිනි. ඇත්තෙන්ම ගයනි ද තම පවුලේ බර කරට ගෙන වගකීමෙන් කටයුතු කළ තැනැත්තියකි.

සුගත් විදේශගතවූ මුල් කාලයේදී දිනපතාම ගයනිට දුරකථනයෙන් කතා කළත්. පසුව අනවශ්‍ය වියදම් කපා හැරීමේ අදහසින් දෙදෙනාගෙ 'ම කැමැත්තෙන් සතියකට වරක් පමණක් ටික වේලාවක් කථා බහේ යෙදෙන්නට පුරුදු විය.

හය මාසයක් පමණ ගත වෙද්දි දුව මොන්ටිසෝරියට යෑම ආරම්භ කරන ලදි. සතියේ දවස් පහේම දුව රැගෙන මොන්ටිසෝරියට යන ගයනි, ආපසු ගෙදර එන්නේ පාසල් ඇරී දුවත් සමගමය. ඒ අතරතුර කාලය ඇය මොන්ටිසෝරියට එන අනිත් අම්මලා සමග ගත කරන්නට පුරුදුව සිටියාය. සමහර දිනවල මේ කාලයේදිත් සුගත් ඇයගේ ජංගම දුරකථනයට කථා කළේ දුවගේ අවශ්‍යතාවයන් ගැන විමසා බැලීම සඳහාය.

වෙනදා මෙන් නොව දැන් ගයනිට යෙහෙළියන් බොහොමයකි. ඔවුන් ඇසුරු කරන්නට ලැබීමත් සමගම තම සැමියාගෙන් වෙන්ව ජීවත්විමේදී අත්දුටු සාංකාව ටිකෙන් ටික අකා මකා යන්නට විය. ආපසු ගෙදර ගියත් ඇය බොහෝ විට තම යෙහෙළියක හා දුරකථනයෙන් කථා කරන්නට පුරුදුව සිටියාය.

මොන්ටිසෝරියට දරුවන් ගෙනෙන අම්මලා අතර, ඇය මෙන්ම තම සැමියා විදේශ ගතවූ සුසිලා සමග ගයනි වැඩි ඇයි හොඳයි කමක් දැක්වූයේ, ඇය ප්‍රිය මනාප තැනැත්තියක වූ නිසාම නොව, තමන්ට මෙන්ම ඇයටත් හුදකලාව හා තනිකම දරාග න්නට සිදුවූ අයෙකුට සරණක් වීමේ අදහසිනි. නමුත් ටික දිනක් කතා බහේ යෙදෙද්දි ඇය ඉතා සැහැල්ලුවෙන් හා සතුටින් කාලය ගත කරන හැටිත්, හැම විටම විනෝදකාමිව හැසිරෙන හැටිත් බලා සිටි ගයනි, මේ පිළිබඳව සුසිලා හා සමග තව තවත් කථා බහේ යෙදුනාය.

සුසිලා දරුවා රැගෙන මොන්ටිසෝරියට එන්නේ කුඩා ස්කූටර් වර්ගයේ යතුරු පැදියකිනි. දරුවා මොන්ටිසෝරියට ඇතුලත්



කොට ටික වේලාවක් එතැන රැඳෙන සුසිලා, 'පොඩි ගමනක් ගිහින් එන්නම්' කියා යතුරු පැදියේ නැගී ගොස් සමහර දාට ආපසු පැමිණෙන්නේ පාසල ඇරෙන්නට ඔන්න මෙන්න කියා තිබියදීය.

උදේ හිටන් පැය ගාණක් පාසලේ ගේට්ටුව ළඟ කාලය නාස්ති කරනවාට වඩා තමන්ටත් මේ වගේ ටිකක් එහාට මෙහාට යන්නට ඇත්නම් කොච්චර හොඳදැයි සිතූ ගයනි, ස්කූටරයක් මිලදී ගැනීමේ ප්‍රයෝජන සුගත් හා සමග සාකච්ඡා කළාය. මේ සඳහා ඇය වැඩියෙන්ම කරුණු ඉදිරිපත් කළේ පොඩි දුවගේ පහසුව ගැනය. පාර තොටේ අහන්නට ලැබෙන මාර්ග අනතුරු ගැන දන්නා සුගත් මුලදී මේ සඳහා සිය අකමැත්ත ප්‍රකාශ කළත්. අවසානයේ ගයනිගේ ඇවටිල්ල නිසා ස්කූටරයක් මිලට ගැනීම අනුමත කළේය. ඇත්තෙන්ම දැන් ගයනිට දැනෙන්නේ පුදුමාකාර පහසුවකි. මොන්ටිසෝරියට දරුවා රැගෙන යෑමට පමණක් නොව, හැම ගමනකටම වාගේ මේ කුඩා හුරුබුහුටි වාහනය ඉතා පහසුවකි. මේ නිසාම දැන් ඇයට වෙනදාට වඩා ගමන් බිමන්ද වැඩිය. මේ ගැන සුගත් ගේ මව ඇයට අවවාද කළත්, ඈ ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූවාය.

දිනක් සුසිලා ගයනිට අපූරු යෝජනාවක් ගෙනාවාය. 'අනේ මෙතෙන්ඩ වෙලා නිකම් ඉන්ඩ හරි පාළුයි, යමුද බීච් එක පැත්තෙ ගිහිල්ල එන්ඩ.' එයට එක පයින් එකඟවූ ගයනිද, එකිනෙකා තමන්ගේ ස්කූටරයේ නැගී කිරිල්ලියන් දෙදෙනෙකු මෙන් කෙලින්ම ගියේ බීච් එකටය.

නමුත් සිදුවූයේ ගයනි කෙසේවත් බලාපොරොත්තු නොවූ දෙයකි. තවත් තරුණයකු සුසිලා බලාපොරොත්තු වෙන් මුහුදු වෙරළේ රැඳී සිටියේය. කිසිම වෙනසක් නැතිව ගයනිව අර තරුණයාට හඳුන්වා දුන් සුසිලා, තුන් දෙනාම සෑහෙන වේලාවක් කථාබස් කරමින් සිට ආපසු වෙලාවට පාසල වෙත පැමිණියහ.

පසු දිනයේත් ඔවුන් එලෙසම බීච් ගියහ. නමුත් එදා එතැන තරුණයින් දෙදෙනෙක් වූහ. මුලදි ගයනි යම්කිසි තැතිගැන්මක් පෙන්නුම් කළත්, 'අනේ ඕව ගණන් ගන්ඩ එපා - ටිකක් කතා කර කර ඉඳල යමු'යි සුසිලා ඇගට නොදැනී කියද්දි, මොහොතකින් මේ අම්මලා දෙදෙනා තරුණයින් දෙදෙනා සමග වෙන් වෙන්ව මුහුදු වෙරළේ තනිවූහ.

දැන් ගයනිට මෙවැනි ගමන් බිමන් හි කිසිදු වෙනසක් හෝ චකිතයක් දැනෙන්නේ නැත. ඇය දකින්නේ ඒවා කදිම ආශ්වාදජනක අත්දැකීම් ලෙසය. කාලයත් සමග එහි බැරෑරුම්කම කිසිසේත් නොදැනෙන්නට වූ ඇය, පසුගිය දිනෙක උසස් පෙළ හදාරණ පාසල් සිසුවකු සමග තානායමක කාමරයක සිටියදී, ස්කූටරයද සමග පොලිස් අත් අඩංගුවට පත්විය.

**ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

# විවාහයේ සුබාරංචිය - 3



## ගරු බී. ඇන්සලම් ශිරාන් පියතුමා

**පාපයට පෙර ආදම් සහ ඒවගේ විවාහය ඒ තරම් වැදගත් නම් මොකද්ද ඒකෙන් අපිට වැදගත් වෙන කරුණු?**

මැවීමේ කථා දෙකක් තියෙනවා. මේ දෙකෙන් ම විවිධ යථාර්ථයන් ඉදිරිපත් කෙරෙනවා. පළමු කථාවට අනුව (උත්. 1) මනුෂ්‍යයාව මවන්න ඉස්සර වෙලා අනිත් දේ මැව්වාට වඩා වැඩි කාලය දෙවියන් වහන්සේ ගන්න බව පෙන්නුම් කරනවා. අනිත් දේ එක දිගට මවාගෙන ගියත් මනුෂ්‍යයා මවන්න ඉස්සර වෙලා සාකච්ඡාවක් ඇති බව සඳහන් වෙනවා (උත්. 1:26). ඉන් පසුවයි තම ස්වරූපයට මනුෂ්‍යයාව මවන්නේ. මෙහිදී ස්ත්‍රී පුරුෂ වශයෙන් එකතුව දේව ස්වරූපයට සමාන බවත් පැහැදිලි වෙනවා. මනුෂ්‍යයාගේ මැවීමෙන් පසු මෙතෙක් 'මනහර බව' දුටු දෙවියන් වහන්සේ මනුෂ්‍යයාගේ මැවීම 'ඉතා මනහර බව' දැක්කා. ඔවුන් දෙපලට (ඒ නිසා මනුෂ්‍ය වර්ගයාට) දුන් පළමු ආශිර්වාදය (උත්. 1:28) දරුවන් සම්බන්ධව බවත් පළමු කථාව අපිට පෙන්නුම් කරනවා. තවද, මනුෂ්‍යයාට මුලු මැවිල්ලේම බලය පැවැත්වීමේ ශක්තියත් දෙවියන් වහන්සේ ලබා දෙනවා. මේකේ ඇතුලාන්ත අර්ථය තමයි මනුෂ්‍යයා මැවිල්ල පාලනය කරනවා මිසක මැවිල්ලට (ලෝකයාට) මනුෂ්‍යයාව පාලනය කරන්න නොදිය යුතු බව. ආත්ම දමනයේ පළමු අදහස මෙසේ දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ලබා දුන්නා.

මැවීමේ දෙවැනි කථාවේ (උත්. 2) පුරුෂයාව සහ ස්ත්‍රීයව අවස්ථා දෙකකදී මවන ලද බවක් පෙන්නුම් කරනවා. හැබැයි ආදම්ට 'පුරුෂයා' (හෙබ්‍රෙව් භාෂාවෙන් 'ඉෂ්') කියලා පළමුවරට සඳහන් කෙරෙන්නේ 'ස්ත්‍රිය' ව (හෙබ්‍රෙව් බසින් 'ඉෂ්ෂා') මැව්වට පස්සෙයි. මේ නිසා ස්ත්‍රීයව මැවීමට ප්‍රථම සිටි 'මනුෂ්‍යයා' පොදුවේ මනුෂ්‍ය වර්ගයාව නියෝජනය කරන සංකේතයක්.

**ඔය අදහස් හරිම මනබඳින සුළුයිනෙ. තව ටිකක් විස්තර කරන්න පුලුවන් ද?**

ඔව් ස්ත්‍රීයව මවන්න ඉස්සර වෙලා මනුෂ්‍යයා (පොදු මනුෂ්‍ය වර්ගයා) 'තනිව විසීම සුදුසු නැත' (උත්. 2:18) කියලා දෙවියන් වහන්සේ සඳහන් කරනවා. මෙහිදී මේ 'ආරම්භක තනිකම' පුරුෂයාට ස්ත්‍රීයක් නැති නිසා ඇති තනිකමකට වඩා ගැඹුරු අර්ථයක් දෙනවා. 'මනුෂ්‍යයා' මුලු මැවිල්ල තුළම 'පුද්ගලයකු' ලෙස තනියි. සත්තු අතර පුද්ගලයින් නැහැ. තමාගේ මනුෂ්‍ය 'පුද්ගලභාවය' නිසා මුලු මැවිල්ලේ තමා අතිවිශේෂ බව මනුෂ්‍යයා දැක්කා. මේ නිසා තමයි අපි කවදාවත් සතුන්ගේ තත්ත්වයට වැටිය නොයුත්තේ. මේකෙ තවත් වැදගත් දෙයක් තමයි මේ පුද්ගල තනිකම. තමා පුරුෂයෙක් හෝ ස්ත්‍රීයක් කියලා වෙන්වෙන්ව ලිංග කව හඳුනා ගැනීමටත් පෙර තියෙන දෙයක් වීම. මේ නිසයි විවාහ සම්බන්ධයකදී දෙදෙනා ස්වාමි පුරුෂයා - බිරිඳ හැටියට අඳුනාග න්නත් ඉස්සර වෙලා ඔවුන් අති උසස් විදියට ගෞරව කළ යුතු පුද්ගලයින් ලෙස සැලකිය යුත්තේ; ඔවුන්ගේ ශරීරම මේ ගෞරවයට හේතු විය යුත්තේ; ඒ ශරීර අගෞරවය දෙන විදියට 'පාවිච්චි' නොකළ යුත්තේ පුද්ගලයෙක්ව මොනම මොහොතකවත් පාවිච්චි කරන්න බැහැ. 'භාණ්ඩ' විතරයි පාවිච්චි කරන්න පුලුවන්. මනුෂ්‍යයා තුළ අන් අයට නැති දේව හුස්ම තියෙන බව මැවිල්ලේ කථාව සඳහන් කරන්නේත් මේ නිසයි.

**මෙහෙම බලද්දි මනුෂ්‍යයා භාණ්ඩයක් වෙන්නත් පුලුවන්ද?**

ඔව්. ඒක තියෙන්නේ අපි මනුෂ්‍යයා දිහා 'බලන' විදිය අනුවයි. මතකද ජේසුස් වහන්සේ කියනවා 'යමකු ස්ත්‍රීයක දෙස කාමරාගයෙන් බැලූ කෙනෙහිම ඔහු ඈ සමග සිතින් කාමමිත්‍යාචාරය කර ඇත' (මතෙව් 5:28) කියලා. මනුෂ්‍යයෙක් දිහා පුද්ගලයෙක් හැටියටත් නැත්නම් භාණ්ඩයක් හැටියටත් යමකුට බලන්න පුලුවන්. විවාහයකදී එකිනෙකා (ශරීරයත් ඇතුළුව) තම තමාගේ ආශාවන් පිරිමහග න්න ඉන්න කෙනෙක් හැටියට හිතුවොත් පුරුෂයාට තමාගේ බිරිඳත් (විශේෂයෙන් ඇගේ ශරීරය), බිරිඳට තමාගේ පුරුෂයාත් (ඔහුගේ ශරීරයත් ඇතුළුව) භාණ්ඩයක් හැටියට පෙන්න පුලුවං. මේක විවාහය ගැන දෙවියන් වහන්සේගේ ආරම්භක අදහසට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මනුෂ්‍යයෙක් දිහා අපි බැලිය යුත්තේ පුද්ගලයෙක් හැටියට විතරමයි.

**මැවිල්ලේ දෙවෙනි කථාවෙන් කියවෙන්නේ ඒ දේ විතරද?**

අපෝ නැහැ. තව බොහෝ දේ කියවෙනවා. පළමුවෙන් ම ස්ත්‍රි - පුරුෂ විවාහ සම්බන්ධෙට ඉස්සර වෙලා මනුෂ්‍යයාගේ මූලික සම්බන්ධතාවය තියෙන්නේ දෙවියන් එක්කයි. මේ නිසා මේ ලෝකයේ කිසිම පුරුෂයෙකුටවත්, කිසිම ස්ත්‍රීයකටවත් සම්පූර්ණයෙන් මනුෂ්‍යයා සොයන ජීවිතයේ අර්ථය සොය දෙන්න බැහැ. ඒ සම්පූර්ණත්වය ලබන්න පුලුවන් දෙවියන් වහන්සේ සමග තියෙන සම්බන්ධයෙන් විතරයි. මේ නිසා විවාහක යුවල එකමුතුව නිතරම දෙවියන් වෙත හැරීම ඉතා වැදගත්. තමා නිදියන ඇඳ ලඟ දන ගහලා දෙදෙනාම දිනපතා යාච්ඤා කිරීම වැදගත්. එකමුතුව දිව්‍ය පූජාවට යාම වැදගත්. පවුලක් හැටියට දරුවනුත් සමග යාච්ඤා කිරීම වැදගත්.

**හොඳයි, දෙවැනි කථාවේ කියවෙනවා නේද පුරුෂයාගේ ඉල ඇටයකින් ස්ත්‍රියව මැව්වයි කියලා!**

ඒක ටිකක් නිවැරදි කළොත් ඔබ හරි 'පුරුෂයා' කියන වචනය පාවිච්චි වෙන්නේ ස්ත්‍රියව මැව්වට පස්සේ විතරයි. ඊට ඉස්සෙල්ල 'මනුෂ්‍යයා' කිව්වොත් වඩා නිවැරදියි. මනුෂ්‍යයාගේ ඉල ඇටෙන් ස්ත්‍රීයව මැව්වේ පුරුෂයාත් ස්ත්‍රීයත් එකම පදාර්ථයක් බව පෙන්වන්නයි; එක්කෙනෙක් උසස් අනෙකා පහත් කියලා පෙන්නන්න නෙවේ. කොහොම වෙතත් මනුෂ්‍යයාව 'බර නින්දකට' පමුනුවල තමයි ස්ත්‍රීයව මවන්නේ. මේ 'බර නින්ද' මනෝ විද්‍යාත්මක හීනයක් නෙවේ, එනම් විඥානයේ සිට අවිඥානයට යාමක් නොවේ. භාවයේ සිට නොභාවයකට ගමන් කිරීමක්. භාවාත්මක වැඩසිටීමෙන් ඉවත් කිරීමක්. මේ 'බර නින්ද' තුළ මනුෂ්‍යයා සම්පූර්ණයෙන්ම නිද්‍රාගතයි. දෙවියන් වහන්සේ සම්පූර්ණයෙන්ම අවදියි. මේ නිසා ස්ත්‍රීයව මැවීමේදී මනුෂ්‍යයාට එහි කිසිදු සහභාගීත්වයක් නැහැ. පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනාම මේ නිසා දෙවියන් වහන්සේගේ මැවිල්ලක්; එක සමාන වැදගත් කමක් ඇති පුද්ගලයන් දෙදෙනෙක්.

පුරුෂයවයි ස්ත්‍රීයවයි දෙදෙනෙක් හැටියට පෙන්නුවට 'ඔවුහු එක මාංශයක් වන්නෝය' කියලා සඳහන් වෙන්නේ කොහොමද? ඔබට ඇති ගැටලුව සාධාරණ එකක්. සාමාන්‍ය ගණිතයට අනුව '1+1=2' කියලනෙ අපි ඉගෙනගෙන තියෙන්නේ. හැබැයි පුරුෂයාත් ස්ත්‍රීයත් එකතු වන විවාහයක ගණිතය '1+1=1' කියලයි උන්වහන්සේ කියන්නේ. මේ 'එක මාංශයක්' වීම 'මහා අභිරහසක්' ලෙසයි ශු. බයිබලය හඳුන්වන්නේ (එපේසි 5:32). අභිරහසක් කියන්නේ අපිට තේරුම් ගන්න බැහැයි කියනවට වඩා දෙවියන් වහන්සේ නැතිව කරන්න බැහැ කියන එකයි. ඒ කියන්නේ දෙදෙනා එක මාංසයක් ලෙස ජීවත් වෙන්න දෙවියන් වහන්සේගේ උදව්ව අත්‍යවශ්‍ය බවයි. ඊටත් වඩා මේ අදහසේ අර්ථය ගැඹුරුයි.

දෙදෙනා විවාහය තුළ එක්කෙනෙක් වීම තුන්දෙනා වහන්සේලා දෙවියන් ලෙස එක් දෙවිකෙනෙක් වීමේ සළකුණක්. මුල ඉඳලම සම්බන්ධතාවය තුළ එක් කෙනෙක් වීම දෙවියන් වහන්සේව සැබෑ ලෙසම ලෝකයට එළිදරව් කරන සළකුණක් ලෙසයි විවාහය ඇතිකරල තියෙන්නේ. ශු. ත්‍රිත්වයේ ස්වභාවය යම්සේද එයට පටහැනි කිසිවක් විවාහය පෙන්නුම් නොකළ යුතුයි. මේ පදනම තේරුම් ගත්තොත් විවාහය පිළිබඳ බොහෝ ඉගැන්වීම් අපිට තේරුම් ගන්න පුළුවන්. විවාහය සක්‍රමේන්තුවක් වන්නේ මේ නිසයි.

**ඇයි දෙමාපියන් අතහැර ඔවුන් එක මාංශයක් වන්නෝය කියන්නේ?**

හොඳ ප්‍රශ්නයක්. මේක වැඩි දෙනෙක් අහන්නැති ප්‍රශ්නයක්. යමෙක් දෙවියන් වහන්සේ සමග සම්බන්ධ වෙනවනම් විශ්වාසය අත්‍යවශ්‍යයි. විශ්වාසය යමකු දෙවියන් මත යැපීමේ දොරටුවයි. ඒ කියන්නේ විශ්වාසය නැතිව දෙවියන් මත යැපීමක් නෑ කියන එකයි. මේ යැපීම කරන්න අපි වඩාත් සුරක්ෂිතයි කියල හිතන දේ අතහරින්න වෙනවා. මේ අතහැරීම කරනතුරු දෙවියන්මත යැපෙන්න බැහැ. දරුවකුට මේ ලෝකයේ අවිශ්වාසයක් නැතිව යැපෙන්න පුළුවන් බැඳීම තමයි දෙමාපියන් සමග බැඳීම. නමුත් ඒ බැඳීම අවදානම් සහිත නෑ. වැඩිපුර හිතන්න අවශ්‍ය නැහැ. මේ වගේ පහසු මාර්ගයකින් ඔබ්බට ගිහිල්ලා තමයි සැබෑ ලෙස දෙවියන් වහන්සේව පිළිබිඹු කරන්න පුළුවන් සම්බන්ධයකට ඇතුල් විය යුත්තේ. මේ නිසා සැබෑ විශ්වාසයකින් තමයි. අවදානමත් විශ්වාසයෙන් භාරගෙන, දෙවියන් මතම යැපෙමින් යමෙක් විවාහ ජීවිතයට ඇතුල් විය යුත්තේ. මේ නිසයි විවාහ යුවල දෙමාපියන් අතහැර එකිනෙකාට බැඳෙන්නේ.

දසත ආලෝකය විහිදුවමින්

දැල්වෙන පහන්

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

## 30 වන ගුණානුස්මරණය වෙනුවෙනි

# ගරු මෝසැසි පෙරේරා පිය මෙහෙවර...

**වටහාගන්නට වැඩි වැඩියේ**
**ඔබගේ දිවමන් වචනේ**
**දෙනුමැන අපහට එළිය ඔබේ**
**කිතු හිමිපාණනේ**

**ඔබේ වචන තුළ හද ද ගැහෙන්නේ**
**නැහැ අප තේරුම් ගන්නේ**
**සුදතුම් වරමින් අප පුරවනු මැන**
**එවිට'ප සිත් පැහැදෙන්නේ.**
**(ශු. මාක් 8:14;21)**

අඩ සිය වසකට වඩා දිගු කාලයක් මිනිස් මුවින් දෙවිඳුන් පසසන්නට ගීත ප්‍රබන්ධනය තුළින්, කිතු සසුනට, දෙස, බස, රැසට උදාර මෙහෙවරක් ඉටුකළ ගරු මෝසැසි පෙරේරා මා හිමිපාණන් අපට අහිමි වී පෙබරවාරි 12 වන දාට පුරා තිස් වසරක් ගත විය.

නමුත් එතුමන් සැබෑ මානව දයාව පෙරදැරි කර ගනිමින්, මිනිස් සිත, දෙවියන් වෙත එසවීමට, යැදීමට. පැසසීමට කළ අරුතවත්, මිහිරි ප්‍රබන්ධනයන් අද වැනි දිනෙකත් දෙව් මැඳුරු සිසාරා ගැයෙන විට, ඒ ගීත ප්‍රබන්ධන හුදෙක් සංගීත රසය අභිභවා යමින් අප හදවත් තුළ බැති පහන් රසය වඩවාලන බවක් ඔබට මට නොහැඟේ ද?
දෙවියෝ වෙති සුල මුල ප්‍රේමේ
සුල මුල ප්‍රේමය වෙති දෙවියෝ
ගැවසෙන්නෝ කවුරුද ප්‍රේමේ
ඔවුන් කෙරේ දෙවියෝ - නිවහන් ගත වන්නෝ
ඉවසන සුලුවේ කොතෙකුත් ප්‍රේමේ -
ප්‍රේමය උල්පත කරුණාවේ
ඉරිසියාව එහි නෑ ඇවිලෙන්නේ - තමාව නෑ පාරට්ටු කරන්නේ. (1 කොරින්ති 13:4)

එසේම එතුමන් ගේ ගීත ප්‍රබන්ධනය වුණේ දෙවිඳුන් ඇසුරේම බව අපට පසක් කරමින්, එතුමන් ඉතා කිට්ටුවෙන් ඇසුරු කළ විශ්‍රාමික ගාලු රදගුරු තැන්පත් අතිඋතුම් එල්මෝ හිමිපාණෝ පවසන්නේ - දිනපතා වේලාසනින්ම උදේ පාන්දරින්ම අවදිවූ එතුමා දේවස්ථානයට ගොස් සෑහෙන වෙලාවක් යාච්ඤා කළා. භාවනා කළා. යාච්ඤාවෙන්, භාවනාවෙන් පසුවිය එතුමා ගී ලීවේ. දෙව්මැඳුරේ දෙව් අබියස සිටිමින්මතමා ගී පබැඳුම් ලියන්නට හුරු පුරුදුව සිටියේ. දෙවියන් වහන්සේගේ ප්‍රබල හස්තය මාර්ගයෙන් තමන් හට මහා ශක්තියක්, ධෛර්යයක් ලැබෙන බව එතුමා නිතර ප්‍රකාශ කළා. රාත්‍රී දැඩි නිහඬතාවය ඇසුරු කරමින්ද දෙවිඳුන් ඉදිරියේ එතුමාණන් ගීත ප්‍රබන්ධ කළා.

**ජේසුනී නිහඬ වී ම'දොසෙ පුදසුනේ**
**හා මවෙත පෙම් බැඳි ගෙවති දිවි නිවී**
**පූ ගුණේ මුවා වැලා වසන ජේසුනේ**
**ඔබේ දෙවන බව අදහා එකත් බැතින් මා**
**බිමට පහත් වී මුළුමනින් මගේ**
**හිතද කයද දිවි පෙවෙත ද පුදමි වැඳ වැටී.**

**බාර ගන්න සමිඳුනේ - හැම නිදහස මගෙ සිතේ**
**සිහිය නුවණ මනාපේ - පිළිගනු මැන සියලු දේ**

**දෙසට කඳුකරේ - නඟමි ඇස් මගේ**
**එනු ඇතේ එතැනිනේ - උදව් පිහිට මා සොයා**
**අහස හා පොළොව හා - මැව්ව සමිඳුනේ**
**මගෙ සහයට ඔබ මැ වඩින්නේ**

දෙපා හැපී අප වැටෙන්නට ඉඩ නොදී දෙවිඳුන් අප රකින බවත් එතුමාණන් නිරන්තරයෙන් අවදිව සිට අප මුර කරන බවත් තවදුරටත් ඒ ගී ප්‍රබන්ධනයෙන් එතුමා අපට සහතික කර සිටිනවා.

ක්‍රිස්තු වර්ෂ 1899 ජූනි මස 07 වෙනි දින ජාඇලට නුදුරු මීගමු මාර්ග යේ දෙහියාගාත ග්‍රාමයේ උපත ලද මෙතුමාගේ පියා මහරගේ සැමුවෙල් පෙරේරා වන අතර මව කුරුග මගේ මරිය මදලේනා ජයවර්ධනයි. කිතුනුවන් ලෙස ආදර්ශවත් ජිවිත ගත කළ මේ යුවළගේ හත්වන දරුවා ලෙස මෝසැසි පෙරේරා දරුවා උපත ලබා ඇත. ගමේ පියතුමා ඉදිරියේ මුලින්ම අකුරු කර මෙතුමා, දෙහියාගාත රෝමානු කතෝලික මිශ්‍ර පාසලින් තුන්වන පන්තිය දක්වා ශිල්ප හැදෑරීය. මේ වකවානුවේ සිදුවූ තම පියාගේ අභාවය ඉගෙනීමටද බාධා ගෙන දුන් නමුත් ගාලු පුරවරයේ ජීවත් වූ ඔහුගේ මහප්පා වන ඇම්. මර්සලීන් පෙරේරාගේ අත හිත දීම තුළ ගාල්ලේ සාන්ත ඇලෝසියස් විදුහලේ අකුරු කරන්නට තරම් ඔහු භාග්‍යවන්ත විය. ගමේ. කුඹුරේ, කමතේ, පීල්ලේ නිදහස් සුව විඳිමින් හදුනු වැඩුණු මේ දරුවාට සිදාදියේ ජීවිතය අභියෝගයක් වුවත්, ජීවිතය නව ආරකින් සකසන්නට එම වෙනස පාදක වන්නට ඇති.

**දෙවියනේ ඔබ ඔබේ සෙනඟට**
**නිබඳ පෙන්වති යහ ගුණේ**
**තවද පිරිසිදු සිතැතියන් හට**
**ඉවරයක් නැති මෙත් ගුණේ**

**මා ළඟින් ඔබ සිටියොතින් මට**
**දෙවියනේ ඇති දෙවියනේ//**

**නමුත් තව එක මොහොතකින් මගෙ**
**යනු ඇතේ පා පැකිළිලා**
**මගෙ පියවර ඩිංගකින් තව**
**යන්න තිබුණේ ගැස්සිලා**
**(තෙහිලි ගී 72)**

දෙවියන්ටත් මිනිසාටත් වඩාත් කැපවුණු මෙහෙවරක් කරන්නට, තම හදවත තුළ නිතරම තෙරපෙමින් පැවති ආශාව මුදුන් පත් කර ගැනීම සඳහා මෝසැසි තරුණයා පදවි පූජක වරම්පතා දෙව්සත්හලට ඇතුළු විය. 1928 දී පූජකවරය ලත් මෙතුමා තම පූජක මෙහෙවර සඳහා මුළු දිවිය කැප කළේ ගාලු පදවිය වෙනුවෙන්ය.

**දෙවන් පහන් මිණි නඟා වඩිනු සුදතුනේ**
**හද පුරා වගුරුවා කිඳුරස් ඔබගේ**

**අසරණුන් පියේ - වඩිනු වරම් දෙන පියේ**
**හිතට එළිය ඔබ අනේ - වඩිනු අප සොයා**

සංඛ්‍යාත්මකව ඉතා අඩු කිතුනුවන් පිරිසක් ජීවත් වූ ගාලු පදවියේ රක්වාන, දෙනියාය, කීරපත්දෙනිය, දෙහිඔවිට, කහවත්ත, ඉඹුල්පෙ, බලන්ගොඩ එවකට ඉතා දුෂ්කර මේ නොදියුණු ගම්මානවල එතුමාණන් සේවය පුද කරද්දී ශ්‍රද්ධාත්ම බලය හා වරම් සැබැවින්ම එතුමාගෙන් බෙහෙවින් අත්දකින්නට ඇති.

එතුමන් කෙරෙහි සැමවිට පූජක මෙහෙවරේ ප්‍රමුඛතා සුපැහැදිලිව දිස් වූ අතර, පළමුව තමා භාරයේ සිටින ජනතාව හඳුනා ගැනීම, ඔවුන්ගේ අවැසිතාවයන් ග්‍රහණය කර ගැනීම, ඒවාට සංවේදි වීම ප්‍රධාන විය.

**දක්වත ඔබ මගේ ඉතා - කුඩා බෑයකුට දයා**
**ඒ කරන්නෙ මට තමා - ඒ කරන්නෙ මට තමා**
**සිටියෙමි මම හාමතේ - ඔබ මා කැවුවේ**
**සිටියෙමි මම පිපාසේ - ඔබ මා පෙව්වේ**

ගමේ පන්සලේ ස්වාමින් වහන්සේ මෙන්ම, කෝවිලේ ස්වාමිද මුස්ලිම් දේවස්ථානයේ ප්‍රධානියාද නිරන්තරයෙන්ම එතුමන්ගේ මිතුරන් වූ නිසා තම කිතුනු සංඝයට අවශ්‍ය වුණු දෙව් මැඳුර ගොඩනැගුණේද එතුමන්ලාගේද සහය ඇතිවය.

**මගෙ රැකවරණේ - බලකොටුව මගේ**
**ඔබයි දෙවියනේ සදහට ඔබයි දෙවියනේ**
**මගේ පිළිසරණේ ඔබයි සමිඳුනේ**
**නොවේ නොවේ කිසිදු බියක් ඔබෙ ලැගුම් පළේ**
**(තෙහිලි ගී 90)**

විශ්‍රාමික අතිඋතුම් එල්මෝ රදගුරු හිමිපාණන් එතුමන් පිළිබඳව මෙසේ සඳහන් කරති.

මහෝපකාරි වූ බව අද වියපත්ව සිටින ඔවුන් ඉතාමත් ගෞරවපූර්වකව සිහිපත් කරයි.

තවමත් නෑ ඉඳුරා අප දන්නේ
ජේසු ඉන්න සැටි අප අතරේ
පින් සැරියක ලෙස ඇවිදින්නේ
නවාතැනක් ඉල්ලා එන්නේ
(ශු. ලූක් 19:1-10)

මෝසැසි පියතුමා පොත පත කෙරෙහි දැක්වූයේ පුදුමාකාර ලෙන්ගතුකමකි. හෙළ හවුලේ ප්‍රබල



'එතුමා ඉතාමත් සරල ජීවිතයක් ගත කළා. අරමුණක් නොමැතිව නිකම් විනෝද සුවයෙන් කල් ගෙව්වේ නෑ. කෑම බීම ගැන, සුව පහසුව ගැන, යාන වාහන ගැන තැකුවේ නැහැ. තමාගේ පබැඳුම් ගැන අඩු ලුහුඬුකමක් කෙනෙක් පැවසූ විට ඒ වැරදි නිවැරදි කර ගන්නට එතුමා ඉතා නිහතමානිව ක්‍රියා කළා.

**උඩඟු සිතක් මගෙ නෑ සමිඳේ**
**නෑ ගති උදාර මගෙ බැල්මේ**
**හැපෙන්නෙ නෑ ලොකුකම් මත්තේ**
**නොදුවම් නොපොහොන තැන් පස්සේ**
**සමිඳුන් සිටිව් පතා දෙවිඳුන් ජනතාවේ**
**(තෙහිලි ගී 130)**

රදගුරු හිමිපාණෝ මෙසේද පවසති.

මා එතුමාණන් අමැතුවේ 'පියේ' කියලා. එතුමා නිසා මගේ පූජක දිවියටද ආලෝකයක් ලැබුණා. එතුමාගේ ආදර්ශය හා ආභාෂය මාර්ගයෙන් මගේ ජීවිතයද සාරවත් වුණා.

ඉරිදාවට, නත්තලට, මංගල්ලෙට, නුවානෙට සහභාගි වී තම ආගම හමාර කළ, බිත්ති හතරට කොටු වූ ඇදැහිල්ල තරයේ ප්‍රතික්ෂේප කළ එතුමා රස මසැවුළු වළඳමින් පවුරු වළලු තුළ ජීවත් වූවන්ට දේව රාජ්‍ය වෙත ළඟා වීම අසීරු බව පුන පුනා ප්‍රකාශ කළා.

**ඉසුරු සැපත් විඳිමින් අප ගෙවන ජීවිතේ**
**තාවකාලිකයි ඒ බව සිතව් මිනිසුනේ**
**හරි නුවණක් නොමැතිව ගත කරන ජීවිතේ**
**අතුරුදහන් වෙයි තිරිසන් සතුන් ගේ වගේ**

දැනුම ගවේෂණයෙහිලා ඉදිරිපත් වූවන් හට අතහිත දෙන්නට ඉමහත් උනන්දුවකින් කටයුතු කළ මෙතුමා රක්වානේ ගොඩ නැගූ නේවාසික මධ්‍යස්ථානය රටේ නන්දෙසින් පැමිණිවුනට සහ ගම්වාසින්ට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළට යන්නට

සාමාජිකයකු ලෙස නමක් දිනා සිටි මෙතුමා ඉන් කතෝලික සභාවට ද ඉමහත් ගෞරවයක් ගෙන දුනි. සිංහල බස මනාව හැසිරවූ බෞද්ධ ස්වාමින් වහන්සේලා සමග ගැඹුරු සම්බන්ධකම් පැවැත්වූ මෙතුමා දේශීය සාහිත්‍ය පෝෂණයෙහි ලා සිදු කළ යුග මෙහෙවර අති උසස්ය. ප්‍රශස්තය, දේශීයත්වය ගොඩනගමින් සිංහල භාෂාවට ගරු කරමින්, සිංහල සාහිත්‍ය නව ආරකින් කතෝලික සභාව වෙත දායාද කළ මෙතුමා සැබවින්ම භාෂා විශාරදයෙකි. ධර්ම දේශකයෙකි. ගීත රචකයෙකි.

ශුද්ධ බයිබලයේ මුණ ගැසෙන නා නා විධ සිදුවීම් තුළින් වෑහෙන අධ්‍යාත්මික ගුණ සුවඳ, ධාර්මික බව මැනැවින් තක්සේරු කර ගැනීමට එතුමා සමත් විය. දේව දිළින්දන්ගේ අසරණයන්ගේ මොරග ෑම් සාහිත්‍යයමය සංවේදි බවකින් ඉදිරිපත් කරන්නට එතුමා දක්ෂ විය. මෝසැසි හිමිපාණන් ගීත ගැයුවේ නැත. එහෙත් මිනිස් හද ගැහෙන රාවයට, සංගීතමය ස්වර එක්කළ හැකි සේ සිය පන්හිඳ හැසිරවීමට මහා පුදුමාකාර බලයක් දෙවිඳුන් වෙතින් එතුමන් ලබා සිටියේ ය. බලන්න මේ ගීතය හරහා දෙවිඳුන් හා මිනිසා මුණ ගස්වන අයුරු.

**සමිඳේ! ඔබ ඔබේ දෙසට සෙත සැලසුවෝ**
**වහල්කමින් ජකෝබුවන් ගලවා ගත්තෝ**
**ඔබෙ ජනතා කරපු වැරදි අමතක කෙරුවෝ**
**ඔවුන්ගෙ පව්කම් හැම ඔබ වළැලා දැම්මෝ**

**අනේ අපට පෙන්වනු ඔබෙ දයාව සමිඳේ**
**අපට ඔබේ ගැලවීමත් සලසා දෙන්නේ**
**(තෙහිලි ගී 84)**

දෙවෙනි වතිකාන කතිකාව විසින් සුදු සබය තුළ වන්දනා ක්‍රමයේ මහත් පෙරළියක් ඇති කරමින් දේශීය භාෂාවලට හා දේශීය සංගීත ක්‍රමවලට සිය වන්දනාවේ තැනක් දෙන විට සිංහල කිතුනුවන්ගේ වාසනාවට ගීත රචනය පිළිබඳ වෙසෙස් හැකියාවකින්ද කුසලතාවයකින් ද, ප්‍රතිභා ශක්තියකින් ද, නිපුණතාවයකින් ද හෙබි මෝසැසි පෙරේරාවන් පියතුමකු අපට සිටි අතර, සංගීතය පිළිබඳ විශාරද දැනුමකින් ද, දීර්ඝ පරිචයකින් හා ජනප්‍රියභාවයෙන් ද හෙබි ගිහි පින්වතුන් තිදෙනෙක් ද අප අතර සිටීම සොම්නසට හා ආඩම්බරයට හේතු වූ බව එවකට හලාවත රදගුරු තැන්පත් ස්වර්ග ස්ථ ගරු ප්‍රැන්ක් මාකස් හිමිපාණෝ පවසති. මෝසැසි පෙරේරා පිය ගීත ප්‍රබන්ධනයනට සංගීතයෙන් පණ පෙව්වේ සුනිල් සාන්තයන්, අයුවෝ ඩෙනිසුවන් සහ ජේ. කේ. ඇස්. පෙරේරා ශූරීන් ය. කිතුනු අප හද තුති මල් එතුමන්ලාටද පිදිය යුතුමය.

කාණ්ඩ අටකින් යුත් ඔබට පසස ගී පොත් පෙළ සමගින් ජන හදවත සොයා පැමිණි මෝසැසි පියතුමන්ගේ පොත් පෙළ දැඩි විමසීමකින් යුතුව ගවේෂණය කරන ගරු බෙනඩික්ට් ජෝසප් පියතුමා ඒවා ගීත ප්‍රභේද හතරකට වෙන් කර දක්වයි.

1. ගැයුම් පුද කිස ගී (Mass)
2. වැඳුම් පිළිවෙත් ගී (Liturgical Hymns)
3. තෙහිලි ගී (Psalms)
4. වෙනත් විවිධ ගී යනුවෙනි.

ශුද්ධ බයිබලයේ ගීතාවලියෙහි සඳහන් තෙහිලි ගී 83 ක් එතුමන් හෙළ බසට නිර්මාණය කොට දී ඇත.

මෝසැසි පෙරේරා පියනමගේ අති සුවිශේෂිත ගීතමය මෙහෙවර ප්‍රචලිත කිරීමට ඉමහත් ලෙස උරදුන් ප්‍රැන්ක් මාකස් රදගුරු හිමිපාණන් ගී පබැඳුම් පිළිබඳ පවසන දේ අදටද වලංගුය.

"ප්‍රබන්ධිත ගීත දෙව් දහමට එකඟ විය යුතුය. කෙලෙස් මලින් දූෂිත වූ මිනිස් සිත සුරපුර වෙත ඇද ගැනීමෙහිලා ශක්තිමත් විය යුතුය. සාහිත්‍ය රසයෙන් අනූන විය යුතුය. දේශීය ගීත පබැඳිම පිළිබඳ නීති රීති උල්ලංඝනය නොකළ යුතුය. එසේම ගීතය නමැති කයට තනුව නමැති ජීවය පිඹිය යුතුය. තනුව සංගීත කරුවාට රිසි පරිදි සැකසිය නොහැකිය. වෙසෙසින් එය ගීතයේ වදන් මාලාව සමග ගැලපිය යුතුය.

**දෙව් සමිඳුන් - අප හට දුන් - තිළිණයකි මේ ජීවිතේ**
**අප හැකිකම් - අප සුරුකම් - පිණිස යොදවමු ජන සේවේ**
**ලද උපතින් කුසලතාවන්**
**නොදෙමු යන්නට අපතේ**
**දෙව් මහිමය හා සත සෙත උදෙසා**
**වැයවෙමු වැයවෙමු ඒ යුතුකමය අපේ**

තම නිර්මාණයන් උපරිම අයුරින් අන් අය වැළඳ ගන්නවා. තම ජීවිත කාලයේදීම අත්දැක සතුටු විය හැකි කලා කරුවන් ඇත්තේ ඉතා අතලොස්සකි. ඒ වාසනාව හිමිවූවෙකි ගරු මෝසැසි පෙරේරා මාහිමිපාණන්. එහෙත් දෙවිඳුන් ඉදිරියේ තම කලාකරුවන් අමතක නොකළ එතුමා මෙසේ කන්නලව් කළා.

**අවසන් සුසුමෙන් නොමියන කිසිදා**
**ලියනා ගයනා වයනා විරුවන්**
**දෙව් සමිඳාණනි සැමදා වෙසෙනට**
**ආසිරි දෙන්න සදා**

1985 පෙබරවාරි මස 12 වැනි දින මේ බැතිමත් මෝසැසි පෙරේරා පියතුමන් එතුමන්ගේම වදනින් පවසන අයුරින් 'සගවැසි ඔබෙ සුද්දවතුන් සමග එකතුවී. තොරක් නැතිව සතත කාලෙ ඔබට පසස ගී ගය ගයා ඉන්නට අවසර ලැබ' අපෙන් සමු ගත්හ. එතුමාණන්ගේ ආයාචනයක් මත, මේ සුදුවර නිසල දේහය තම උපන් ගම් පියස වු දෙහියාගාත සුසාන භූමියේම මිහිදන් කොට ඇත.

**කුමාරි බණ්ඩාර** – අතුරුගිරිය

**සැ. යු. මෙම ලිපිය සැකසීමෙහි ලා පරිශීලනය කරන ලද ග්‍රන්ථය ගරු බෙනඩික්ට් ජෝසප් පියතුමන් විසින් රචිත මෝසැසි පෙරේරා මාහිමි. (1899-1985)**

## සලාපුර තරුණ..
1 පිටුවෙන්

පදවි තරුණ රැළියේ ප්‍රධාන ආරාධිතයාණන් ලෙස හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් සහභාගි වූ අතර මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජාව පැවැත්විණි. තරුණ තරුණියන් 6500 ට වැඩි පිරිසක් පදවියේ සියලුම මීසම් නියෝජනය කරමින් පදවි රැළියට සහභාගි වූහ.

ප්‍රවීන දේශක ධම්මික බණ්ඩාර ඇතුළු පිරිස සැබෑ කලාව සහ සංස්කෘතිය, තරුණ තරුණියන්ව සදාචාරසම්පන්න කරන ආකාරය මනාව පැහැදිලි කරමින් සංගීතය නියම ලෙසින් රසාස්වාදය කරන්නට ඇරියුම් කළෝ ය. පදවි තරුණ කටයුතු උපාධ්‍ය ගරු සුසන්ත බෙනට්, ශිරාන් චාමක පියතුමාත් මෙහෙයුම් කමිටුවත්, හලාවත පදවි තරුණ සංසදයත් එක්ව මනාව සංවිධානය කළ පදවි තරුණ රැළිය සියලු දෙනාගේ පැසසුමට ලක් විය.

## ජේසු සමඟ..
5 පිටුවෙන්

ටික වේලාවකින් වෙද මහතා නින්දෙන් අවදි වූ බව දැක ටිකක් දොඩමළු වීමේ අදහසින් ඒ අසළට ගියෙමි. මා දැක හාන්සි පුටුවේ කෙලින් වී වාඩි වූ ඒ මහතා "මහත්තයා කොහි ඉඳල ද ආවේ" කියා මගෙන් ඇසීය. මා වත්තල ප්‍රදේශයේ සිට පැමිණි බව පැවසුවෙමි. එහෙනම් රෝමානු කතෝලික කෙනෙක් වෙන්න ඇති. එකවරම මට ඇති වූයේ සතුටකි. වෙද මහතා මා තුළින් ජේසුව දකින්නට ඇතැයි මට සිතිණි. "මහත්තයලා ඔය අදහන ආගමේ කියන දෙවියන් වහන්සේ ඉන්නේ කොහේ දැ"යි ඔහු මගෙන් ඇසීය. මෙය සමච්චලේට ඇසූ දෙයක් ද නැතිනම් යමක් දැනගැනීමේ අටියෙන් ඇසූ දෙයක් දැයි මට එකවරම පසක් වූයේ නැත. මට එකවරම පිළිතුරක් දීමට හැකියාවක් නොවිනි. "දෙවියන් වහන්සේ ඉන්නේ මෝක්ෂ රාජ්‍යයේ නොවෙද මහත්තයා" මම කීමි. එසේ පවසා වට පිට බලන මගේ දෑසට හසු වූයේ ගසක තනා ඇති වෙද මහත්තයා ගේ පුංචි බුදු ගෙයයි. වෙද මහතා දැඩි බෞද්ධ මතවාදියෙක් විය යුතු යැයි මට එකවරම සිතිනි. මගේ උත්තරයට උපහාසාත්මකව සිනාසුනු වෙද මහතා හාන්සි පුටුවෙන් නැගිට මා ඉදිරියටම පැමිණ මගේ පපුවට අත තබා "මහත්තයෝ, මහත්තයා අදහන ඔය දෙවියන් වහන්සේ ඉන්නෙ මහත්තයාගේ හදවතේ ඔය ජේසු ගේ මාලිගාව තමයි මහත්තයාගේ හදවත ඒ නිසා ඔතන කිළුටු කරගන්න එපා. ජේසුට ඉන්න පුළුවන් විදිහට හදවත පිරිසිදුව තියා ගන්න." මට ඇති වූයේ දැඩි අපහසුතාවයකි. වෙද මහතා නැගිට තම කාර්ය සඳහා පිටත් විය. මගේ කිතුනුකම ගැන මට ඇති වූයේ දැඩි වේදනාවකි. ජේසු සමඟ ගමන් බිමන් යන මේ පව්කාර මිනිසාට තවමත් ජේසු සිටින සැබෑ ස්ථානය තේරුම් ගන්නට තරම් හැකියාවක් නොවීය. බෞද්ධයකු විසින් ජේසු සිටින සැබෑ ස්ථානය මට කියා දීම ගැන එක්වරම සිතට ඇති වූ ලතැවිල්ල මා සුවපත් කර ගත්තේ වෙනත් සිතුවිල්ලක් සිතට නගා ගෙනය. එනම් බෞද්ධයකු වුවත් ඔහුත් දෙවියන් වහන්සේ ගේ මැවිල්ලක කොටසක් බව සිතට නගා ගනිමිනි.

## කිතුනු ඉතිහාසයේ...
12 පිටුවෙන්

සුව කළ නොහැකි පිළිකා රෝග ඇතුළු බලවත් රෝග සුව වූ අවස්ථා කිහිපයක් නම් ගම් සහිත උදාහරණ මගින් සාක්ෂි සහිතව පෙන්වා දීම අතිශය වැදගත් ය.

ජේසුස් වහන්සේගේ ඉපදීම, මරණයෙන් සහ නැවත උත්ථානයෙන් පසු ක්‍රිස්තියානි ලෝකයේ විශිෂ්ටතම සොයාගැනීම මෙය බව පුරාවිද්‍යාඥයන්ගේ අදහසය. ක්‍රිස්තුන් වහන්සේ ලබා දුන් එම විශිෂ්ට හස්ත සලකුණෙන් නිසි ඵල නෙලා ගැනීම සඳහා සැහැල්ලු මනසක් ඇති කරගෙන සැනසීම, සුවය සහ සාමය ළඟා කර ගැනීම මගින් යහපත් ලොවක් ගොඩනැගිය හැකිය. ජේසුස් වහන්සේගේ හස්තයට, අත තබා විශ්වාසයෙන් ඉල්ලා සිටිය යුත්තේ හිතේ ක්‍රෝධය, වෛරය, පලිගැනීම, ඊර්ෂ්‍යාව, තණ්හාව, වංචාව ආදිය සිතෙන් දුරුකොට පිරිසිදු හදවතකින් තම ශාරීරික මානසික රෝග දුරුකර දෙන ලෙස කන්නලව් කිරීමය. "ඉල්ලව් තොපට ලැබේ" යන උන්වහන්සේගේ කියමන ඉන් ඉටුවනු ඇත.

# ගම්පහ සිරිකුරුස දෙව්මැඳුර ජුබිලි මංගල්‍යයට සූදානම් වෙයි



ගම්පහ සිරිකුරුස දේවස්ථානයේ 100 වන ජුබිලි මහෝත්සවය 2016 වසරට යෙදීම නිමිත්තෙන් ඒ සඳහා ආධ්‍යාත්මික සූදානම්වීමක් වශයෙන් සැදැහැවතුන් දැනුම්වත් කිරීමේ දෙවන වැඩසටහන මීසම් සේවක ගරු හේමන්ත උදයකුමාර පෙරේරා පියතුමාගේ ආරාධනයෙන් කොළඹ අගරදගුරු වසමේ සදහම් සජීවක සේවාවේ නියුතු ගරු ඇන්ටන් දිනේෂ් පියතුමාගේ මෙහෙයවීමෙන් පසුගියදා දේවස්ථානයේදී සිදුකෙරිණි.

"ජුබිලිය යනු ස්වාමින් වහන්සේගේ ප්‍රසාදය ලත් වසරයි" යන තේමාව ඔස්සේ මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර ජුබිලිය අරුත් ගන්වන්නට සමගි වීම, දයාවේ ක්‍රියා කිරීම හා ජීවිත වෙනසක් අත්දැකිය යුතු බව ගරු ඇන්ටන් දිනේෂ් පියතුමන් විසින් අවධාරණය කරන ලදි. ගම්පහ මීසම් වාසින් මෙම වැඩසටහනට සහභාගි විය. **(ඩී. ජී. ආර්. ඒ. පෙරේරා)**

දෙහියාගාත මීසම් සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමාගේ "චතාරික සිතුවිලි" (චතාරික සමයේ දින 40 හා ශු. සතියේ මෙනෙහි කිරීම්) ග්‍රන්ථය නිකුත් වී ඇත. මෙහි චතාරික සමයේ පළමු ඉරුදින සිට ශු. සතිය දක්වා දිනපතා පළමු, දෙවන කියවීම් හා සුවිශේෂ පාඨ සඳහන් කරමින් මේ පිළිබඳව මෙනෙහි කරමින් සැදැහවතුන්ට චතාරිකය සඳහා හොඳ ප්‍රවේශයක් එක්කර ඇත. මෙම පොතේ මිල රු. 200 කි **(කුමර)**

# "පවුල් වසරේ දහම් එළියෙන් පිබිදුනු ලොවකට"

ශාන්ත ජුසේ වාස් දේව ධර්ම නිකේතනයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය දිනය මාර්තු මස 5 වැනි බ්‍රහස්පතින්දා (පෝය) අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. ඒ සඳහා සියලු ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය සැමට ආරාධනා කරන බව එහි අදියුරු ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා පවසා සිටී.

එදින පෙ.ව. 8.00 ට අගරදගුරු නිවසේ සිරිහද දෙව්මැදුර අභියස ලියාපදිංචි වීම අරඹන අතර පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 දක්වා මෙම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය දිනය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එදින වැඩසටහන සඳහා අවම වශයෙන් රු. 200 ක පමණ මූල්‍ය ආයකත්වයක් බලාපොරොත්තු වේ. එම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය දිනයට සහභාගිත්වය පෙබ. 20 දිනට ප්‍රථම 011 2692587, 0112 662881 දුරකථන අංක වලට දැනුම් දෙන්න.

## එන්න අප හා එක්වන්න

මොණරාගල සා. අන්තෝනි දේවස්ථානයේ ශාන්ත අන්තෝනි තරුණ කැල විසින් සැමගේ සහයෝගි බව, එකමුතුකම, සුහදත්වය සේම සාමුහික හැඟීමෙන් යුතුව ඉදිරියටම යාම තුළින් දෙව් සමිඳුන්ට සාක්ෂි දැරීම අරමුණු කොටගෙන ප්‍රථම වරට පවත්වන ලද සා. අන්තෝනි සුහද ක්‍රිකට් තරගාවලිය පසුගියදා මොණරාගල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.

මේ සඳහා අප දිරිමත් කළ මීසම් සේවක ගරු රවීන් පෙරේරා පියතුමන්, පැවිදි සොයුරියන් සහ මීසමේ වැඩිහිටි ප්‍රජාවට අපගේ අවංක ආදර ස්තුතිය සේම දෙවිඳු ආදරය වඩ වඩාත් අත්දකින්නට දේව ආශිර්වාදය පතමු.

අප පදවිය තුළ ශ්‍රී ලංකාවෙහි සියලු කිතුනු තරුණ සමාජ හා සම්බන්ධතාවය ඇතිකොටගෙන දෙව් දහම ප්‍රචලිත කිරීම අපගේ ඉදිරි බලාපොරොත්තුවයි. ඒ සඳහා අනෙකුත් තරුණ සමාජයන් වෙත ඇරියුම් කර සිටිමු. **(යූ. මිලානි කෞෂල්‍යා)**

**දැන්වීමයි**
**pradeepaya@yahoo.com සහ pradeepaya@sltnet.lk ඊ මේල් ලිපිනයන් ප්‍රදීපය පුවත්පත් ලිපි එවීම සඳහා පමණක් භාවිත කරන්න.**

## ඔබේ අවශ්‍යතා සපුරාලන කතෝලික පොත්හලක් දැන් කඳානේදී...

- ★ සිංහල, දමිළ, ඉංග්‍රීසි කතෝලික පොත් පත්, සඟරා, පුවත්පත්
- ★ පාසල් ලිපි ද්‍රව්‍ය සහ උපකරණ ★ ආගමික භාණ්ඩ - සීඩී පට සහ ඩී. වී. ඩී. පට ★ කතෝලික පුවත් පත් සඳහා දැන්වීම් බාරගනු ලැබීම
- ★ දේවස්ථාන සඳහා අවශ්‍ය ආගමික භාණ්ඩ ඇතුළු ඔබේ සියලු අවශ්‍යතා සඳහා පැමිණෙන්න.

**සා. මරියා කතෝලික පොත්හල, අංක 390, මීගමුව පාර, කඳාන**
**දුරකථන - 0112238102, 08718576261**

★ වරක් පාවිච්චි කළ වටිනා ආගමික පොත් පත් වඩාත් සහනදායි මිලට

## "ශුද්ධවන්ත සිරිලක මුනිඳේ" සංයුක්ත තැටිය

ශ්‍රී ලංකා අපෝස්තුළුවර භාග්‍යවන්ත ජුසේ වාස් මුනිඳුන් සාන්තුවර මහිමයට පත්කිරීම සහ අති උතුම් ප්‍රැන්සිස් සසුන් පිය ලංකා ගමන නිමිත්තෙන් නිකුත් කළ, දිවයිනේ ප්‍රවීන ගායන ශිල්පීන් සහ ශිල්පිනියන් ගීත ගයන "ශුද්ධවන්ත සිරිලක මුනිඳේ" ශු. ජුසේ වාස් මුනි බැති සරණිය සංයුක්ත තැටිය දිවයිනේ ප්‍රධාන සිද්ධස්ථාන, දේවස්ථාන සහ පූජා භාණ්ඩ අලෙවිසැල් මගින් දැන් ලබා ගත හැකිය. විමසන්න 0773156785, 077 4434281. සී. ඩී. පටය රු. 300 කි.

## පවුල් වසරේ පවුල මත් උවදුරින් මුදා ගැනීම සඳහා බලකායක්

රජයේ අන්තරාදායක ඖෂධ මණ්ඩලයේ මෙහෙයවීමෙන් ඉහත සඳහන් බලකායක් ඇති කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. ඒ සඳහා සෑම දිසාවකින්ම සාමාජිකයන් බඳවා ගනු ලැබේ. ගැහැනු පිරිමි භේදයක් නොමැත. සමාජ සේවයට නැඹුරු අයට මෙය හොඳ අවස්ථාවකි. මේ කාර්ය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී තමන් වෙසෙන ප්‍රදේශයේ සේවය කිරීමට යොදවනු ලැබේ.

තවද මත් ද්‍රව්‍යයට යොමු වූවන් රජයේ වියදමින් පුනරුත්ථාපනය කරනු ලැබේ.

විමසන්න
ගරු ඇලෙක්සිස් බෙනඩික් පියතුමා
87/1 ගලහිටියාව පාර,
සියඹලාපෙ
දු. අංක - 0776552545,

## දඹඳුරය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල විවෘත කැරේ



දෙහියාගාත මීසමට අයත් දඹඳුරය ශු. සෙබස්තියන් මුනි දේවස්ථානයේ දහම් පාසල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දෙමහල් ගොඩනැගිල්ල පසුගිය දා ශුද්ධාසනීය ධර්මදූත පදවි අධ්‍යක්ෂ ගරු ෆ්‍රෙඩී ශාන්තිකුමාර් ප්‍රනාන්දු පියතුමන් අතින් විවෘත කළ අතර මෙයට මීසම් සේවක ගරු නිශාන්ත විලත්ගමුව පියතුමා සහ සහය මීසම් සේවක ගරු ගයාන් ප්‍රසංග පියතුමන් ඇතුළු මීසම් වාසී සැදැහැවතුන් රැසක් එක්වූහ.

## ප්‍රදීප දසත තොරතුරු



පුවත් විත්ති

ක්‍රිස්තු වර්ෂ 2015 මාර්තු 01 ඉරිදා

## සුරතල් පුතුගේ සිහිකිරීමයි



**ලුසිල්ඩා ප්‍රනාන්දු**
**විලියම් සිල්වා උද්‍යානය, හලාවත**

හලාවත විලියම් සිල්වා උයනේ මලක් වෙලා
සැම හදවත් තුළම සුවඳ ආදරයෙන් විහිද වලා
මව් සෙනෙහස මන්දීරය සෙනෙහසේ මලින් සරස වලා
නොසිතුව විලස ගියා ඒ මල අකලට පර වෙලා

මුළු නිවසම සතුටේ ආලෝකයෙන් බබළ වලා
වසර දොළහක් අම්මිට සුරතල් වෙලා
දරු සෙනෙහසින් අම්මිගෙ හදවත අන්දමන් කරලා
ගියා නේද යන්න ජේසු අම්මිගෙ තුරුල සොයලා

දැන් සැම වසරකම මාර්තු 21 වැනිදා පහන් වෙන්නේ
මගේ එකම රන් පුතුගේ අවසන් සුසුම් ගිල ගන්නේ
අතීතය කළු වලාවක් විලස මා වටා එතෙන්නේ
දැන් මුළු ලොවම අඳුරයි මට පෙනෙන්නේ

පුරා වසර තිස් හතරකුත් ගෙවිලා යන්නේ
මගේ රන් පුතුගේ සොවින් මා දැවෙන්නේ
මගේ මුළු දිවියම එකම කඳුලක් වෙන්නේ
ජේසුනි ජේසුනි මා දෙස බලා සැනසිල්ල දෙනු මැනේ

## සෙත් එෆ්. එම්. 101.8 චතාරික වැඩසටහන්

- ★ ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමා මෙහෙයවන දින 40 චතාරික වැඩසටහන දිනපතා රාත්‍රී 9.00
- ★ ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා ඉදිරිපත් කරන චතාරික භාවනාව දිනපතා රාත්‍රී 8.00 ට
- ★ ගරු වජිර සිල්වා පියතුමා මෙහෙයවන දිනපතා උදෑසන සදහම් සිතුවිලි උදේ 5.50 ට

සෙත් එෆ්. එම්. 101.8 හා www.sethfm.lk වෙබ් අඩවිය ඔස්සේ සජීවි ලෙසින් ප්‍රචාරය කැරේ.
ඉරුදින දිව්‍ය පූජාව දිනපතා රාත්‍රී 7.00 ට පසන් සමඟින් කිතුනු ගී ඉරිදා උදේ 9.00 ට

වැඩි විස්තර සඳහා අමතන්න 0715247897
සජීවි මැදිරිය 0312228181
28, කොළඹ පාර, මීගමුව

## "ධර්මාවලෝකනය

මාර්තු 01 වන ඉරුදින සිට සෑම ඉරුදිනකම රාත්‍රී 8.30 සෙත් එෆ්. එම් ගුවන් විදුලිය ඔස්සේ නව කතෝලික වැඩසටහනක් විකාශය කිරීමට කටයුතු යොදා ඇත. කොළඹ අගරදගුරු පදවි ජනසන්නිවේදන සහ සංස්කෘතික කේන්ද්‍රය ඉදිරිපත් කරන මෙම වැඩසටහන නම්කොට ඇත්තේ "ධර්මාවලෝකනය" ලෙසිනි.

කිතුනු ජීවිතයට වැදගත් වන විවිධ කරුණු පිළිබඳව විද්වත් පියවරුන් සහ ගිහියන් සමඟ කෙරෙන සාකච්ඡා කාලයට අදාළ ගීතිකා ඇතුළු විචිත්‍රාංග ඇතුළත් මෙම වැඩසටහන මෙහෙයවන්නේ ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමාය.

## දහම් ගුරුවරුන් සහ ධර්මාචාර්ය විභාග අපේක්ෂකයන් වෙත

2015 වර්ෂයේ නොවැම්බර් 17 පැවැත්වීමට නියමිත ධර්මාචාර්ය I, II හා III යන විභාගයන් සඳහා සූදානම් කිරීමේ පංති 2015 මාර්තු මස 15 ඉරිදා ප.ව. 3.00 ට තම්මිට, මීගමුව කාදිනල් කුරේ මධ්‍යස්ථානයේ දී ආරම්භ කැරේ. අදාළ පන්ති සඳහා ලියාපදිංචි කිරීම 2015 මාර්තු 15 ඉරිදා සවස සිදු කරන බැවින් අපේක්ෂකයන් විසින් මීසම් සේවක පියතුමාගෙන් අදාළ විභාගය සඳහා අපේක්ෂකයන් සුදුසු බව සහතික කර ලිපියක් රැගෙන ආ යුතු බව මීගමුව කලාපීය ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු රවීන් සඳසිරි පියතුමා ප්‍රදීපයට පැවසීය.

ධර්මාචාර්ය I - අ.පො.ස. (සා.පෙළ සමත්වීම), ධර්මාචාර්ය II - ධර්මාචාර්ය I සමත්වීම හෝ අ.පො.ස. උ.පෙළ රෝ.ක. ධර්මය විෂයක් ලෙස සමත් වීම., ධර්මාචාර්ය III - ධර්මාචාර්ය විභාගය සමත්වීම.

ක්‍රිස්තු වර්ෂ 2015 ක් වූ මාර්තු 01 ඉරිදා QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජුනි 07

# ඥානාර්ථ ප්‍රදීපය 2





# රෝමයේ කිතුනු උපහාර උලෙළ





සිරිලක් කිතුනුවන්ට සාන්තුවරයකු ලැබී මසක් සපිරීම නිමිත්තෙන් දෙවි මහෝත්තමයාණන්ට තුති දීමේ විශේෂ දේව මෙහෙයක් සහ ආගමික සංස්කෘතික දැක්මක් ඉකුත් දා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් රෝමයේ දී පැවැත්වුණි.

රෝමයේ ඉන්ෆර්නෙත්තෝ සාන්ත මරියා දෙව්මැඳුරේදී පැවති මෙම දේව මෙහෙයේ දී ජනතාව ඇමතූ කාදිනල් හිමිපාණෝ 2015 වසර ශ්‍රී ලාංකික කිතුනුවන්ට පමණක් නොව මුලු මහත් දේශයටම ද්විත්ව ආශිර්වාදයක් වූ බවයි. භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ව සාන්තුවරයට එසවීමත් ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ ලංකා ගමනත් ලක් කිතුනු ඉතිහාසයේ මෑතක සිදුවූ ප්‍රාතිහාර්ය දෙකක් බව උන්වහන්සේ කියා සිටියහ. තීරණාත්මක ඡන්දයකට පසු කවුරුත් බලාපොරොත්තු වූ නොසන්සුන්භාවයත්, ප්‍රචණ්ඩත්වයත් වෙනුවට ලක් ඉතිහාසයේ මින් පෙර නොවූ විරූ දේශපාලනික සහෝදරත්වයක් සහ මහත්මා සංවරභාවයත් අත්විඳි සමයක බෞද්ධ රටක් ලෝක කතෝලික නායකයාණන්ව හරසරින් පිළිගත් අන්දමින් අප රට සතු ආධ්‍යාත්මික බලයත් වාර්ගික සහ ආගමික සමගියත් මුළු ලෝකයටම කියා පෑ බව ද උන්වහන්සේ සඳහන් කළහ. මෙම අවස්ථාව අලලා රෝමයේ වෙසෙන කිතුනු භ්‍රම සංක්‍රමිකයන් එකමුතුව සංවිධානය කළ විශේෂ සංස්කෘතික ප්‍රසංගයක් රෝමයේ අවිලියාහි සා. තිමෝතයෝ දෙව්මැඳුරු රංගන ශාලාවේදී පැවැත්විණි. එහිදී ජනතාව ඇමතූ කාදිනල් හිමි තම මව් රටටවත් නොගිය අති උතුම් ප්‍රැන්සිස් පාප් වහන්සේ ආසියාවේ අප වැනි පුංචි දිවයිනකට පැමිණීමට ගත් තීරණය පමණක් නොව ගමන පුරාම ඉතා ළඟින් තමන් සමගකළ කතා බහෙන් පෙන්නුම් කළේ ජාති, ආගම්, කුල භේද නැති උත්තුංග මනුෂ්‍යයකුගේ පිරිසිදු හදවතක් බවයි.

සංචාරයේ න්‍යාය පත්‍රයෙන් බැහැරව බෞද්ධ විහාරයක් බැහැදැකීමට යෑමත් එම විහාරයේ දී උන්වහන්සේ ක්‍රියා කළ ආකාරයත් එතුමාගේ ජීවන දර්ශනයේ ඇති විවෘත භාවයත් නිරායාසයෙන්ම එන අවංකභාවයත් පළකළ බැව් එතුමා වැඩිදුරටත් පැවසීය. උත්සවය සංවිධානය කර තිබුණේ ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකික කිතුනු සංක්‍රමිකයන් බාර මොන්සිංඤෝර් නෙවිල් ජෝ. පෙරේරා පියතුමන් විසිනි.

**ගරු ඩෙනින්ටන් නික්ලස් පියතුමා**

## තලවිල සා. ආනා දේවස්ථානයේ චතාරික මංගල්‍යය නිමිත්තෙන් විශේෂ දුම්රිය සේවා

**තලවිල සා. ආනා දේවස්ථානයේ වාර්ෂික චතාරික මංගල්‍යය නිමිත්තෙන් බැතිමතුන්ගේ ගමන් පහසුව සඳහා 2015 මාර්තු මස 07 දින සහ මාර්තු 08 වෙනි දින දක්වා මොරටුව - පාලාවි- මොරටුව දක්වා විශේෂ දුම්රියක් ද, කොළඹ කොටුව දක්වා විශේෂ දුම්රියයන් 03 ක් ධාවනය කිරීමට කටයුතු යොදා ඇත.**

**දිනපතා ධාවනය වන දුම්රියයන් - කොළඹ කොටුව සිට පාලාවි දක්වා**

| | | | | |
|---|---|---|---|---|
| ★ දුම්රිය අංක 3404 | - කොළඹ කොටුව | පිටත්වීම | පෙ.ව. 04.00 | |
| | - පාලාවි | ළඟාවීම | පෙ.ව. 08.10 | |
| ★ දුම්රිය අංක 3411 | - කො. කොටුව | පිටත්වීම | පෙ.ව. 07.40 | } (සෙනසුරාදා, ඉරිදා හැර) |
| | - පාලාවි | ළඟාවීම | ප.ව. 12.05 | |
| ★ දුම්රිය අංක 3417 | - කො. කොටුව | පිටත්වීම | පෙ.ව. 11.55 | |
| | - පාලාවි | ළඟාවීම | ප.ව. 15.45 | |
| ★ දුම්රිය අංක 3425 | - කො. කොටුව | පිටත්වීම | ප.ව. 17.18 | |
| | - පාලාවි | ළඟාවීම | පෙ.ව. 21.05 | |

**දිනපතා ධාවනය වන දුම්රියයන් - පාලාවි සිට කොළඹ කොටුව දක්වා**

| | | | | |
|---|---|---|---|---|
| ★ දුම්රිය අංක 3808 | - පාලාවි | පිටත්වීම | පෙ.ව. 04.30 | |
| | - මරදාන | ළඟාවීම | පෙ.ව. 08.10 | |
| ★ දුම්රිය අංක 3817 | - පාලාවි | පිටත්වීම | පෙ.ව. 10.05 | |
| | - කො. කොටුව | ළඟාවීම | ප.ව. 14.25 | |
| ★ දුම්රිය අංක 3820 | - පාලාවි | පිටත්වීම | ප.ව. 13.20 | } (සෙනසුරාදා, ඉරිදා හැර) |
| | - කො. කොටුව | ළඟාවීම | ප.ව. 18.10 | |
| ★ දුම්රිය අංක 3828 | - පාලාවි | පිටත්වීම | ප.ව. 16.55 | |
| | - කො. කොටුව | ළඟාවීම | ප.ව. 21.10 | |

විශේෂ දුම්රියයන්

මොරටුව සිට පාලාවි දක්වා - 2015. 03. 07

| | | |
|---|---|---|
| මොරටුව | පිටත්වීම | - ප.ව. 14.10 |
| පාලාවි | ළඟාවීම | - ප.ව. 18.55 |

පාලාවි සිට මොරටුව දක්වා - 2015. 03. 08

| | | |
|---|---|---|
| පාලාවි | පිටත්වීම | - ප.ව. 16.45 |
| මොරටුව | ළඟාවීම | - ප.ව. 21.00 |

කො. කොටුව සිට පාලාවි දක්වා - 2015. 03. 07 - 09

| | | |
|---|---|---|
| කො. කොටුව | පිටත්වීම | - පෙ.ව. 09.30 |
| පාලාවි | ළඟාවීම | - ප.ව. 13.05 |
| කො. කොටුව | පිටත්වීම | - ප.ව. 13.10 |
| පාලාවි | ළඟාවීම | - ප.ව. 16.45 |

පාලාවි සිට කො. කොටුව දක්වා 2015. 03. 07 - 09

| | | |
|---|---|---|
| පාලාවි | පිටත්වීම | - ප.ව. 14.55 |
| කො. කොටුව | ළඟාවීම | - ප.ව. 18.22 |
| පාලාවි | පිටත්වීම | - ප.ව. 18.07 |
| කො. කොටුව | ළඟාවීම | - ප.ව. 21.30 |

කො. කොටුව සිට පාලාවි දක්වා 2015. 03. 07

| | | |
|---|---|---|
| කො. කොටුව | පිටත්වීම | - ප.ව. 15.40 |
| පාලාවි | ළඟාවීම | - ප.ව. 19.40 |

පාලාවි සිට හලාවත දක්වා - 2015. 03. 07

| | | |
|---|---|---|
| පාලාවි | පිටත්වීම | - ප.ව. 21.20 |
| හලාවත | ළඟාවීම | - ප.ව. 22.05 |

**"උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක, පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබන සේක" (ලූක් 1 : 31-32)**

# වසර 398 ක් පැරණි සත්කෝර්ළයෙන් හමු වූ දේවමාතා ප්‍රතිමාව



කුරුණෑගල රදගුරු පදවියේ පැල්ලන්දෙණිය ශු. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ ක්‍රි.ව. 1616 දී නිර්මාණය කරන ලද දේවමාතාවන්ගේ ප්‍රතිමාවක් ඇත. මෙම ප්‍රතිමාව ගැන මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි පියතුමාගේ මග පෙන්වීම මත කුරුණෑගල පදවි රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්ගේ අවසරය හා ආශිර්වාදය සහිතව කුරුණෑගල පදවි ලේඛකාධිකාරී අතිගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමාගෙන් විමසීමක් කරන ලදී.

මෙම "ස්වර්ගාරෝපිත දේවමාතාවන්ගේ" ප්‍රතිමාව 1611 ජනවාරි මස 13 වන දින දී කුරුණෑගල ගිරිඋල්ල මාර්ගයේ මැටියගනේ ග්‍රාමයේ මුලින්ම ඉදිකෙරුණු දේව මෑණියන්ට කැපකරන ලද දේවස්ථානයේ වැඩමවා සිටි ප්‍රතිමා වහන්සේ බවට සැකයක් නැත්තේ ප්‍රතිමාව පිටිපස එම දිනය කොටා ඇති නිසාය. වසර 398 ක් පැරණි මෙම ප්‍රතිමා වහන්සේ සත්කෝර්ලයට විශේෂ වන්නට තවත් හේතුවක් වන්නේ එය අප මුතුන් මිත්තන්ගේ දේව භක්තිය දිවි දෙවැනි කොට තිබූ බව මැනවින් විදහා පාන්නක් මෙන්ම මෙම ප්‍රතිමා වහන්සේ වැඩ සිටි වෙනත් ස්ථානයක් ගැන සඳහනක්ද නැති නිසාය. මෙම ප්‍රතිමා වහන්සේට "සත්කෝර්ළයේ දේව මෑණියන්" යන නම ආදේශ වී ඇත.

1611 ජනවාරි 13 වන දින මැටියගනේ මෙම දේවස්ථානය ස්වර්ගාරෝපිත දේව මෑණියන් වෙනුවෙන් කැපකර ආසිරි ගන්වන ලද්දේ කොළඹ පිහිටි "ජේසු" නිකායේ විද්‍යාලයේ අධිපති තුමන් විසිනි. ඒ සමග තවත් ජේසු නිකායේ පියතුමන් තුන් නමක් එහි වූහ. එදින 150 දෙනෙක් ප්‍රසාද ස්නාපනයෙන් කතෝලික ආගම වැලඳගත් බව සඳහන් වේ. ඒ වසරේම කැරලිකරුවන් විසින් ගරු මතේවුස් පොලිගොට්ටි, ගරු ජොහැන්ස් මිටෙල්ලා හා ගරු ඇන්ටෝනියො ෆෙඩ්රෝසා යන එම පියතුමන්ලා තිදෙනා සමග බොහෝ දෙනෙක් ඝාතනය කරන ලද බව සඳහන්ය.

මහනුවර කඳුපාමුල (දැන් වැඋඩ) දක්වා විහිදුනු මැටියගනේ මීසමට 4000 ක් පමණ බැතිමතුන් අයිති වූහ. කෝර්ළයේ කොචින් සිට ලියන ලද 1618 දෙසැම්බර් 15 වන දින සහිත ලිපියක මැටියගනෙන් ඇරඹුන කැරැල්ලෙන් පියතුමන්ලා තිදෙනෙක් ඝාතනයට ලක් වූ බව සඳහන්ව ඇත. එම දේවස්ථානය ගිනිතබා විනාශ කර ඇති බව සඳහන් වේ. වර්තමානයේ එම දේවස්ථානය තිබුණු තැනක්වත් කිසිවෙකු දන්නේ නැත. වත්මන් මැටියගනේ දේවස්ථානය පසුකාලීනව ඉදි වූවකි.

ස්වර්ගාරෝපිත මෙම දේව මාතාවන්ගේ ඓතිහාසික ප්‍රතිමාව පැල්ලන්දෙනිය ශු. අන්තෝනි දේවස්ථානයට කෙසේ ලැබුනේදැයි දන්නේ නැත. 2013 ඔක්තෝබර් 16 වන දින ජාතික ජපමාල රැළිය ඓතිහාසික ඇතුගල්පුර මාලිගාපිටියේදී අති උතුම් හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්ගේ මෙහෙයවීමෙන්ද අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද සිදු විය. එහිදී රැස්ව සිටි සියළු සැදැහැවතුන් ආසිරි ගැන්වීම සිදු කරනු ලැබුවේ මෙම "සත් කෝරළේ දේව මාතාවන්ගේ" ප්‍රතිමාවෙනි. ලන්දේසි පීඩන සමයේ මැටියගනේ ප්‍රාණ පරිත්‍යාගවරුන්ගේ ලෙයින් හා ශ්‍රී ලංකා ප්‍රථම සාන්තුවරයා ලෙස අබිසෙස් ලැබූ ජුසේවාස් මුනිඳුන්ගේ දහම් සේවාවෙන් රැකදුන් දේව විශ්වාසයේ සලකුණක් ලෙස මෙම ප්‍රතිමාව දැක්විය හැකිය. "සත් කෝරළයේ දේව මෑණියනි අප උදෙසා යදිනු මැනවි"

**(කේ.එස්. මැක්සි ප්‍රනාන්දු)**

# දේව දයාවේ හයවන අපෝස්තලික සමුළුව





දේව දයාව තුළ ජේසු සමිඳාණන්ගෙ දෙවන පැමිණීමට අපි කෙසේ සූදානම් විය යුතුදැයි මීගමුව කඩොල්කැලේ දේවස්ථානයේ පැවති දේව දයාවේ හයවන අපෝස්තලික සමුළුව අමතමින් අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් හිමිපාණෝ ප්‍රශ්න කළහ.

දවස පුරා පැවති මේ සමුළුව භාෂා ත්‍රිත්වයෙන්ම පැවති අතර භාෂා පරිවර්තක වශයෙන් ගරු නිකුලස් පියතුමා කටයුතු කළේය. හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමාගේ මෙහෙය වීමෙන් පැවති සමුළුවේ තේමා දෙසුම එතුමා කළ අතර "වර්බුම්" රූපවාහිනියේ නිර්මාතෘ මිලන්ද සිල්වා මහතාද දේශකයන් අතර විය. කොළඹ, බදුල්ල, ත්‍රිකුණාමලය සහ හලාවත යන පදවි වලින් විශාල පිරිසක් සහභාගි වූහ. **(ඇන්තනී හෙට්ටිආරච්චි)**

# සාන්ත දොන් බොස්කෝ 200 වැනි ජන්මෝත්සවයට වැඩ සටහන් ඇරැඹේ





සාන්ත ජෝන් බොස්කෝ මුනිතුමාගේ 200 වැනි ජන්මෝත්සව අනුස්මරණ උත්සවය මහත් හරසරින් මුලු ලොව පැතිර සිටින දොන් බොස්කෝ සැලේසියානු සංඝයන් සමරන්නට පටන්ගෙන ඇති අතර එහි ශ්‍රී ලංකාවේ සමාරම්භක උත්සවය එම සංඝයේ දුන්ගාල්පිටිය මූලස්ථානයේදී ඇරඹිණි.

විශේෂ දිව්‍ය පූජා යාගය දොන් බොස්කෝ සැලේසියානු නිකායේ ජාත්‍යන්තර අනුනායක ගරු ප්‍රැන්සිස් සිරේඩා, ශ්‍රී ලංකා ප්‍රාදේශියාධිපති අතිගරු නිහාල් ලියනගේ සහ ගරු ඩික්සන් ප්‍රනාන්දු පියතුමන් විසින් සිදු කරන ලදී.

මෙම උත්සවයට කොළඹ විශ්‍රාමික අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස්, අනුරාධපුර රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. අගරදගුරු පදවියේ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ ද සහභාගි වූහ.

ලොව පුරා රටවල් 163 ක දොන් බොස්කෝ සැලේසියාන පියවරු 16,684 ක් සේවය කරති. නිර්මාතෘ ජන්මෝත්සව අනුස්මරණ උත්සවය අගෝස්තු 16 වෙනිදා අනුරාධපුර නොච්චියාගම පැවැත්වේ.

**(ක්වින්ටස් පෙරේරා)**



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේව මාතා සිද්ධස්ථානයේ වාර්ෂික මංගල මෙහෙය පැවැත්වීම සඳහා හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ව කැඳවාගෙන පැමිණි අයුරු.

සිද්ධස්ථාන පාලක ගරු උපාලි චර්චිල් හා සහයක ගරු ජූඩ් චානක පියතුමන්ලා දෙපස වෙති. **(ශ්‍රියාංගනී පිලිෂියා)**

# ඇතුගල්පුර දයා සේවාවේ ළමා වැඩිහිටි උලෙළක්

කුරුණෑගල පදවියේ ශා. වින්සෙන්ති ද පාවුලා වාර්ෂික උත්සවය පසුගියදා කුලියාපිටිය සත්පහන ශාලාවේදී උත්සවාකාරයෙන් පවත්වන ලදී. ගරු පියවරුන් කීප නමකගේ සහභාගිත්වයෙන් පැවති මෙම උත්සවයට පදවි ළමා කොන්පරසවල දරු දැරියෝද සහභාගි වූහ.

උදෑසන යැදුම් මෙහෙයකින් හා පූජා නැටුමකින් ආරම්භ කළ මෙම උත්සවය කොන්පරසවල දරු දැරියන්ගේ අලංකාර නැටුම් සහ ආදර්ශමත් නාට්‍ය කීපයකින් සමන්විත විය. වැඩිහිටි කොන්පරසවල අය සඳහා තරග කීපයක් පැවැත්විනි. නව වසරට පදවි ළමා කොන්පරසයට නිලධාරීන් පත්කර ගන්නා ලදී. අනතුරුව ළමා සහ වැඩිහිටි අයට ත්‍යාග බෙදා දීමෙන් පසු දිවා ආහාරයෙන් උත්සවය නිමා විය.

මෙය පදවි මණ්ඩලයේ සභාපති පැට්‍රික් විතාන මහතා ඇතුළු නිලධාරි මණ්ඩලයේ සංවිධානයෙන් සහ පදවි අධ්‍යක්ෂ ගරු මිල්රෝයි ප්‍රැන්සිස් පියතුමාගේ නොමඳ සහයෝගයෙන් පවත්වන ලදී. **(හිල්ඩා කුමාරපේරු)**

# වයඹ ආණ්ඩුකාරවරිය රදගුරු හමුවට



වයඹ පළාතේ නව ආණ්ඩුකාර ආර්.එම්.අමරා පියසිලි රත්නායක මහත්මිය සිය ධුරයේ වැඩබාර ගැනීමෙන් අනතුරුව කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමිපාණන් බැහැදැක සුහද පිළිසඳරක යෙදිණි.

එහිදී ආගමික සහජීවනය අගය කළ එතුමිය කතෝලික සභාවෙන් සිදුකරන ශාසනික සේවාව ඉදිරියටත් කරගෙන යාමට සිය සහයෝගය ලබාදීමට ප්‍රතිඥා දෙන ලද අතර ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ප්‍රකටකළ එතුමාගේ අල්පේච්ඡ ජීවිතය ද ඇගයීමට ලක් කළාය. තම සේවාවන් නිසි පරිදි කර ගෙන යාම සඳහා කුරුණෑගල කතෝලික රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමිපාණන් වහන්සේගේ ආශිර්වාදය ඇය ලබා ගත්තාය.

එම අවස්ථාවට කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් කුරුණෑගල පදවි භාණ්ඩාගාරික අතිගරු බැසිල් රොහාන් ප්‍රනාන්දු කුරුණෑගල පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු ප්ලැසිඩස් ද සිල්වා ඇතුළු පියවරු මෙම අවස්ථාවට සහභාගි වූහ.

**(බී.කේ.ටී. රෙජිනෝල්ඩ් ඇන් ප්‍රසංගිකා රොඩ්රිගෝ)**

# දූව පිටිපනවීදිය දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය

දූව පිටිපනවීදිය මීසම් සංඝය මෙවර දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය පවත්වන ලදී. සත්ප්‍රසාද මංගල්‍ය තේමාව "කුමරි මරියාවන්ගේ හදවතින් දිව්‍ය සත්ප්‍රසාදීය ජේසු සමිඳුන්ට ආදරය කරමු" යනුයි. දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමාගේ පූර්ණ කැපවීම තුළ සති 2 ක කාලයක් නිහඬ යාච්ඤාවෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා ඒ අභියස මීසම් ජනතාව සූදානම් කළහ.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පෙරහර ඉතාමත් භක්තියෙන් හා ගෞරවයෙන් දූව සින්ද්‍රාති මාතා දේවස්ථානයේ සිට පිටිපන වීදිය කන්‍යාශුද්ධ මාතා දේවස්ථානය දක්වා ගමන් කර පිටිපනවීදිය දේවස්ථානය ඉදිරිපිට ඉදිකරන ලද විශේෂ මණ්ඩපයට රැගෙනවිත් එහි ස්ථාපිත කරන ලදී. සත්ප්‍රසාද පෙරහරේ මෙවර විශේෂත්වය වූයේ ගීතිකා අතරට ශු. ජපමාලයද උච්චාරණය කර ගමන් කිරීමයි. ඉන් අනතුරුව ආරාධිත පියතුමා විසින් තේමා දේශනය පවත්වා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ උතුම් වූ ආශිර්වාදය දානය කරන ලදී. **(බාර්බරා ප්‍රනාන්දු)**

